

2015 අගෝස්තු මස 17 වැනි දින පවත්වන ලද
ශ්‍රී ලංකාවේ පහළොස්වැනි
පාර්ලිමේන්තු මහා මැතිවරණය පිළිබඳ

මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව

2015 අගෝස්තු මස 17 වැනි දින පවත්වන ලද ශ්‍රී ලංකාවේ පහළොස්වැනි පාර්ලිමේන්තු මහා මැතිවරණය පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

CM 036178 - 25 (2021/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පෙරවදන

2015 අගෝස්තු 07 දින පැවැත්වූ 15 වන පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් වූ මැතිවරණ කොමසාරිස් වාර්තාව, එම මැතිවරණය අවසන් වී වර්ෂයක් ඉකුත්වීමට පෙර නිකුත් කිරීමට අපේක්ෂා කරනු ලැබූ නමුත් 2015 නොවැම්බර් 13 දින මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කිරීමෙන් අනතුරුව එහි සිවි අවුරුදු උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ තිබූ තාක්ෂණික දෝෂ නිවැරදි කරවීම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ප්‍රමාදය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සිදු වීම යන කරුණු හේතුවෙන් මෙම වාර්තාව සැකසීමට වර්ෂ තුනකට වඩා වැඩි කාලයක් ගතවීම පිළිබඳව බෙහෙවින් කනගාටු වෙමු.

මෙම වාර්තාව සැකසීමට සහාය වූ සියලු දෙනාටම මාගේ ස්තුතිය හිමි වේ.

2019.03.31 දින
රාජගිරිය මැතිවරණ කාර්යාලයේ දී ය.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස් (2011 -2015)

පටුන

පිටු අංක

පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට අදාළ නීති	01
පාර්ලිමේන්තුවේ නිල කාලය	01
නාමයෝජනා	02
පිළිගත් දේශපාලන පක්ෂ	03
ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු	05
ඡන්දහිමි නාමලේඛනය	06
ඡන්ද ප්‍රදේශ, ඡන්ද කොට්ඨාස සහ ඡන්ද මධ්‍යස්ථාන	06
වෙනත් ඡන්ද පොළකදී ඡන්දය දීමට අවසර ලබාදීම	07
තැපැල් ඡන්ද පහසුකම් සැලසීම	08
නිලඡන්ද දැන්වීම්පත්	10
ඡන්දදායකයා හඳුනා ගැනීම සඳහා ඡන්ද පොළේදී අනන්‍යතා ලේඛන භාවිතා කිරීම	11
මැකිය නොහැකි තීන්ත	11
මියගිය හෝ විදේශගත ඡන්ද හිමියන්	12
ශාරීරික දුබලතාවයන්ගෙන් පෙළෙන අය සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම	12
සේවා නියුක්තිකයන්ට ඡන්දය දීමට හැකි වන පරිදි ප්‍රමාණවත් නිවාඩු ලබා දීම	12
කාර්යය මණ්ඩල අවශ්‍යතා	13
ප්‍රවාහන අවශ්‍යතාව	14
ආරක්ෂක කටයුතු	15
තරහ කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වලට මැතිවරණය හා සම්බන්ධ ද්‍රව්‍ය නොමිලයේ තැපැලෙන් යැවීමට ඇති අයිතිවාසිකම්	16
දේශපාලන ගුවන් විදුලිය හා රූපවාහිනී ප්‍රචාර	17
පිළිගත් දේශපාලන පක්ෂවලට රජයේ ආධාර	17
මැතිවරණ නිරීක්ෂණ කටයුතු	18
දේශීය නිරීක්ෂණ ආයතන	18
විදේශීය නිරීක්ෂණ ආයතන	19
පැමිණිලි මධ්‍යස්ථාන පිහිටුවීම	19
නිවේදිත මැතිවරණ කාර්යාල පිහිටුවීම හා මැතිවරණ ප්‍රචාරක කටයුතු	20
රාජ්‍ය සම්පත් අවභාවිතය වැළැක්වීම	21
විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ	22
දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම	23
ඡන්ද විමසීම	24
ඡන්ද පත්‍රිකා ගණන් කිරීම	28
ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම	32
ඡන්ද විමසීම වෙනුවෙන් දරන ලද වියදම	35
නිරීක්ෂණ හා නිර්දේශ	37
මැතිවරණ කාර්ය මණ්ඩලය	37
නාමයෝජනා	37
තැපැල් ඡන්ද	38
දේශපාලන පක්ෂ හා අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා රජයේ දේපළ භාවිතා කිරීම	39
මාධ්‍ය උපමාන	40

හදිසි සහ අත්‍යාවශ්‍ය සේවාවල තැපැල් ඡන්ද පහසුකම අහිමි සේවකයන්ගේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම 41
මැතිවරණ ප්‍රචාරක කටයුතු 41
මැතිවරණ නීති බලාත්මක කිරීම 42
පාර්ලිමේන්තු මැතිවරණ හා සබැඳි අධිකරණ ක්‍රියාමාර්ග 43
සමාප්තිය 44

උපලේඛන

I. දාහතරවන පාර්ලිමේන්තුව විසුරුවා හරින බව ප්‍රකාශ කරන ලද ගැසට් පත්‍රය 49
II. එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා පත් කරන ලද තේරීම්භාර නිලධාරීන් පිළිබඳ තොරතුරු ඇතුලත් ගැසට් පත්‍රය 51
III. සේවා නියුක්තිකයන්ට ඡන්දය දීමට හැකිවන පරිදි ප්‍රමාණවත් නිවාඩු ලබා දීම 53
IV. ඡන්ද විමසීම් නිරීක්ෂණය සඳහා අවසරලත් නිරීක්ෂණ ආයතන නිරීක්ෂකයන් යුතු උපමාන 54
V. 'නිහඬ කාලසීමාව' තුළ නිවේදිත මැතිවරණ කාර්යාල ඉවත්කර ගැනීම හා ප්‍රචාරක කටයුතු කිරීමට අදාළව තරහ කරනු ලබන පක්ෂ/කණ්ඩායම් වල බලයලත් නියෝජිතයන් හා ස්වාධීන කණ්ඩායම් නායකයන් මෙන්ම ඔවුන් මඟින් අපේක්ෂකයන්ද දැනුම්වත් කිරීමට අදාළ ලිපිය 56
VI. විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය ආයතන විසින් පිළිපැදිය යුතු මාධ්‍ය උපමාන 58
VII. තරහ කරනු ලබන අපේක්ෂකයන් විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම පද්ධතිය 63
VIII. පෝස්ටර්, කටවුට්, බැනර් ප්‍රදර්ශනය හා අත්පත්‍රිකා බෙදාහැරීම, රථ පෙළපාලි, ශබ්ද විකාශන මඟින් කරන ප්‍රචාරක කටයුතු පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාගේ මාධ්‍ය නිවේදනය 70
IX. රාජ්‍ය දේපළ අවභාවිතය වැළැක්වීම සහ මැතිවරණය නිසිලෙස පැවැත්වීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ සහාය ලබාගැනීම වෙනුවෙන් නිකුත් කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය 71
X. එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් තෝරා පත්කර ගන්නා ලද තැනැත්තන්ගේ නම් 74
XI. අංක 1928/25 හා 2015.08.21 දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශය (ජාතික ලැයිස්තුව යටතේ තෝරා පත් ගන්නා ලද තැනැත්තන්) 83
XII. අංක 1929/4 හා 2015.08.24 දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශය (ජාතික ලැයිස්තුව යටතේ තෝරා පත් කර ගන්නා ලද තැනැත්තන්) 85

සංඛ්‍යා සටහන්

I. මැතිවරණ කොට්ඨාස සඳහා තෝරා පත්කර ගැනීමට නියමිත මන්ත්‍රීවරු සංඛ්‍යාව, නාමයෝජනා පත්‍රයක් මඟින් නාමයෝජනා කළ යුතු අපේක්ෂකයන් සංඛ්‍යාව සහ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණයට අදාළ විස්තර 89
II. භාරදෙන ලද, පිළිගත් සහ ප්‍රතික්ෂේපිත නාමයෝජනා අපේක්ෂක සංඛ්‍යාව පිළිබඳ විස්තර 90
III. ඡන්දභිමි නාමලේඛන විකිණීම (සංයුක්ත තැටි වශයෙන්) 91
IV. ලියාපදිංචි ඡන්දභිමියන් සංඛ්‍යාව අනුව ඡන්ද පොළ වර්ගීකරණය 94
V. පාර්ලිමේන්තු මැතිවරණය සඳහා යොදාගත් ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව සහ යොදාගත් ගොඩනැගිලි පිළිබඳ වර්ගීකරණය 95

VI. පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් ලැබුණු තැපැල් ඡන්ද ඉල්ලුම්පත් ප්‍රමාණය හා ඒවායින් පිළිගත්, ප්‍රතික්ෂේපිත සංඛ්‍යාව පිළිබඳ විස්තර 96
VII. පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත් සම්බන්ධ විස්තර 97
VIII. පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ඒ ඒ දිස්ත්‍රික්ක යටතේ ඡන්දභිමි නාමලේඛනයේ නම සඳහන්, එහෙත් ඡන්ද විමසීම් දිනට පෙර මියගොස් ඇති බවට සහ විදේශගත වූ බවට වාර්තා වූ ඡන්ද භිමියන් සංඛ්‍යාවට අදාළ තොරතුරු 98
IX. එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් ඡන්ද විමසීම සඳහා යොදා ගනු ලැබූ නිලධාරී සංඛ්‍යාවට අදාළ විස්තර 99
X. එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ගණන් කිරීමේ ශාලා ප්‍රමාණයට අදාළ විස්තර 100
XI. එක් එක් මැතිවරණ කොට්ඨාසය අනුව මුළු දිවයිනේ ප්‍රතිඵල 102
XII. පිළිගත් දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව සහ තෝරාපත්කර ගතයුතු මන්ත්‍රීධුර සංඛ්‍යාව 103
XIII. ජාතික පදනම මත තෝරාපත්කර ගතයුතු මන්ත්‍රීධුර සංඛ්‍යාව 105
XIV. පාර්ලිමේන්තු වර්තාවට අදාළ සම්පූර්ණ වියදම් වාර්තාව 106
XV. 2015.08.17 දිනට පැමිණිලි පිළිබඳ සාරාංශය 108
XVI. අවතැන් ඡන්ද භිමියන් ලියාපදිංචි කිරීමට අදාළ විස්තර 109

2015.08.17 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ

මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව

පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීමට අදාළ නීති

1978 සම්මත කරන ලද දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමට අදාළව, රටේ විධායක ජනාධිපතිවරයා වෙත සෘජුවම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නිවේදනය නිකුත් කිරීමට මෙන්ම ඡන්ද විමසීමට අදාළ නාමයෝජනා භාර ගැනීමේ හා මැතිවරණ පැවැත්වෙන දින වකවානු තීරණය කිරීමේ බලය ද රටේ විධායක ජනාධිපතිවරයා වෙත සෘජුවම පවරා ඇත. ජනාධිපතිවරණයේදී වුව ද නියමිත කාලවකවානුවට පෙර ජනාධිපතිවරණය පැවැත්වීමට ජනාධිපතිවරයා තීරණය කරන්නේ නම් ජනාධිපතිවරණය කලින් පවත්වන ලෙසට තම අභිලාෂය ප්‍රකාශ කිරීමට ජනරජයේ ජනාධිපතිවරයාට ව්‍යවස්ථාවෙන්ම අවස්ථාව සලසා දී ඇති අතර, එම ඡන්ද විමසීමේ නාමයෝජනා දින සහ ඡන්ද විමසීම් දින මැතිවරණ කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබේ.

2. 2010 අප්‍රේල් මස 08 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයට අනුව තෝරාපත්කර ගන්නා ලද දහ හතරවන පාර්ලිමේන්තුවේ ප්‍රථම සැසිවාරය 2010 අප්‍රේල් මස 22 වන දින ඇරඹිණි. පාර්ලිමේන්තුව 2015 ජුනි මස 26 දින විසුරුවා හරින ලද අතර, ඒ පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව හා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තිය යටතේ වූ නිවේදනය ජනාධිපතිවරයා විසින් 2015.06.26 දින අංක 1920/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එම නිවේදනය අනුව 2015 ජූලි මස 06 වන දින සිට 2015 ජූලි මස 13 වන දින දහවල් දොළහ දක්වා නාමයෝජනා කාලසීමාව වශයෙන්ද, 2015 අගෝස්තු මස 17 වන දිනය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණය පැවැත්වෙන දිනය වශයෙන්ද නියම කෙරිණි.

පාර්ලිමේන්තු නිල කාලය

3. 2015 වර්ෂය ආරම්භයේදීම එනම් 2015 ජනවාරි මස 08 වන දින ජනාධිපතිවරණය පැවැත්වීමෙන්, එම ඡන්ද විමසීම අවසන්ව මාස 06ක් වැනි කාලයක් තුළ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා සූදානම් වීමට මැතිවරණ දෙපාර්තමේන්තුවට සිදුවීම තුළ අදාළ කටයුතු සැලසුම් කිරීම යම් පහසුවක් බව පෙනී ගියද, ජනාධිපතිවරණයක අපේක්ෂක සංඛ්‍යාවට සාපේක්ෂව පාර්ලිමේන්තු මැතිවරණයකදී සැබෑ වශයෙන්ම තරග කරනු ලබන අපේක්ෂක සංඛ්‍යාව ඉහළ යාම හා ඡන්ද විමසීමට අදාළව අපේක්ෂකයන් මෙන්ම දේශපාලන පක්ෂ අතර පවතින තරගකාරිත්වය ගත්විට සංවිධාන කටයුතු වඩාත් සංකීර්ණ වීම නොවැළැක්විය හැකිවීම අදාළ පසුබිම සැලකිල්ලට ගෙන මැතිවරණ මහලේකම් කාර්යාලයේ මෙන්ම දිස්ත්‍රික් මට්ටමේ මූලික කටයුතු සැලසුම් කිරීම මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි සිදු කෙරිණි.

නාමයෝජනා

4. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 6(1) වගන්තියට අනුව තේරීම්භාර නිලධාරියා වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරයා මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරී වශයෙන් පත්කිරීම සහ නාමයෝජනා භාරගැනීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සිදු කිරීමටත් තීරණය කරන ලදී. මීට අදාළ විස්තර, අංක 1920/39 හා 2015 ජුනි මස 27 දින අතිවිශේෂ ගැසට් පත්‍රයකින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රසිද්ධ කරන ලදී. මෙහිදී පරිපාලන දිස්ත්‍රික්ක තුනකින් සමන්විත වූ වන්නි මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාද, පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත වන යාපනය මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරී වශයෙන් යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාද, දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරී වශයෙන් අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාද කටයුතු කරන ලදී. අදාළ ගැසට් පත්‍රයෙන්ම සියලුම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/

නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් සහකාර තේරීම්භාර නිලධාරීන් ලෙස පත්කිරීමටද අංක 1920/40 සහ 2015 ජුනි මස 27 දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් තේරීම්භාර නිලධාරිට සහාය පිණිස අතිරේක වශයෙන් තවත් සහකාර තේරීම්භාර නිලධාරීන් පිරිසක්ද පත්කිරීමට කටයුතු කරන ලදී.

5. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 16(1) වගන්තිය අනුව මැතිවරණය පැවැත්වීම වෙනුවෙන් අදාළ ප්‍රකාශය පළ කරන ලද 2015 ජුනි මස 26 දින සිට නාමයෝජනා භාරගැනීම අවසන්වීමේ දිනට පෙර දින එනම් 2015 ජුලි මස 12 වන දින දහවල් 12.00 වනතෙක් ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් ඇප තැන්පත් භාරගැනීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලදී සිදු කරන ලදී.

6. පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට අදාළ ප්‍රකාශය ජනාධිපති විසින් පළ කරන ලද දිනය වනවිට වලංගු ඡන්දහිමි නාමලේඛනය වී තිබුණේ 2014 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයයි. මෙම ඡන්දහිමි නාමලේඛනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ 2014.03.10 දින අංක 1853/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මඟින් එක් එක් මැතිවරණ කොට්ඨාසයෙන් තෝරා පත්කර ගැනීමට නියමිත වූ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව මෙම පාර්ලිමේන්තු මැතිවරණයේදී තෝරා ගැනීමට නියමිත වී තිබුණි. මැතිවරණ කොට්ඨාසය අනුව තෝරා ගැනීමට නියමිත වූ මන්ත්‍රී සංඛ්‍යාවට අදාළ විස්තර අංක I දරන සටහනෙහි දක්වා ඇත. එම සටහනෙහි 3 වන තීරුවේ එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 15(1) වගන්තිය අනුව එක් පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් නම් කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව සඳහන් කර ඇති අතර, අදාළ පනතේ 16(1) වගන්තිය අනුව එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් රුපියල් දෙදහස බැගින් වූ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු වූ ඇප මුදල් ප්‍රමාණයද දක්වා ඇත.

7. නාමයෝජනා භාරගැනීමට අදාළ ක්‍රියාමාර්ග පිළිබඳව සියලුම තේරීම්භාර නිලධාරීන් දැනුවත් කරමින් උපදෙස් මාලාවක් 2015.06.29 දින යවන ලදී. එමඟින් නාමයෝජනා භාරගැනීමේ වැඩපිළිවෙළ මෙන්ම නාමයෝජනා භාරගැනීම අවසානයේ මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා සම්බන්ධයෙන් ද තේරීම්භාර නිලධාරීන් දැනුවත් කෙරිණි. නාමයෝජනා පිළිබඳ තීරණ දැනුම්දෙන අවස්ථාවට පැමිණ සිටින දේශපාලන පක්ෂවල/ ස්වාධීන කණ්ඩායම්වල නියෝජිතයන් දැනුවත් කිරීම සඳහා වූ උපදෙස් සියලුම තේරීම්භාර නිලධාරීන් වෙත 2015.07.12 දිනැතිව යවන ලද අතර, එම තොරතුරු ඇතුළත් ලේඛනයක් සියලුම නියෝජිතයන් වෙත ලබා දෙන ලෙසටද මෙයින් උපදෙස් දෙනු ලැබීය.

8. පසුගිය ඡන්ද විමසීම්වලදී ලද අත්දැකීම් පදනම් කරගෙන භාරදෙනු ලබන නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප නොවන ආකාරයට භාර දිය යුත්තේ කෙසේද? යන්න නාමයෝජනා භාරදීමට පැමිණි බලයලත් පුද්ගලයන් දැනුම්වත් කිරීම සඳහා උපදෙස් පත්‍රිකාවක් නිකුත් කිරීමට තේරීම්භාර නිලධාරි වෙත උපදෙස් දෙන ලද අතර, ඊට අමතරව නාමයෝජනා භාරදීමට හෝ මූලික අවධානය යොමු විය යුතු කරුණු පැහැදිලි කර දීම සඳහා නාමයෝජනා ශාලාව තුළ වෙනමම සහකාර තේරීම්භාර නිලධාරියකුද රඳවා තැබීමට උපදෙස් දෙන ලදී.

9. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(අ) අනු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කළ යුතු ලැයිස්තුව හෙවත් ජාතික ලැයිස්තුව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් හෝ තරග කිරීමට අපේක්ෂිත සියලුම දේශපාලන පක්ෂ ලේකම්වරුන් දැනුම්වත් කරමින් 2015.07.03 දිනැතිව නාමයෝජනා කිරීමේ ආකෘතිපත්‍ර සහිතව ලිපියක් යොමු කරන ලදී. ඒ අනුව, නාමයෝජනා කාලසීමාව තුළ තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ 17 කින් අපේක්ෂකයන් 303ක් ඇතුළත් ලැයිස්තුවක් ඉදිරිපත් කර තිබුණි. ජාතික ලැයිස්තුව සඳහා ඉදිරිපත් කළ තැනැත්තන්ගේ නම් සහ පක්ෂයට අදාළ විස්තර අංක 1923/2 හා 2015.07.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලදී.

10. පාර්ලිමේන්තු මැතිවරණයට තරග කිරීම සඳහා සියලුම මැතිවරණ කොට්ඨාස වෙනුවෙන්

නාම යෝජනා කාලසීමාව තුළ පිළිගත් දේශපාලන පක්ෂ විසින් නාමයෝජනා පත්‍ර 312 ක්ද, ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් නාමයෝජනා පත්‍ර 225ක් ලෙස නාමයෝජනා පත්‍ර 537ක් ලැබුණු අතර, තේරීම්භාර නිලධාරි පරීක්ෂාවෙන් පසුව එම නාමයෝජනා පත්‍ර අතුරින් පිළිගත් දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරනු ලැබූ නාමයෝජනා පත්‍ර 12ක් සහ ස්වාධීන කණ්ඩායම් විසින් ඉදිරිපත් කරනු ලැබූ නාමයෝජනා පත්‍ර 24ක්ද ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව පිළිගත් මුළු නාමයෝජනා පත්‍ර ගණන 501ක් විය. එම ප්‍රමාණයෙන් 300ක් පිළිගත් දේශපාලන පක්ෂ හා 201ක් ස්වාධීන කණ්ඩායම් විසින් භාර දෙන ලද නාමයෝජනා පත්‍ර විය. මෙම මැතිවරණයේදී වැඩිම දේශපාලන පක්ෂ සංඛ්‍යාවක් වූ පක්ෂ 21ක් තරග කරන ලද්දේ කොළඹ මැතිවරණ කොට්ඨාසයට වූ අතර, තරග කරන ලද වැඩිම ස්වාධීන කණ්ඩායම් ප්‍රමාණයක් වූ 30ක් මඩකලපුව මැතිවරණ කොට්ඨාසයෙන් වාර්තා වුණි. සියලුම මැතිවරණ කොට්ඨාස වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍ර 300ක් යටතේ අපේක්ෂකයන් 3653ක්ද, තරග කරනු ලැබූ ස්වාධීන කණ්ඩායම් 201 යටතේ අපේක්ෂකයන් 2498ක්ද ලෙස පාර්ලිමේන්තු මැතිවරණය සඳහා මුළු අපේක්ෂකයන් 6151 දෙනෙකු තරග කරන ලදී. එම අපේක්ෂකයන් සංඛ්‍යාවෙන් 196 දෙනෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස තෝරා පත්කර ගැනීමට නියමිතව තිබුණි. නාමයෝජනා පත්‍ර භාරදීම, ප්‍රතික්ෂේප වූ නාමයෝජනා හා අපේක්ෂක සංඛ්‍යාවට අදාළ විස්තර අංක II සටහනෙහි දක්වා ඇත.

පිළිගත් දේශපාලන පක්ෂ

11. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ අංක 7(1) වන වගන්තිය අනුව පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශ කරන අවස්ථාව වනවිට පිළිගත් දේශපාලන පක්ෂ 64ක් විය.මැතිවරණයක් පවත්වන ලෙස නියම කෙරෙන ප්‍රකාශයක් හෝ නියමයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙන් පසු පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම් විසින් ඒ මැතිවරණය තරග කිරීමට ඒ පක්ෂය අදහස් කරන්නේ නම්, ඒ බව මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිඛිතව ඒ දිනයේ සිට දින 07ක් ඇතුළත දැන්විය යුතුය. කෙසේවෙතත් මේ සම්බන්ධයෙන් පිළිගත් දේශපාලන පක්ෂ දැනුම්වත් කිරීමේ අරමුණින්, 2015.07.02 දින මැතිවරණ මහලේකම් කාර්යාලයේදී පිළිගත් සියලුම දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගේ රැස්වීමක් කැඳවන ලද අතර, ඒ සඳහා සියලුම පක්ෂ ලේකම්වරුන් සහභාගි විය. ඒ අවස්ථාවට ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් මෙන්ම මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන්ද සහභාගි වූ අතර, නාමයෝජනා කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සියලුම පක්ෂ ලේකම්වරුන් දැනුම්වත් කරන ලද අතර, මැතිවරණය සඳහා තරග කිරීමේ කැමැත්ත ලිඛිතව දන්වන ලෙසටද උපදෙස් දෙන ලදී. ඒ අනුව මැතිවරණයට තරග කරනු ලබන බව දන්වමින් නියමිත දිනට පෙර, පක්ෂ 35ක් ලිපි ඉදිරිපත් කර තිබුණි.

12. පිළිගත් දේශපාලන පක්ෂයක අනුමත කරන ලද ලකුණ වෙනුවට වෙනත් අලුතින් අනුමත කරන ලද ලකුණක් සඳහා වූ ඉල්ලීමක්, මැතිවරණය පවත්වන ලෙස නියම කෙරෙන ප්‍රකාශනයක් හෝ නියමයක් ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට දින 07ක් ඇතුළත පක්ෂ ලේකම් විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ හැකි බවට වූ ප්‍රතිපාදන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 12(1) වගන්තියේ දැක්වේ. එවැනි ඉල්ලීමක් ලැබුණු විට කොමසාරිස්වරයා විසින් ඒ පක්ෂයේ අනුමත කරන ලද ලකුණ වෙනුවට, වෙනත් පිළිගත් දේශපාලන පක්ෂයක අනුමත කරන ලද ලකුණක් නොවන වෙනත් අනුමත කරන ලද ලකුණක් වෙන් කරමින් නියමයක් කළ යුතු විය. ඒ අනුව, මෙම පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව පක්ෂ 6කින් මෙතෙක් පැවති ඡන්ද ලකුණු වෙනුවට අලුත් ඡන්ද ලකුණු ඉල්ලා සිටින ලදී. ඒ සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ අනුමැතිය ලැබුණු අතර, අදාළ පක්ෂවල නම් මෙතෙක් පැවති ඡන්ද ලකුණු හා අලුතින් වෙන් කරන ලද ඡන්ද ලකුණට අදාළ විස්තර පහත දක්වා ඇත.

පක්ෂයේ නම	පැවති අනුමත ලකුණ	අලුතින් අනුමත කරන ලද ලකුණ
1.ජාතික හෙල උරුමය	හක්ගෙඩිය	දියමන්තිය
2.එක්සත් මහජන පක්ෂය	මාළුවා	ජංගම දුරකථනය
3.අකිල ඉලංකෙ ද්‍රවිඩ මහාසභා	දොඩම් ගෙඩිය	නැව
4. ශ්‍රී ලංකා ජාතික පෙරමුණ	ක්‍රිකට් පිත්ත	මල් පොහොට්ටුව
5. පෙරටුගාමී සමාජවාදී පක්ෂය	ලන්තෑරුම	කුළු ගෙඩිය
6.බොදුජන පෙරමුණ (එක්සත් ලංකා මහා සභා)	උල්පත් පැන	නාගයා

13. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 13.1 වගන්තියේ ප්‍රතිපාදනවලට අනුව, පිළිගත් දේශපාලන පක්ෂයකට ඇති ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් වලින් කවර කණ්ඩායම ඒ පක්ෂය විය යුතුදැයි විධාන කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට බලය ඇත. ඒ අනුව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ දුෂ්කරතා ඉවත් කිරීම පිණිස ඒ කණ්ඩායම් අතුරින් යම් කණ්ඩායමක් පිළිගත් දේශපාලන පක්ෂය වන බවට හෝ ඒ කණ්ඩායම අතුරින් කිසිම කණ්ඩායමක් ඒ පිළිගත් දේශපාලන පක්ෂය නොවන බවට තම පරම අභිමතය පරිදි ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරි වෙත විධානයක් නිකුත් කරනු ලැබිය යුතුය. අදාළ ප්‍රතිපාදන යටතේ ප්‍රතිවිරුද්ධ ඉල්ලීම් ඉදිරිපත් කරන ලද පිළිගත් දේශපාලන පක්ෂ දෙකක් විණි. එක්සත් ලංකා පොදුජන පක්ෂය හා ජාතික සංවර්ධන පෙරමුණ එම පක්ෂ දෙකයි. පාර්ලිමේන්තු මැතිවරණයේදී පැනනැගිය හැකිව තිබුණු දුෂ්කරතා නිසා ප්‍රතිවිරුද්ධ හිමිකම් පාන්නවුන්ගෙන් කවර හිමිකම් පාන්නකු පිළිවෙළින්, එක්සත් ලංකා පොදුජන පක්ෂය හා ජාතික සංවර්ධන පෙරමුණ ලෙස පිළිගනු ලැබිය යුතුද යන්න පරීක්ෂා කර බලා, නිගමනය කිරීම පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 13 වගන්තිය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ක්‍රියා කරන ලදී.

14. ඒ අනුව, එක්සත් ලංකා පොදුජන පක්ෂයේ පාර්ශ්ව දෙක සමඟ සාකච්ඡාවක් මැතිවරණ මහලේකම් කාර්යාලයේදී 2015.07.03 දින පවත්වන ලදී. එහිදී, පාර්ශ්ව දෙකම සභාපති සහ භාණ්ඩාගාරික ධුර සම්බන්ධයෙන් වූ එකඟතාව හා පාර්ලිමේන්තු මැතිවරණය තරග කිරීම අරමුණු කොටගෙන තාවකාලික ලේකම් ලෙස එම්.එම්.එස්. වීරවර්ධන මහතා පිළිගැනීමට පාර්ශ්ව දෙක විසින්ම එකඟවීම මැතිවරණ කොමසාරිස්වරයා අනුමත කරන ලදී. කෙසේවෙතත්, පාර්ශ්ව දෙක අතර, එකඟතාවයෙන් හෝ අධිකරණ ක්‍රියාමාර්ගයකින් විසඳා ගැනීමට අපොහොසත් වුවහොත් පාර්ශ්ව දෙකකින් සමන්විත පක්ෂයක් ලෙස සලකා ඉදිරියේදී ක්‍රියා කිරීමට සිදුවන බවද අදාළ පාර්ශ්වයන්ට දන්වන ලදී.

15. ජාතික සංවර්ධන පෙරමුණ පක්ෂය සම්බන්ධයෙන් පාර්ශ්වයන් දෙක අතර සාකච්ඡාවක් මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී 2015.07.06 දින පවත්වන ලදී. එහෙත් එම සාකච්ඡාවේ දී ජාතික සංවර්ධන පෙරමුණේ ලේකම් ධුරය සම්බන්ධයෙන් එකඟතාවකට පැමිණීමට පාර්ශ්ව දෙකම අපොහොසත් වූ බැවින්, ඉදිරි අධිකරණ හෝ සාකච්ඡාමය ක්‍රියාමාර්ගයක් තුළින් ගැටලුව විසඳාගන්නා තෙක් ජාතික සංවර්ධන පෙරමුණ නමැති පක්ෂය ලේකම්වරයකු නොමැති පක්ෂයක් ලෙසට තීරණය කරන ලදී. ඒ හේතුවෙන් එම පක්ෂයට පාර්ලිමේන්තු මැතිවරණයට තරග කිරීමට සුදුසුකම් නොමැති විය.

16 පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව පිළිගත් දේශපාලන පක්ෂවල භාවිතා කරන නාමය වෙනස් කිරීමට කරන ලද ඉල්ලීම් දෙකක් සම්බන්ධයෙන් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, "ශ්‍රී ලංකා ජාතික පෙරමුණ" මහලේකම් විසින් 2015.06.29 දින කරන ලද ඉල්ලීමට අනුව එම පක්ෂයේ නම "අපේ ශ්‍රී ලංකා නිදහස් පෙරමුණ" ලෙස වෙනස් කරමින්ද, "ජාතික හෙළ උරුමය" පක්ෂයේ ප්‍රධාන ලේකම්ගේ 2015.07.02 දිනැති ඉල්ලීමට අනුව එම පක්ෂයේ නම "එක්සත් යහපාලන ජාතික පෙරමුණ" වශයෙන්ද වෙනස් කරන ලදී.

17. 2015 අගෝස්තු මස 17 දින පැවැත්වීමට දින නියම වූ පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ දේශපාලන පක්ෂ දැනුම්වත් කිරීම සඳහා පක්ෂ ලේකම්වරුන් කැඳවා 2015.07.02 දින පවත්වන ලද සාකච්ඡාවේදී නාමයෝජනා භාරගැනීමේ වැඩපිළිවෙළ, බලයලත් නියෝජිතයන් පත් කිරීම,

ඡන්ද ස්ථාන නියෝජිතයන් පත් කිරීම හා ඊට අදාළ බලය පැවරීම, තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට හා තැපැල් ඡන්ද පත්‍රිකා සලකුණු කිරීමට අදාළ නියෝජිතයන් පත් කිරීම, මැතිවරණය හා සම්බන්ධ පත්‍රිකා නොමිලේ යැවීමට ඇති පහසුකම් දේශපාලන ප්‍රචාරක කටයුතු සඳහා ගුවන්විදුලි විකාශන පහසුකම් හා පිළිගත් දේශපාලන පක්ෂවලට ලැබෙන මුල්‍යමය ආධාර සම්බන්ධයෙන් දැනුම්වත් කරන ලදී.

18. ඊට අමතරව 2015.07.04 දිනැතිව සියලුම පක්ෂ ලේකම්වරුන් වෙත ලිපියක් යවමින් තරග කරනු ලබන සියලුම අපේක්ෂකයන් වත්කම්/ බැරකම් ප්‍රකාශ බාරදිය යුතු බවටද, 2015.07.06 දිනැතිව සියලුම පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙත ලිපියක් යවමින් නාමයෝජනා භාරගැනීමට අදාළ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් විස්තරාත්මක උපදෙස් ද දන්වනු ලැබූ අතර, විශේෂයෙන්ම දේශපාලන පක්ෂ ප්‍රචාරක කාර්යාල පවත්වාගෙන යාමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

19. තවද, තරග කරනු ලබන දේශපාලන පක්ෂ ලේකම්වරු දැනුම්වත් කිරීම සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයේදී නිත්‍ය නියෝජිත රැස්වීම් පවත්වන ලද අතර, එම රැස්වීම් සඳහා පක්ෂ ලේකම්වරුන් සහ ඔවුන්ගේ නියෝජිතයන්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් පිළිගන්නා ලද මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන් සහ පොලිස්පතිවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ද සහභාගි විය. මේ නිසා එම රැස්වීම්වලදී මැතිවරණ දෙපාර්තමේන්තුවට මැතිවරණ තරග කරනු ලබන පක්ෂවලට දැනුම්දිය යුතු කරුණු දැනුම්දීමට මෙන්ම දේශපාලන පක්ෂවලට අවශ්‍ය උපදෙස් මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ලබාගැනීමට ද හැකි විය. එම රැස්වීම් සඳහා පොලිස්පතිවරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගිවීම නිසා දේශපාලන පක්ෂවලට මැතිවරණ කටයුතු සංවිධානයේදී මුහුණදීමට සිදුව ඇති ගැටලු ඉදිරිපත් කිරීමට හා ඒ සඳහා උපදෙස් ලබාගැනීමටද අවස්ථාව සැලසුණි.

20. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 වන වගන්තිය අනුව මෙම මැතිවරණයේදී තරග කරනු ලබන යම් පිළිගත් දේශපාලන පක්ෂයක්, යම් මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් ඊට ප්‍රථම පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී තරගකොට අදාළ මැතිවරණ කොට්ඨාසයේ වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 1%කට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබාගත්තේ නම්, එබඳු පක්ෂවලට එසේ පූර්ව පාර්ලිමේන්තු මැතිවරණයේදී ලබාගත් එක් ඡන්දයකට ශත 50 බැගින් ආධාර වශයෙන් ලබාගැනීමට හැකියාව තිබේ. ඒ අනුව 2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී ලබාගත් ඡන්ද සංඛ්‍යා අනුව මෙම පාර්ලිමේන්තු මැතිවරණයේදී තරග කරනු ලැබූ දේශපාලන පක්ෂ තුනකට (03) එම දීමනා ලබාගැනීමට අවකාශ සැලසිණි. එසේ හිමිකම් ලැබූ පක්ෂ සඳහා අනුමත රජයේ දීමනාව 70 සහ 71 ඡේදයේ දැක්වේ.

ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු

21. 2015 ජනවාරි මස 08 දින ජනාධිපතිවරණය පවත්වා මාස කීපයක් තුළ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම තුළ මෙම මැතිවරණයට අදාළ මූලික කටයුතු සංවිධානයේදී යම් පහසුවක් විය. කෙසේවෙතත්, සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් මෙන්ම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් කොළඹට කැඳවා, අවශ්‍ය උපදෙස් කඩිනමින් ලබාදීමත්, මූලික කටයුතු සංවිධානයේදී සහායවන බාහිර ආයතන ප්‍රධානීන් සමඟ සාකච්ඡා කොට එම කටයුතු නිසි ලෙස ඉටු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් කඩිනමින් ලබාදීම තුළ මෙම කාර්යය තවදුරටත් පහසු කරගත හැකිවිය.

22. මැතිවරණ දෙපාර්තමේන්තුවට මෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට මූලික කටයුතු සංවිධානයේදී විශාල පිටිවහලක් වන තැපැල් දෙපාර්තමේන්තුව, ලංකා ගමනාගමන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය, විදුලි සංදේශ පහසුකම් ලබාදෙන ආයතන ද කැඳවා මැතිවරණ කොමසාරිස්වරයා විසින් උපදෙස් ලබාදීමට අමතරව, දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය ප්‍රධානීන් කැඳවා මූලික කටයුතු සංවිධානය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අවශ්‍ය උපදෙස් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත නිකුත් කරන ලදී.

23. ඡන්ද විමසීම් මූලික සංවිධාන කටයුතු ආරම්භයේ සිටම මැතිවරණ මහලේකම් කාර්යාලයටත්, රාජ්‍ය ආයතන සහ අප්‍රමාදව ලියවිලි හුවමාරු කරගැනීම හා නිදහස් තැපැල් පහසුකම් ලබාගැනීමට අදාළව තැපැල් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා පවත්වා "හදිසි මැතිවරණ ලියවිලි", "ප්‍රමුඛ සේවා" යටතේ තැපැල් ගාස්තුවකින් තොරව ලිපි යැවීමට තැපැල් දෙපාර්තමේන්තුව දැනුම්වත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඒ සඳහා ඉඩ සලසන ලදී. මහ මැතිවරණයට අදාළ තැපැල් ඡන්ද ඉල්ලුම්පත් තේරීම්හාර නිලධාරි වෙත යොමු කිරීම්, තැපැල් ඡන්ද රක්ෂණ පැකැට්ටු සහතික කිරීමේ නිලධාරීන් වෙත මෙන්ම තේරීම්හාර නිලධාරීන් වෙත යොමු කිරීම, නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදීම, පක්ෂ ලේකම්වරුන්ට මෙන්ම ස්වාධීන කණ්ඩායම් නායකයන්ට මැතිවරණ ප්‍රචාරක ලේඛන තැපැල් ගාස්තුවකින් තොරව යැවීමට පහසුකම් සැලසීම වැනි විශාල කාර්යභාරයක් ඉතා කෙටි කලක් තුළ ඉටු කිරීමට තැපැල් දෙපාර්තමේන්තුවට පැවරුණු අතර, තැපැල්පති ප්‍රමුඛ ඔහුගේ කාර්ය මණ්ඩලය විසින් එම කටයුතු සාර්ථකව ඉටු කිරීම මූලික කටයුතු සංවිධාන කටයුතු පහසු කිරීමට හේතුවිය.

24. ජනාධිපතිවරණ ඡන්ද විමසීමේදී මැතිවරණ කොට්ඨාස 22 සඳහාම එක් ආකාරයක වූ ඡන්ද පත්‍රිකාවක් මුද්‍රණය කිරීම පහසුවක් වුවද පාර්ලිමේන්තු මැතිවරණයේදී මැතිවරණ කොට්ඨාස 22 සඳහා එකිනෙකට වෙනස් වූ ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීමට රජයේ මුද්‍රණාලයට සිදු විය. ඊට අමතරව නිල ඡන්ද දැන්වීම්පත් සමඟ එක් එක් ගෘහයට භාරදීම සඳහා මැතිවරණ කොට්ඨාස මට්ටමින් තරග කරනු ලබන අපේක්ෂකයන්ගේ ලැයිස්තුද මුද්‍රණය කිරීම කරන ලදී. මේ සම්බන්ධයෙන් රජයේ මුද්‍රණාලයාධිපති සමඟ සාකච්ඡා වට කිහිපයක් පැවැත්වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම කාර්යයන් කලට වේලාවට අවසන් කරගැනීමට අවස්ථාව සැලසිණි.ඡන්ද විමසීම් කාල සීමාව තුළ මැතිවරණ මහලේකම් කාර්යාලයට සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍ය අමතර දුරකථන පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයත්, අඛණ්ඩ විදුලිය සැපයුම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයත්, අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සඳහා ලංකා ගමනාගමන මණ්ඩලය, පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගමය සහ දුම්රිය දෙපාර්තමේන්තුව ද සමඟ සාකච්ඡා කොට අවශ්‍ය වැඩපිළිවෙළ සලසන ලදී. ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු සාර්ථක කරගැනීම සඳහා ඉහත කී ආයතනවල සම්පූර්ණ සහාය මැතිවරණ දෙපාර්තමේන්තුවට ලබා දෙන ලද බව මෙහිලා සටහන් කළ යුතුය.

ඡන්දහිමි නාමලේඛනය

25. පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කරන ලද 2015.06.26 දිනය වනවිට 2015 ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධන කටයුතු ආරම්භක අවස්ථාවේ පැවතීම සහ ඒ අවස්ථාව වනවිට වලංගුව පැවති ඡන්දහිමි නාමලේඛනය 2014 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය වීම හේතුවෙන් 2015 අගෝස්තු මස 27 වන දින පවත්වනු ලැබූ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ද 2014 ඡන්දහිමි නාමලේඛනය භාවිතා කරන ලදී. 2014 වර්ෂය සඳහා වූ ඡන්දහිමි නාමලේඛනය 2015.01.08 වන දින පැවති ජනාධිපතිවරණය සඳහා ද යොදා ගත් ඡන්දහිමි නාමලේඛනය වීමත්, 2015 වර්ෂය තුළ ජනාධිපතිවරණය පැවැත්වීම නිසා ඉන්පසුව මහ මැතිවරණය පැවැත්වීමේ ඇති ඉඩ ප්‍රස්තාවද සැලකිල්ලට ගෙන ඡන්ද විමසීම් දෙකකට ප්‍රමාණවත් වන පරිදි 2014 ඡන්දහිමි නාමලේඛනයේ පිටපත් ලබාගෙන තිබීම මූලික කටයුතු වලදී පහසුවක් විය. 2014 ඡන්දහිමි නාමලේඛනයට අනුව ලියාපදිංචි මුළු ඡන්ද සංඛ්‍යාව 15044490 වූ අතර, පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් තරග කරන ලද පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල ඉල්ලීම් මත පසුගිය ජනාධිපතිවරණයේදී මෙන්ම ඡන්දහිමි නාමලේඛනය සංයුක්ත තැටි වශයෙන් ලබාදීමට කටයුතු කරන ලදී. සංයුක්ත තැටි ලබාදීම පහසු කාර්යයක් විය. තරග කරනු ලැබූ පක්ෂ / කණ්ඩායම් සඳහා අලෙවි කරන ලද ඡන්දහිමි නාමලේඛන සංයුක්ත තැටි සංඛ්‍යාවට අදාළ විස්තර අංක lll සටහනේ දක්වා ඇත.

ඡන්ද ප්‍රදේශ, ඡන්ද කොට්ඨාස සහ ඡන්ද මධ්‍යස්ථාන

26. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට අනුව තත්කාලයේදී බලපවත්නා එක් එක් ඡන්ද ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාසය,

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ තුන්වන වගන්තියට අදාළ කාර්යයන් සඳහා ඡන්ද ප්‍රදේශයක් හා ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලැබිය යුතුය. පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාව වනවිට වලංගුව පැවති 2014 ඡන්දහිමි නාමලේඛනයට අදාළ ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස පාර්ලිමේන්තු මැතිවරණයේ කාර්යය වෙනුවෙන් වලංගු වේ.

27. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (1) වගන්තියට අනුව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ඡන්ද විමසීම් පිළිබඳ දැන්වීමෙහි එක් එක් මැතිවරණ කොට්ඨාසයේ පිහිටි ඡන්ද කොට්ඨාසවලට අදාළ ඡන්දපොළ විස්තරද ඇතුළත් කළ යුතු වේ. ඡන්ද කොට්ඨාස පිහිටුවීමේදී ඡන්ද කොට්ඨාසයක ඡන්ද සංඛ්‍යාව 1500 නොඉක්මවන ලෙසට හා ඡන්ද දායකයන්ට සිදුවන අපහසුතා අවම වන ලෙස පිහිටුවිය යුතු බවට පනතේ සඳහන් වුවද ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගත්විට ඡන්ද කොට්ඨාස හා ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමේදී එම සංඛ්‍යා වෙනස්වන අවස්ථා ඇත.

28. ඡන්දපොළවල යෝග්‍යතාව සහ ඇති පහසුකම් පිළිබඳව ඡන්ද විමසීමක් පැවැත්වීමට ආසන්න කාලයේදී තේරීම්භාර නිලධාරි විසින් පරීක්ෂාවක් සිදු කිරීම සාමාන්‍යයෙන් සිදු කෙරේ. කෙසේවෙතත් මෙම පාර්ලිමේන්තු මැතිවරණයට මාස කිහිපයකට පෙර 2015 ජනවාරි මස ජනාධිපතිවරණය පැවැත්වීම සහ ඒ සඳහා යොදාගනු ලැබූ ඡන්ද මධ්‍යස්ථානම පාර්ලිමේන්තු මැතිවරණය සඳහාද යොදාගැනීමට හා ඡන්ද මධ්‍යස්ථානවල සුළු වෙනස්කම් පමණක් කොට පැවති ඡන්ද මධ්‍යස්ථානම යොදා ගැනීමට තේරීම්භාර නිලධාරීන්ට හැකි විය. ජනාධිපතිවරණ ඡන්ද විමසීමට යොදාගත් එහෙත් ඡන්ද විමසීමෙන් පසුව ඡන්ද දායකයන්ගෙන්, දේශපාලන පක්ෂ හා ස්වේච්ඡා සංවිධාන වලින් ලද එවැනි ඉල්ලීම් පදනම් කරගෙන ඡන්ද මධ්‍යස්ථාන සුළු සංඛ්‍යාවක් වෙනත් ස්ථානවල පැවැත්වීමට කටයුතු යොදන ලදී.

29. ඡන්දපොළවල් තෝරා ගැනීම හා ඡන්ද විමසීමට අදාළ වන පරිදි සකස් කර ගැනීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ මාණ්ඩලික නිලධාරි විසින්, ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහායෙන් සිදු කරනු ලබන අතර, ප්‍රායෝගික හේතූන් මත යම් ඡන්ද කොට්ඨාසයකට අයත්වන ඡන්ද සංඛ්‍යාව ඉතා විශාල අගයක් ගන්නාවිට ගැහැනු, පිරිමි වශයෙන් වෙනවෙනම පෝලිම් පවත්වාගෙන යාම හෝ ඡන්දදායක අනුපිළිවෙළ අංක අනුව ඡන්ද පෝලිම් සංඛ්‍යාව වැඩි කිරීම හෝ ගැහැනු පිරිමි යන ඡන්දදායකයන් වෙනුවෙන් වෙන් වූ ඡන්දපොළවල් පිහිටුවීම සිදු කෙරේ. එක් එක් ඡන්දපොළ වෙනුවෙන් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව අනුව ඡන්දපොළ සංඛ්‍යාව අංක IV සටහනෙන්ද, ඡන්දපොළවල් සඳහා යොදාගත් ගොඩනැගිලි අනුව අදාළ වර්ගීකරණය අංක Vසටහනෙන්ද දක්වා ඇත.

වෙනත් ඡන්දපොළකදී ඡන්දය දීමට අවසර ලබාදීම

30. පාර්ලිමේන්තු මැතිවරණ පනතට 1988 අංක 15 දරන සංශෝධන පනතින් සලසන ලද නීතිමය ප්‍රතිපාදන යටතේ, නියමිත ඡන්දපොළකදී ඡන්දය දීමට නොහැකි වීම පිළිබඳ සාධාරණ බියක් ඇතිවීම හේතුවෙන් එවැනි ඡන්ද දායකයෙකුට පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127(ආ) වගන්තිය යටතේ වෙනත් ඡන්දපොලකදී තම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගෙන් අවසර ඉල්ලා සිටිය හැකිය. එවැනි ඉල්ලීම් යම් ඡන්දදායකයෙකු විසින් නාමයෝජනා කාලසීමාව පිළිබඳ දැන්වීම ප්‍රසිද්ධ කිරීමෙන් පසුව සතියක් තුළ ඉදිරිපත් කළ යුතු විය. කෙසේවෙතත් එම කාලසීමාව නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනය වූ 2015.07.13 දින දක්වා මැතිවරණ කොමසාරිස්වරයා විසින් දීර්ඝ කරන ලදී.

31. පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම මෙම ඡන්ද විමසීමටද මෙම පහසුකම සලසන ලද්දේ උතුරු නැගෙනහිර පළාත්වල පිහිටි සිය ඡන්දපොළ වෙත යාමට සාධාරණ බියක් ඇති ඡන්දහිමියන් වෙත පමණි. උතුරු නැගෙනහිර පළාත්වල පැවති යුධ වාතාවරණය හේතුවෙන් අවතැන්ව පුත්තලම, අනුරාධපුර, වවුනියාව, ත්‍රිකුණාමලය, කුරුණෑගල යන දිස්ත්‍රික්කවල තාවකාලිකව නැවතී සිටින හෝ අවතැන් ඡන්ද දායකයන්ට මේ යටතේ අදාළ දිස්ත්‍රික්කවල පිහිටි මැතිවරණ කාර්යාල වෙත තම ඉල්ලීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන ලදී. මේ සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා තමන්

මුලින් පදිංචි වී සිටි දිස්ත්‍රික්කවලට අදාළ ඡන්දහිමි නාමලේඛන අවතැන් ඡන්දදායකයන් තාවකාලිකව පදිංචිව සිටි දිස්ත්‍රික්කවල ප්‍රදර්ශනයටද කටයුතු කරන ලදී. එහිදී 2014 වර්ෂයේදී අවතැන් පුද්ගලයන් සඳහා සකස් කරන ලද පරිපූරක ඡන්දහිමි නාමලේඛනයද සැලකිල්ලට ගන්නා ලදී. අදාළ විස්තර අංක XVI සටහනේ දක්වා ඇත.

තැපැල් ඡන්ද පහසුකම් සැලසීම

32. තැපෑලෙන් ඡන්දය දීමේ කාර්ය සංවිධානය කිරීම ඡන්ද විමසීමක ඉතා වැදගත් කාර්යයකි. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26(3) වගන්තියට අනුව මැතිවරණයක් පවත්වන ලෙස නියම කෙරෙන ප්‍රකාශනය හෝ ආඥාව නිකුත් කරනු ලැබූ දිනයට පසු හත්වන දිනයට කලින් ද දහහතරවන දිනයට පසුවද නොවන දිනයක ලැබෙන පරිදි තැපැල් ඡන්ද ඉල්ලුම්පත් තේරීම්භාර නිලධාරීන් වෙත ලැබෙන පරිදි ඉදිරිපත් කිරීමට නියමිතය. මේ අනුව තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම සඳහා පනතින් වෙන්කර ඇති කාලය සතියක කාලයකට සීමා වේ. කෙසේවෙතත් පාර්ලිමේන්තු මැතිවරණ පනතේම සඳහන් පරිදි අපේක්ෂකයෙකුටද තැපෑලෙන් ඡන්දය ඉල්ලුම් කිරීමට අවස්ථාව ලැබෙන බැවින් සහ අපේක්ෂකයකුද යන්න තීරණය වන්නේ නාමයෝජනා කාලසීමාවෙන් පසුව වන බැවින් ද පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම මෙම මැතිවරණයේදී ද තැපැල් ඡන්ද ඉල්ලුම්පත් භාර ගැනීම නාමයෝජනා අවසන් දින දක්වා එනම්, 2015.07.13 දින දක්වා සිදු කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා තීරණය කරන ලදී.

33. තැපෑලෙන් ඡන්දය දීම සඳහා හිමිකම් ලබන අයට ඒ සඳහා පහසුකම් සැලසීම තේරීම්භාර නිලධාරීන්ගේ වගකීමක් බැවින්, 2015.06.30 දිනැතිව සියලුම තේරීම්භාර නිලධාරීන් වෙත ලිපියක් යවමින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී. ඒ අතර, 2015.06.29 දිනැතිව ත්‍රිවිධ හමුදාපතිවරුන්, පොලිස්පති හා අධ්‍යක්ෂ ජනරාල් - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලිපි යවමින් තැපැල් ඡන්ද සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමට කටයුතු කරන ලදී. තවද, සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත 2015.07.01 දිනැතිව ලිපියක් යවමින් මැතිවරණ රාජකාරි සඳහා සුදුසුකම් ලබන සියලුම රජයේ සේවකයින්ට තැපෑලෙන් ඡන්දය ඉල්ලුම් කිරීමට අවස්ථාව සලසන ලෙස දැනුම්වත් කරන ලදී.

34. තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට තම අයදුම්පත් ඉක්මනින් සම්පූර්ණ කරගැනීම සඳහා පහසුකම් සලසමින් සියලුම තේරීම්භාර නිලධාරී කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙළුම් වශයෙන් නාමලේඛන ප්‍රදර්ශනය කිරීම මෙන්ම සංයුක්ත තැටි යොදා ගනිමින් තොරතුරු ලබාදීමේ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක කරන ලදී. විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ රාජ්‍ය අංශයේ විශාල පිරිසක් තැපැල් ඡන්ද අයදුම් කිරීමේදී ඇතිවිය හැකි තදබදයට පිළියමක් ලෙස තෝරාගත් ආයතන 19ක පමණ සංයුක්ත තැටි මඟින් අවශ්‍ය තොරතුරු ලබාදීමේ මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරන ලද අතර, ත්‍රිවිධ හමුදා මූලස්ථානයන්ට හා පොලිස් මූලස්ථානයට සමස්ත දිවයිනේම ඡන්දහිමි නාමලේඛනයේ සංයුක්ත තැටි ලබාදෙමින් කඩිනමින් තොරතුරු ලබාගැනීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අදාළ ඩිපෝ කාර්යාල වෙත, දිස්ත්‍රික්කයට අදාළ ඡන්දහිමි නාමලේඛන පිටපත් ලබාදෙමින් ගමනාගමන මණ්ඩල සේවකයින්ට තැපැල් ඡන්ද අයදුම් කිරීමේ පහසුකම් සලසන ලදී. ඊට අමතරව ශ්‍රී ලංකා තොරතුරු කේන්ද්‍රයේ 1919 අංකය හරහා ලැබුණු අයදුම්කරුවන්ගේ ඉල්ලීම්වලට තොරතුරු ලබාදීම මෙන්ම මැතිවරණ මහලේකම් කාර්යාලයේ මෙන්ම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පරිගණක අංශය මඟින්, ඉ - තැපැල්හෝ ෆැක්ස් පණිවිඩ මඟින් හෝ දුරකථන මඟින් කරන ලද විමසීම්වලට තොරතුරු ලබාදීමේ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක කරන ලදී. ඉහත කී සියලු මාර්ගවලින් තොරතුරු ලබාගත හැකි බව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් මෙන්ම, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් ද තැපැල් ඡන්ද අයදුම්කරුවන් දැනුම්වත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

35. පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයේදී ද තැපැල් ඡන්ද

ඉල්ලුම් කිරීමට පවත්නා නීතිමය ප්‍රතිපාදන යටතේ, අවසරයක් නොමැති රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන බොහොමයකින් ඒ සඳහා ඉල්ලීම් ඉදිරිපත් විය. ඒ අතරින්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්, සෞඛ්‍ය සේවාවල නිරත කාර්ය මණ්ඩල වෙනුවෙන් විශේෂයෙන්ම වෛද්‍යවරුන්, හෙද හෙදියන් සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩල වෙත අදාළ පහසුකම් සලසන ලෙසත්, එසේ ක්‍රියාත්මක නොවීම නිසා ඡන්ද විමසීම් දින සෞඛ්‍ය සේවාව නිසි ලෙස පවත්වාගෙන යාමට බාධා පැමිණෙන බවට ද ඉල්ලීම් ඉදිරිපත් විය. ඒ අතර, වරාය, ගුවන් තොටුපල, අධිවේගී මාර්ගවල සේවයේ නිරතවන්නන් සම්බන්ධයෙන්ද ඉල්ලීම් ඉදිරිපත් වූ අතර, සේවකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා බැහැරවීමට පනතේ ප්‍රතිපාදන මත නිවාඩු අනුමත කළ යුතු වුවත්, එසේ කළහොත් ආයතනය පවත්වාගෙන යාමේ කටයුතුවලට එල්ලවන බාධාවන් ද පෙන්වා දෙන ලදී. කෙසේවෙතත් මේ සම්බන්ධයෙන් ඉදිරි ඡන්ද විමසීම්වලදී හෝ ඡන්ද විමසීම් පනත්වලට සංශෝධන රැගෙන ඒමේ අවශ්‍යතාව පෙන්වා දෙමින් දේශපාලන පක්ෂ ලේකම්වරුන් දැනුම්වත් කරන ලද අතර, පනතට සංශෝධන ගෙන ඒමෙන් තොරව තැපැල් ඡන්ද පහසුකම් සැලසිය නොහැකි බවට අදාළ ආයතන වෙතද දන්වන ලදී.

36. නියමිත කාල සීමාව තුළ ලැබුණු තැපැල් ඡන්ද අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පිළිගත් තැපැල් ඡන්ද ඉල්ලුම්පත් ඇතුළත් කොට තැපැල් ඡන්ද නාමලේඛනය පිළියෙල කොට 2015.07.22 දින සහතික කරන ලදී. මැතිවරණ කොට්ඨාසය සඳහා තරග කරන සියලුම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වෙත තැපැල් ඡන්ද දායකයන්ගේ තොරතුරු ඇතුළත් සංයුක්ත තැටියක් නොමිලේ ලබාදෙන ලදී. මුදල් ගෙවා අතිරේක පිටපත් ලබාගැනීමට ද අවශ්‍ය පහසුකම් සලසන ලදී. තැපැල් ඡන්ද නිකුත් කිරීම 2015.07.24 දින සියලුම තේරීම්භාර නිලධාරී කාර්යාලවලදී සිදු කරන ලද අතර, එම අවස්ථාව නිරීක්ෂණය සඳහා තරග කරන දේශපාලන පක්ෂවලින් සහ ස්වාධීන කණ්ඩායම්වලින් තැපැල් ඡන්ද නිකුත් කිරීමේ එක් කාණ්ඩයකට එක් නියෝජිතයකු බැගින් සහභාගි කරවීමට අවස්ථාව ලබාදෙන ලදී. සහතික කිරීමේ නිලධාරීන් වෙත තැපැල් මගින් යැවීමට සකස් කරන ලද තැපැල් ඡන්ද රක්ෂණ පැකැට්ටු සියලුම තේරීම්භාර නිලධාරී කාර්යාලවල පිහිටුවන ලද තාවකාලික තැපැල් කාර්යාලවලදී භාරදීමේ වැඩපිළිවෙළ තැපැල්පතිවරයා සමඟ සාකච්ඡා කොට පිළියෙල කරන ලදී.

37. නිකුත් කරන ලද තැපැල් ඡන්ද පැකැට්ටු රක්ෂණ තැපෑලෙන් සහතික කිරීමේ නිලධාරීන් වෙත යවන ලද අතර, තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දිනය වනතෙක් ඒවා සුරක්ෂිතව තබාගතයුතු ආකාරය, අදාළ තොරතුරු සහතික කිරීමේ නිලධාරීන් වෙත සපයන ලද ජ'නලයේ සටහන් කරගත යුතු ආකාරය සහ තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දිනට තරඟ කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ බලයලත් නියෝජිතයන් හා ස්වාධීන කණ්ඩායම් නායකයන්ට නියෝජිතයකු එවීම මඟින් ඒ අවස්ථාව නිරීක්ෂණයට පැමිණිය හැකි බවට දන්වන ලෙසට වූ උපදෙස් සියලුම සහතික කිරීමේ නිලධාරීන් වෙත යවන ලදී. තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු නිරීක්ෂණයට පැමිණීමට සංවිධානයට හා මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට නියෝජිතයකු බැගින් පත් කිරීමට ද ඉඩ ලබාදෙන ලදී. තැපැල් ඡන්ද සලකුණු කිරීම සම්බන්ධයෙන් වූ උපදෙස් තැපැල් ඡන්ද අයදුම්කරුවන්ගේ දැනගැනීම සඳහා මාධ්‍ය නිවේදන මඟින් හා අදාළ කාර්යාල වෙත පොදුවේ ලිපි යවමින් දැනුම්වත් කරන ලද අතර, තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දින අදාළ ස්ථානවලට ආරක්ෂාව සලසන ලෙසට පොලිස්පති මඟින් සියලුම පොලිස් ස්ථාන දැනුම්වත් කරන ලදී. තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා 2015.08.03 දිනය කලාප අධ්‍යාපන කාර්යාල, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල හා ජාතික පාසල් සඳහා වෙන් කරනු ලැබුයේ, 2015 අගෝස්තු මස පැවති උසස්පෙළ විභාගයේ රාජකාරි සඳහා සේවයේ යොදවනු ලැබූ ගුරුවරුන්ට අපහසුවකින් තොරව ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සැළසීම සඳහා ය. පොදුවේ සෙසු සියලුම කාර්යාලවල තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දින වශයෙන් 2015.08.05 සහ 2015.08.06 දින වෙන් කරන ලදී. 2015.08.03, 05 සහ 06 දිනවල සහතික කිරීමේ නිලධාරී කාර්යාලවලදී තැපැල් ඡන්ද සලකුණු කිරීමෙන් පසු සලකුණු කරන ලද පැකැට්ටු එදිනම තැපැලට භාරදෙන ලෙස උපදෙස් දෙන ලද අතර,

2015.08.03 සහ 2015.08.06 දිනවලට නියමිත කාර්යාලවල තැපැල් ඡන්ද සලකුණු කිරීමෙන් පසු ඉතිරිවන පැකැට්ටු එදින එම කටයුතු නිරීක්ෂණය සඳහා තේරීම්භාර නිලධාරි විසින් යොදවන ලද සහකාර තේරීම්භාර නිලධාරි වෙත රැගෙන ගොස් භාරදීමට සහතික කිරීමේ නිලධාරීන් දැනුම්වත් කර තිබිණි. නියමිත දින තුනෙහි දී පාවිච්චි කොට ඉතිරි වූ තැපැල් ඡන්ද පැකැට්ටු තේරීම්භාර නිලධාරි භාරයට ගෙන අදාළ තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට තේරීම්භාර නිලධාරි කාර්යාලයට පැමිණ තැපැල් ඡන්දය සලකුණු කිරීම සඳහා තවත් දෙදිනක් වෙන් කර දෙන ලදී.

38. පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තැපැල් ඡන්ද අයදුම්පත් 627,728ක් ලැබුණු අතර, ඒවායින් අයදුම්පත් 59,368ක් විවිධ හේතූන් මත ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව ඉල්ලුම්පත් 567,780ක් පිළිගන්නා ලදී. එක් එක් මැතිවරණ කොට්ඨාස මට්ටමින් ලැබුණු තැපැල් ඡන්ද ඉල්ලුම්පත් ප්‍රමාණය, ඒවායින් ප්‍රතික්ෂේපිත හා පිළිගත් ප්‍රමාණයට අදාළ විස්තර අංක VI සටහනෙහි දක්වා ඇත.

39. පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම පාර්ලිමේන්තු ඡන්ද විමසීමේ කටයුතු අවසන් වූ වහාම, එක් එක් සහතික කිරීමේ නිලධාරි වෙත නිකුත් කළ තැපැල් ඡන්ද පැකැට්ටු ප්‍රමාණය, ඒවායින් සලකුණු කළ ප්‍රමාණය හා ඉතිරි ප්‍රමාණය නිවැරදිව තේරීම්භාර නිලධාරි වෙත භාර දී ඇතිද යන්න ගැන සුපරීක්ෂණයක් සිදු කොට දේශපාලන පක්ෂ විසින් බොහෝවිට සිදු කරනු ලබන සහතික කිරීමේ නිලධාරීන් පැකැට්ටු ඉතිරි කරගෙන ඒවා සාවද්‍ය ලෙස සලකුණු කර පසුව ඉදිරිපත් කරනවාය යන මතය වැරදි බව තහවුරු කරගැනීමට ද අවශ්‍ය වැඩපිළිවෙළ යොදන ලදී.

නිලඡන්ද දැන්වීම්පත්

40. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 27(1) වගන්තිය අනුව ඡන්දභිමි නාමලේඛනයේ නම සඳහන් එක් එක් ඡන්දභිමියා වෙත මැතිවරණ කොට්ඨාසයේ නම සහ අංකය, නාමලේඛනයේ දැක්වෙන පරිදි ඡන්ද භිමියාගේ නම, සුදුසුකම් ලැබීමේ ලිපිනය සහ ලියාපදිංචි අංකය, ඡන්ද ප්‍රදේශය, ඡන්ද කොට්ඨාසය, ඡන්ද භිමියා වෙත වෙන් කරනු ලබන ඡන්ද පොළ, ඡන්ද විමසීමේ දිනය හා වේලාව සඳහන් කරමින් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන ආකෘතියක තේරීම්භාර නිලධරයා විසින් යැවිය යුතුය. එහෙත් තැපැල් ඡන්ද දායකයන්ට හා පනතේ 127(ආ) වගන්තිය යටතේ වෙනත් ඡන්ද පොළකදී ඡන්දය දීමට අවසර ලබාගෙන ඇති ඡන්ද භිමියන්ට එවැනි නිල ඡන්ද දැන්වීම්පතක් නොයැවිය යුතු බවද පනතේ සඳහන් වේ. මෙම නිල ඡන්ද දැන්වීම්පත් ඡන්ද භිමියකුට ඡන්ද විමසීම් දිනට දින 07 කටවත් පෙර ලැබෙන සේ සාමාන්‍ය තැපැල් මාර්ගයෙන් යැවිය යුතුය.

41. ඡන්දභිමි නාමලේඛනය පරිගණකගත කිරීම නිසා එම යෙදවුම් මඟින් නිල ඡන්ද පත්‍රිකාද පරිගණක දත්ත භාවිතයෙන් මුද්‍රණය කිරීමේ පහසුකම සැලසී ඇත. එසේම සිංහල හෝ දෙමළ භාෂාවෙන් ඡන්ද දායකයාට අදාළ වන පරිදි මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවල ආදර්ශ තේරීම්භාර නිලධාරීන්ගෙන් ලබාගෙන, මැතිවරණ මහලේකම් කාර්යාලය මඟින් තෝරාගත් ආයතන මඟින් මුද්‍රණය කරවාගෙන ඡන්ද භිමියන් වෙත බෙදාහැරීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කිරීම සඳහා නැවත තේරීම්භාර නිලධාරීන් වෙත භාරදීම සිදු කෙරේ. තේරීම්භාර නිලධාරිගේ කාර්ය මණ්ඩලය විසින් එම නිල ඡන්ද දැන්වීම්පත් එකිනෙක පරීක්ෂා කරමින්, මියගිය හෝ විදේශගත වූ හෝ තැපැල් ඡන්ද දායකයන්ට හෝ අයත් නිල ඡන්ද දැන්වීම්පත් හඳුනා ගැනීම සඳහා ඊට අදාළ රබර් මුද්‍රා තැබීම සිදුකොට ඒවා ඡන්දභිමියන් වෙත බෙදාහැරීම සඳහා ප්‍රාදේශීය තැපැල් අධිකාරි වෙත භාරදීම සිදුකෙරේ. නිල ඡන්ද දැන්වීම්පත් තැපැලට භාරදීම 2015.07.29 දින සිදු කිරීමටත්, විශේෂ බෙදාහැරීම 2015.08.02 හා 2015.08.09 දින සිදු කිරීමටත්, බෙදා හැරීමේ කටයුතු 2015.08.10 දිනට අවසන් කිරීමටත් අවශ්‍ය උපදෙස් තැපැල් අධිකාරීන් වෙත දෙන ලදී. 2015.08.10 දිනෙන් පසුව බෙදාහැරීමට නොහැකිව තැපැල් කාර්යාලවල ඉතිරිවන නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා තම අනන්‍යතාව තහවුරු කිරීමෙන් පසුව තැපැල් කාර්යාලයෙන් ලබාගැනීමට ඡන්ද භිමියන්ට අවස්ථාව සලසන ලද අතර, එලෙස තැපැල් කාර්යාලයට පැමිණ නිල ඡන්ද දැන්වීම්පත් ලබාගත් අයගේ නාමලේඛන පරීක්ෂා කිරීමට දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් ඉල්ලා

සිටින්නේ නම් ඒ සඳහා අවස්ථාව සලසන ලෙස තැපැල්පතිවරයා විසින් ප්‍රාදේශීය තැපැල් අධිකාරීවරුන්හට උපදෙස් ලබා දී තිබුණි.

ඡන්දදායකයා හඳුනා ගැනීම සඳහා ඡන්ද පොළේදී අනන්‍යතා ලේඛන භාවිතා කිරීම

42. 2004 අංක 14 ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතට අනුව ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාවක් ඡන්ද හිමියකුට නිකුත් කිරීමට ප්‍රථම ජාතික හැඳුනුම්පතට අනුව ඡන්ද හිමියා හඳුනාගත යුතු වේ. එහෙත් ජාතික හැඳුනුම්පත් සියලුම ඡන්ද දායකයන් වෙත නිකුත් නොවී තිබීම සැලකිල්ලට ගෙන, සියලුම ඡන්ද දායකයන් වෙත ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම අවසන් වන තෙක්, ඡන්ද දායකයා හඳුනා ගැනීම සඳහා වෙනත් අනන්‍යතා ලේඛන ද සලකා බැලීමට අධිකරණ ක්‍රියාමාර්ගයකදී මැතිවරණ කොමසාරිස්වරයා එකඟ විය. ඒ අනුව, ජාතික හැඳුනුම්පතට අමතරව, වලංගු විදේශ ගමන් බලපත්‍රය, වලංගු රියැදුරු බලපත්‍රය, රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත, වැඩිහිටි හැඳුනුම්පත, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කෙරෙන පූජ්‍ය පූජක හැඳුනුම්පත ද පිළිගත් අතර, එවැනි අනන්‍යතා ලේඛන කිසිවත් නොමැති අයෙකුට ඡන්ද පොළේදී ඉදිරිපත් කිරීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කෙරෙන තාවකාලික හැඳුනුම්පතක් හෝ ලබාගත යුතු බවට නියම කෙරිණි. මේ සම්බන්ධයෙන් ඡන්ද හිමියන් දැනුම්වත් කිරීම සඳහා මාධ්‍ය නිවේදන නිකුත් කිරීම මෙන්ම මාධ්‍ය සාකච්ඡා හා දැන්වීම් පළ කිරීම මඟින් ද දැනුම්වත් කිරීම් සඳහා පියවර ගන්නා ලදී.

43. 2014 ඡන්දහිමි නාමලේඛනය පාර්ලිමේන්තු මැතිවරණය සඳහා වූ වලංගු ඡන්දහිමි නාමලේඛනය වීම නිසා 2015.01.08 දින පැවති ජනාධිපතිවරණයේදී ලබාගත් තාවකාලික හැඳුනුම්පත් මෙම ඡන්ද විමසීම සඳහා ද නැවත වලංගු කර භාවිතා කිරීමට අවස්ථාව සැලසුණි. කෙසේවෙතත් තවදුරටත් තාවකාලික හැඳුනුම්පතක් හෝ නොමැති ඡන්ද හිමියන් වෙත තාවකාලික හැඳුනුම්පත් ලබාගැනීමේ වැඩපිළිවෙළ මෙන්ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඒකාබද්ධව ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී. විශේෂයෙන්ම කිසිදු හැඳුනුම්පතක් නොමැති ඡන්ද හිමියන්ගෙන් වැඩි පිරිස වතු ආශ්‍රිත දෙමළ භාෂාව කථා කරන පිරිස් වීම සැලකිල්ලට ගෙන, තේරීම්භාර නිලධාරීන්, දිස්ත්‍රික් මැතිවරණ නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරීන් හා වතු අධිකාරිවරුන් ඒකාබද්ධව කිසිදු හැඳුනුම්පතක් නොමැති ඡන්ද හිමියන් වෙත තාවකාලික හැඳුනුම්පත් ලබාදීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන ලදී. මේ ආකාරයෙන් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත් ප්‍රමාණය 82,819 ක් වූ අතර, පසුගිය ඡන්ද විමසීම්වලට අදාළව යාවත් කාලීන කරන ලද හැඳුනුම්පත් ප්‍රමාණය 125,366 ක් විය. ඊට අදාළ විස්තර අංක VII සටහනෙහි දක්වා ඇත.

මැකිය නොහැකි තීන්ත

44. ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටින යම් ඡන්ද දායකයෙකු උචිත පරීක්ෂාවට ලක් කිරීම හා උචිත ලකුණින් සලකුණු කළ යුතු බව පනතේ 38 (1) (අ) හා (ආ) උප වගන්තිවල සඳහන් වේ. "උචිත ලකුණ" යන්න ඡන්ද දායකයකුගේ සුලැඟිල්ල නොමැකිය හැකි තීන්තෙන් ළකුණු කිරීම බව පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 38 (3) (ආ) වගන්තියේ දැක්වේ. එක් ඡන්ද දායකයකු එක්වරකට වැඩි වාර ගණනක් ඡන්දය දීමෙන් වළක්වාලීම මෙයින් බලාපොරොත්තු වන අතර, දැනට ඡන්ද පොළට ඡන්දය ප්‍රකාශ කිරීමට පැමිණෙන සියලුම ඡන්ද දායකයන් අනන්‍යතා ලේඛනයක් අනුව හඳුනා ගැනීම සිදු කෙරෙන බැවින්, මෙවැන්නක අවශ්‍යතාව තවදුරටත් පවත්වා ගැනීම අවශ්‍යද යන්න සාකච්ඡාවට බඳුන්විය යුතුව ඇත. කෙසේවෙතත් ඡන්ද දායකයා හඳුනා ගැනීම සඳහා දැනට ලංකාවේ භාවිතා කරන අනන්‍යතා ලේඛනවලටත් වඩා සාර්ථක ක්‍රම අනුගමනය කරන රටවල ද තවමත් නොමැකිය හැකි තීන්තෙන් ඡන්ද දායකයා සලකුණු කිරීම සිදු කෙරෙන බැවින්, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් යන්න හා බැඳි ජනතා විශ්වාසය ඇති කෙරෙන අවස්ථාවක් ලෙස සලකා මෙය බැහැර කිරීම සුදුසු නොවන බව හැඟීමයි.

45. කෙසේවෙතත් නොමැකිය හැකි තීන්ත භාවිතයේදී එක් ඡන්ද මධ්‍යස්ථානයක ඡන්ද දායකයන් 350ක් පමණ එක් තීන්ත පැනකින් සලකුණු කිරීමට බලාපොරොත්තුව ඇණවුම් කටයුතු සිදුකෙරෙන අතර, ඒ අනුව මේ සඳහා විශාල විදේශ විනිමයක් වැයකිරීමටද සිදුව ඇත. පසුගිය ඡන්ද විමසීම්වලදී භාවිතා කළ නොමැකිය හැකි තීන්ත නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම නිසා ඡන්ද දායකයන්ගෙන් මෙන්ම තරග කරන ලද අපේක්ෂකයන්ගෙන්ද දෝෂ දර්ශන එල්ල වූ අවස්ථා විය. එබැවින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමකදී ඡන්ද දායකයා මෙන්ම තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ කණ්ඩායම් ඡන්ද දායකයා නොමැකිය හැකි තීන්තෙන් සලකුණු කිරීම අවශ්‍යයැයි සිතනතාක් කල් මෙම ක්‍රමය ක්‍රියාවේ යෙදවීම ප්‍රඥාගෝචර වේ.

මියගිය හෝ විදේශගත ඡන්දභිමියන්

46. මියගිය හෝ විදේශගත ඡන්දභිමියන් වෙනුවෙන් වෙනත් පුද්ගලයන් ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කරන බවට දේශපාලන පක්ෂ තුළ හා ඡන්දදායකයන් තුළ පවතින මතය දුරු කිරීම සඳහා පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම ඡන්ද පොළ වෙත සපයනු ලබන ඡන්දභිමි නාමලේඛනයේ මියගොස් ඇති හා විදෙස්ගත ඡන්ද භිමියන්ගේ විස්තර සටහන් කර යැවීමේ වැඩපිළිවෙළ මෙම මැතිවරණයේදී ද ක්‍රියාත්මක කරන ලදී. වලංගු ඡන්දභිමි නාමලේඛනය වන 2014 වර්ෂයේ ඡන්දභිමි නාමලේඛනය සකස් කිරීමේදී සුදුසුකම් ලබන දිනය වූ 2014 ජූනි මස 01 දින දක්වා මිය ගිය අයට අදාළ සංශෝධන ඡන්දභිමි නාමලේඛනයට ඇතුළත් වුවද 2014 ජූනි මස 01 දිනෙන් පසුව ඡන්ද විමසීම පැවති 2015 අගෝස්තු මස 17 දින දක්වා වූ කාලය තුළ මියගිය අයගේ නම් ද ඡන්දභිමි නාමලේඛනයේ ඇතුළත්ව තිබීම සැලකිල්ලට ගෙන ඡන්ද විමසීම් දිනට පෙර එනම් 2015.07.15 දින දක්වා මිය ගිය හා විදේශගත ඡන්ද භිමියන්ගේ තොරතුරු 2015.07.23 දිනට පෙර ග්‍රාම නිලධාරීන් මඟින් රැස් කොට එම විස්තර අනුව ඡන්දභිමි නාමලේඛනයේ අදාළ ඡන්දදායකයන්ගේ නමට ඉදිරියෙන් මියගිය විටක "D" අක්ෂරයත් විදෙස්ගත විටක "A" අක්ෂරය යෙදීමත්, ඊට පරිභාහිරව ඡන්ද පොළ වෙත සපයනු ලබන ඡන්දභිමි නාමලේඛනයේ මෙන්ම අදාළ ඡන්ද භිමියන් වෙත යවනු ලබන නිල ඡන්ද දැන්වීම පත්‍රිකාවෙහිද "මියගිය බවට වාර්තා වී ඇත" හෝ "විදේශගතව ඇති බවට වාර්තා වී ඇත" යනුවෙන් මුද්‍රාවක් තබා භාරදීම ද සිදුකිරීමට තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. මෙවැනි ඡන්ද දායකයකු ඡන්ද පොළ වෙත පැමිණිය හොත් එබඳු අය ඡන්දපොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ පරීක්ෂාවට ලක්වීමත්, ඡන්ද පත්‍රිකාවක් ලබා දීමට තීරණය කළ හොත් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 43 වගන්තියට අනුව ප්‍රකාශයක් අත්සන් කර ගැනීමටද පියවර ගන්නා ලෙස ඡන්දපොළ භාර නිලධාරීන් වෙත උපදෙස් දෙන ලදී. එක් එක් මැතිවරණ කොට්ඨාස අනුව නියමිත දිනට විදේශගතව සිටි හා මියගිය සංඛ්‍යාවට අදාළ විස්තර අංක VIII සටහනෙහි දක්වා ඇත.

ශාරීරික දුබලතාවයන්ගෙන් පෙළෙන අය සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම

47. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 83 (4) (ඈ) වගන්තියට අනුව යම් ශාරීරික දුර්වලතාවක් නිසා ඡන්දය විමසන ස්ථානයට හා ඡන්දය විමසන ස්ථානයේ සිට පයින් හෝ පොදු ප්‍රවාහන ක්‍රමයකින් යාමට ඊමට නොහැකි තැනැත්තන් වෙත ඡන්ද විමසීම් දිනට දින 07කට පෙර මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරී වෙත වෛද්‍ය නිර්දේශයද සහිතව ඉල්ලීමක් ඉදිරිපත් කොට වාහනයක් භාවිතා කිරීම සඳහා අවසරය ලබා ගත හැකිය. මේ සම්බන්ධයෙන් සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත 2015.07.20 දිනැතිව ලිපියක් යවමින් උපදෙස් ලබාදුන් අතර, ඡන්ද දායකයන් දැනුම්වත් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් මාධ්‍ය නිවේදනයක් ද නිකුත් කරන ලදී. ඒ අතරම ඡන්ද මධ්‍යස්ථාන ලෙස ගොඩනැගිලි තෝරා ගැනීමේදී හැකි සෑම විටකදීම වයෝවෘද්ධ පුද්ගලයන්ට, ආබාධිතයන්ටද ඡන්ද පොළට ළඟා වීමේ පහසුව සැලසෙන පරිදි ඡන්ද මධ්‍යස්ථාන තෝරා ගන්නා ලෙස තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දී තිබුණි.

සේවා නියුක්තිකයන්ට ඡන්දය දීමට හැකි වන පරිදි ප්‍රමාණවත් නිවාඩු ලබා දීම.

48. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 122(1) වගන්තියට අනුව මැතිවරණයකදී පෞද්ගලිකව

ඡන්දය දීමට හිමිකම ඇති වෙනත් යම් තැනැත්තකුගේ සේවා යෝජකයකු වූ යම් තැනැත්තකු විසින් ඒ වෙනත් තැනැත්තා විසින් ලියවිල්ලකින් ඉල්ලීමක් කළ විට ඔහුට හෝ ඇයට ඡන්දය දීමට හැකිවනු පිණිස ප්‍රමාණවත්යැයි සැලකෙන පැය 04කට නොඅඩු අඛණ්ඩ කාලයක් වැටුප් අහිමි වීමකින් තොරව නිවාඩු ලබා දිය යුතුය. කෙසේ වෙතත් පසුගිය සෑම මැතිවරණයකදී මෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයේදී ද ඡන්දය දීමට තම ඡන්ද පොළ වෙත යාමට ප්‍රමාණවත් නිවාඩුවක් සිය හාම්පුතුන් විසින් ලබා නොදෙන බවට සේවකයන්ගෙන් පැමිණිලි ලැබුණි. මේ තත්ත්වය සැලකිල්ලට ගෙන පසුගිය ජනාධිපතිවරණයේදී අනුගමනය කළ පරිදිම මානව හිමිකම් කොමිෂම සමඟ ද සාකච්ඡා කොට ඡන්ද පොළට ඇති දුර ප්‍රමාණය සැලකිල්ලට ගෙන අනුමැතිය ලබා දිය හැකි නිවාඩු දින ගණන සඳහා නිර්නායකයන් ඉදිරිපත් කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවද දැනුම්වත් කර ඒ මඟින් සේවා යෝජකයන් දැනුම්වත් කිරීමටද පියවර ගනු ලැබීය. කම්කරු අමාත්‍යාංශය විසින්ද මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් හඳුන්වා දෙන ලද නිර්නායක පරිදි කටයුතු කළ යුතු බවට පුවත්පත් දැන්වීම් ද පළකරමින් සේවායෝජකයන් දැනුම්වත් කිරීමට පියවර ගෙන තිබුණි. අදාළ පුවත්පත් දැන්වීම තුන්වන උපලේඛනය ලෙස මෙම වාර්තාවට යා කොට ඇත.

කාර්යය මණ්ඩල අවශ්‍යතා

49. පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ ඡන්ද විමසීම, ඡන්ද ගණන් කිරීම හා මූලික සංවිධාන කටයුතු සඳහා අවශ්‍ය නිලධාරීන් සහ වාහන සංගණනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස සියලුම දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරීන් සහ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් මැතිවරණ මහලේකම් කාර්යාලයට කැඳවා 2015.06.29 දින උපදෙස් ලබා දෙන ලද අතර, ඊට අදාළ ලිඛිත උපදෙස් 2015.07.02 දිනෙන් යුතුව යවන ලදී. 2015 ජනාධිපතිවරණය පවත්වා කෙටි කාලසීමාවක් තුළ පාර්ලිමේන්තු මැතිවරණය සංවිධානය කිරීමට සිදුවීම නිසා ජනාධිපතිවරණයට යොදාගත් නිලධාරීන්ව එම සංගණන ලැයිස්තු ආශ්‍රයෙන් තෝරාගතයුතු බවට යෝජනා කෙරුණද 2015ට අදාළව වාර්ෂික ස්ථාන මාරුවීම් වන නිලධාරීන් ස්ථාන මාරුවී තිබීම හා වෙනත් හේතුමත ඉවත්වීම් සැලකිල්ලට ගෙන කාර්යය මණ්ඩල හා වාහන අවශ්‍යතා සඳහා සංගණනයක් පැවැත්වීමට උපදෙස් ලබා දෙන ලදී. ඒ සඳහා අවශ්‍ය ආකෘතිපත් දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරීන් වෙත නොපමාව යවන ලදී.

50. ජනාධිපතිවරණය මෙන්ම මෙම ඡන්ද විමසීම ද දීප ව්‍යාප්ත ඡන්ද විමසීමක් බැවින් විශාල කාර්යය මණ්ඩලයක් මෙන්ම වාහන ද සපයා ගැනීමට සිදුවීම සැලකිල්ලට ගෙන සියලුම දිස්ත්‍රික්කවල සියලුම දෙපාර්තමේන්තු හා ආයතන දැනුම්වත් කරමින් සුදුසුකම්ලත් සියලුම නිලධාරීන් මෙන්ම ආයතන සතු වාහන ද මැතිවරණ රාජකාරි සඳහා මුදාහැරීමට උපදෙස් දෙන ලෙස ත්‍රේරීම්භාර නිලධාරීන් දැනුම්වත් කරන ලදී. ඒ අතර, පසුගිය ඡන්ද විමසීම්වලදී මුහුණ දුන් තත්ත්වය සැලකිල්ලට ගෙන ජනාධිපති ලේකම් හරහා සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන අමතමින් මැතිවරණ කොමසාරිස්වරයා ඉල්ලා සිටින පරිදි සේවයේ නියුතු සුදුසුකම්ලත් සියලු නිලධාරීන්ගේ විස්තර මෙන්ම ආයතනය සතු සියලුම වාහන විස්තර සපයන ලෙස අදාළ ආයතන දැනුම්වත් කිරීමද කරන ලදී.

51. ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන දිස්ත්‍රික් නිලධාරී අවශ්‍යතාව ගණනය කර දිස්ත්‍රික් අවශ්‍යතාවයට සරිලන නිලධාරී ප්‍රමාණයක් නොමැතිවිට ආසන්න දිස්ත්‍රික්ක හෝ කොළඹ සංචිතයෙන් ලබා ගැනීමට කටයුතු කරන ලෙස හා අතිරික්තයක් සහිත නම් ඌනතා සහිත දිස්ත්‍රික් වෙත ලබා දීමට ද ත්‍රේරීම්භාර නිලධාරීන් දැනුම්වත් කරන ලදී. ඡන්ද පොළ නිලධාරී අවශ්‍යතාව ගණනයේදී ඡන්ද සංඛ්‍යාව 1,200 දක්වා තනි පෝලිමක් ලෙස නිලධාරීන් 8/9 පමණ යොදවන ලෙස ද ඡන්ද සංඛ්‍යාව 1,200ට වැඩිවන විට පෝලිම් දෙකක් ලෙස සලකා නිලධාරීන් 15/16 ක් පමණ යෙදවීමට ද සාමාන්‍ය ඡන්ද පත්‍රිකා ගණනය කිරීමේදී එක් ගණන් කිරීමේ ශාලාවකට ඡන්ද සංඛ්‍යාව 10,000-12,500 අනුයුක්ත කර නිලධාරීන් 40/50ක් පමණ අනුයුක්ත කිරීමට ද තැපැල් ඡන්ද ගණනය කිරීම සඳහා එක් ගණන් කිරීමේ ශාලාවකට ඡන්ද පත්‍රිකා අඩංගු පැකට්ටු 1,500-2,000 අතර ප්‍රමාණයක් ඇතුළත් කොට නිලධාරීන්

10/15 අතර ප්‍රමාණයක් යෙදවීමට ද උපදෙස් දෙන ලදී.

52. සියලුම රාජ්‍ය ආයතන වල නිලධාරීන්ගේ හා පාසල්වල ගුරුවරුන්ගේ විස්තර ලද පසුව චක්‍රලේඛ උපදෙස් මත අදාළ වැටුප් කාණ්ඩ යටතේ සහකාර තේරීම්භාර නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, කනිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් හා ලිපිකරුවන් ලෙස නිලධාරීන් වර්ගීකරණය කර එම නිලධාරීන් පුහුණු කිරීමේ වැඩපිළිවෙළ ද දිස්ත්‍රික් මට්ටමෙන් සිදු කිරීමට උපදෙස් දෙන ලදී. කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාලවල සහකාර තේරීම්භාර නිලධාරීන් පුහුණු කිරීම මැතිවරණ මහලේකම් කාර්යාලයේදී මැතිවරණ කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.

53. ඡන්ද විමසීම, ඡන්ද ගණන් කිරීම හා මූලික කටයුතු සංවිධානයට අදාළව සියලුම දිස්ත්‍රික්කවල අවශ්‍යතාව නිලධාරීන් 160,718 ක් වූ අතර, මෙයින් 155,100 ක් දිස්ත්‍රික්කය තුළින්ම සොයාගත හැකි විය. මහනුවර, කුරුණෑගල වැනි දිස්ත්‍රික්කවල මෙන්ම කොළඹ දිස්ත්‍රික්කයෙන්ද අතිරික්ත නිලධාරීන් පිරිසක් වාර්තා වූ අතර, නිලධාරීන් ප්‍රමාණවත් නොවූ දිස්ත්‍රික්ක වෙත එම නිලධාරීන් ඡන්ද විමසීම් රාජකාරි සඳහා යෙදවීමට කටයුතු කරන ලදී. දිස්ත්‍රික්ක බොහෝමයක ඡන්ද ගණන් කිරීමේ කටයුතු සහ කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරී රාජකාරි සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන් කොළඹ සංචිතයෙන් ලබා දීමට පියවර ගන්නා ලදී. ඡන්ද විමසීම් මෙන්ම ගණන් කිරීමටද දිස්ත්‍රික්කයේ නිලධාරීන් පමණක්ම යෙදවීම වෙනුවට හැකි සෑම විටකදීම දිස්ත්‍රික් දේශපාලන අධිකාරිය හෝ සෙසු නිලධාරීන් නොහඳුනන වෙනත් ආසන්න දිස්ත්‍රික්කයක නිලධාරීන් යෙදවීමටද හැකි සෑම විටකදීම පියවර ගතයුතු බවට තේරීම්භාර නිලධාරීන් දැනුම්වත්කරන ලදී. එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් ඡන්ද විමසීම් හා ඡන්ද ගණන් කිරීම් රාජකාරි සඳහා වූ නිලධාරී අවශ්‍යතාව අංක IX දරන සටහනෙන් දක්වා ඇත.

ප්‍රවාහන අවශ්‍යතා

54. ඡන්ද විමසීමක මූලික කටයුතු සංවිධානය හා ඡන්ද විමසීමේදී ඡන්ද පොළ වෙත ඡන්ද පෙට්ටි ඇතුළු බඩුබාහිරාදිය ප්‍රවාහනය කිරීම හා ඡන්ද විමසීම අවසන් වීමෙන් පසු ඒවා ආපසු දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාල වෙත ප්‍රවාහනය කිරීමත්, ඡන්ද විමසීමේ දින ඡන්ද හිමියන්ට ඡන්ද පොළ වෙත පහසුවෙන් යාමට හැකිවන පරිදි ප්‍රවාහන වැඩපිළිවෙළ සැකසීමත් ප්‍රවාහන වැඩපිළිවෙළ යටතේ තේරීම්භාර නිලධාරීගේ මූලික වගකීමක් වේ. සමස්ත දිවයිනේම ඡන්ද විමසීම් එක් දිනක නිශ්චිත වෙලාවක් තුළ සිදුකෙරෙන බැවින් විශාල වාහන ප්‍රමාණයක් සොයා ගැනීමට මැතිවරණ දෙපාර්තමේන්තුවට සිදුවේ. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමෙන් තම දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලුම රජයේ සහ අර්ධ රාජ්‍ය ආයතනවලට අනුයුක්ත මුදාහැරිය හැකි සියලුම වාහන ලබා ගැනීමත් ඊට අමතරව ලංකා ගමනාගමන මණ්ඩලය, පෞද්ගලික බස්රථ සංගමය හා කුලී පදනම මත තවත් වාහන ලබා ගැනීම අනිවාර්යයෙන්ම කළ යුතු වේ. මේ සඳහා මූලික පියවරක් ලෙස මැතිවරණ මහලේකම් කාර්යාලයේ මෙන්ම සියලුම තේරීම්භාර නිලධාරී කාර්යාලවලදී ලංකා ගමනාගමන මණ්ඩලයේ මෙන්ම හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල ඉහළ නිලධාරීන් කැඳවා සාකච්ඡා පැවැත්වීමටත් කුලී වැන් රථ ලබාගැනීම සඳහා වැන්රථ හිමියන් සමඟ සාකච්ඡා කිරීමත් විශේෂයෙන්ම කුලී වාහන සඳහා විශේෂිත ගාස්තු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමත් සිදු කෙරිණි.

55. ඡන්ද පොළවල් භාරව යන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට මෙන්ම ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක කටයුතු අධීක්ෂණයට යන කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ටද තම පෞද්ගලික රථ සැතපුම් කුලිය ලබා ගැනීමේ පදනම මත යොදාගැනීමට අවසර ලබා දුන් අතර, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට තම පෞද්ගලික මෝටර් රථය යොදා ගන්නේ නම් ඡන්ද පොළ බඩුබාහිරාදිය සහ නිලධාරීන් රැගෙන යා යුතු බැවින් ඒ සඳහා වැන් හෝ ජීප්රථ යොදා ගැනීමට පමණක් අවසර ලබා දුන් අතර, ඒ සඳහා රජයේ නිලධාරීන් සඳහා අනුමත ගාස්තු වෙනුවට විශේෂ ගාස්තු ක්‍රමයක්ද අනුගමනය කරන ලදී.

56. ඡන්ද විමසීම් කටයුතු සඳහා මූලිකව ක්‍රියා කරන පොලිස් හා තැපැල් දෙපාර්තමේන්තු සඳහා ද

ඡන්ද විමසීම් ආරම්භයේ සිට පැවරෙන රාජකාරී අනුව වාහන විශාල වශයෙන් අවශ්‍ය වේ. අවශ්‍ය වාහන තේරීම්භාර නිලධාරීගෙන් ලබා ගැනීමට ඔවුන් අපේක්ෂා කළද ඒ සඳහා වූ අතිරික්ත වාහන ප්‍රමාණයක් තේරීම්භාර නිලධාරීන් සතු නොවීම නිසා අනුමත කුලී පදනම මත අවශ්‍ය වාහන ලබා ගැනීමට මැතිවරණ කොමසාරිස් විසින් අනුමැතිය ලබා දෙන ලදී.2015 පාර්ලිමේන්තු මැතිවරණයේදී ද මන්නාරම දිස්ත්‍රික්කයෙන් අවතැන්ව පුත්තලම දිස්ත්‍රික්කයේ තාවකාලිකව පදිංචි ඡන්ද හිමියන්ට ප්‍රවාහන පහසුකම් සැලසීමට පුත්තලම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට සිදු විය. කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තාවකාලිකව පදිංචි එහෙත් මන්නාරම ඡන්ද ප්‍රදේශයේ ලියාපදිංචි ඡන්ද හිමියන්ගේ ඉල්ලීම මත මෙම ප්‍රවාහන පහසුකම් සැලසීම සිදු විය. ඒ සමඟ තරග කරනු ලබන දේශපාලන නායකයන් ද විශාල පිරිසක් මන්නාරම දිස්ත්‍රික්කය වෙත ඡන්ද විමසීම් දින ගමන් කිරීමට නියමිත බැවින් ඒ සඳහා ද ප්‍රවාහන පහසුකම් සලසන ලෙස ඉල්ලා ලැයිස්තු ඉදිරිපත් කර තිබුණි. එහෙත් පරීක්ෂාවේදී එවැනි පිරිස් පරිපූරක ලැයිස්තුගත ඡන්ද හිමියන් නොවන බවට සනාථ වූ බැවින් අවතැන් ඡන්ද හිමියන් සිටීනම් ඔවුන්ට ප්‍රවාහන පහසුකම් සලසන ලෙස හා තේරීම්භාර නිලධාරී විසින් ප්‍රවාහන පහසුකම් සපයන කණ්ඩායම සමඟ ඒ සඳහා ලබා දී ඇති ආරක්ෂාව යටතේ ගමන් කිරීමට එම කණ්ඩායම්වලටද හැකියාව ඇති බව දන්වන ලදී.

57. ඡන්ද විමසීමට අදාළ ප්‍රවාහන පහසුකම් සැලසීමේදී සමස්ත දිවයිනම ආවරණය කෙරෙන ඡන්ද විමසීමක් බැවින් විශාල ඉන්ධන තොග රැස්කර ගැනීමේ අවශ්‍යතාව ඇතිවිය. එම කරුණු සැලකිල්ලට ගෙන මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලංකා ඛනිජ තෙල් සංස්ථා නිලධාරීන් කැඳවා ඉන්ධන අවශ්‍යතාව ගැන කරුණු පැහැදිලි කළ අතර, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් දෙමින් ඛනිජ තෙල් නීතිගත සංස්ථා ප්‍රාදේශීය නිලධාරීන් හා ඉන්ධනහල් අයිතිකරුවන් කැඳවා ඉන්ධන තොග රැස්කර තබා ගැනීමේ අවශ්‍යතාවය පැහැදිලි කර දෙන මෙන් උපදෙස් ලබා දෙන ලදී.

58. ඡන්ද විමසීමක ප්‍රවාහන පහසුකම් සැලසීමේදී ඡන්ද හිමියන් වෙත ප්‍රවාහන පහසුකම් සැලසීම ද එකසේ වැදගත් වේ. මක්නිසාදයත් බොහෝ ඡන්දදායකයන් වෙත පෞද්ගලික වාහන තිබුණද ඡන්ද විමසීම් දින ඡන්ද පොළ වෙත පෞද්ගලික වාහනයෙන් ගමන් කළ නොහැකි වීමත් ඡන්ද විමසීම් අවශ්‍යතා මත ලංකා ගමනාගමන මණ්ඩලයේ සහ පෞද්ගලික බස් රථ සංගම්වලට අයත් බස්රථ මෙන් කුලී රථ ද තේරීම්භාර නිලධාරී විසින් ලබාගෙන තිබීමයි. ඒ නිසා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොකළහොත් ඡන්ද දායකයන්ට පොදු ප්‍රවාහන පහසුකම් නොමැති වීමෙන් ප්‍රවාහන ගැටලු පැනනගී. ඒ නිසා විශේෂයෙන්ම ලංකා ගමනා ගමන මණ්ඩලය හා පෞද්ගලික බස්රථ සංගමය සමඟ සාකච්ඡා කොට ඡන්ද විමසීම් දින මුදල් අයකොට ඡන්දදායකයාට ස්වකීය ඡන්ද පොළට යාමට අවශ්‍ය පහසුකම් නොපිරිහෙලා සැලසීමට පියවර ගන්නා ලදී.

ආරක්ෂක කටයුතු

59. ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත් කළ අවස්ථාවේ සිට ඡන්ද විමසීම අවසන්ව ප්‍රතිඵල ප්‍රකාශ කොට සතියක කාලයක් ගතවන තෙක්ම ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමේ වගකීම මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් මත පොලිස්පතිවරයා වෙත පැවරේ. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ද ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත් කළ පසුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඉල්ලා සිටිනු ලබන පොලිස් නිලධාරීන් ප්‍රමාණය ලබා දීම පොලිස්පතිවරයාගේ වගකීම වේ. මෙම පසුබිම තුළ මැතිවරණ කොමසාරිස්වරයා, තේරීම්භාර නිලධාරීන් මෙන්ම තරග කරනු ලබන දේශපාලන පක්ෂ නායකයන් හා අපේක්ෂකයන්ද මැතිවරණ නීතිය බලාත්මක කිරීමට අදාළ රාජකාරී පොලිසිය විසින් නිසිලෙස ඉටුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

60. ඡන්ද විමසීමට අදාළව නාමයෝජනා භාර ගැනීම, ඡන්ද විමසීම, ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට අදාළව එම කාර්යය ඉටු කරනු ලබන ස්ථාන වෙනුවෙන් අවශ්‍ය ආරක්ෂාව සැලසීමත් මැතිවරණ නීති බලාත්මක කිරීම යටතේ අනවසර පෝස්ටර්, කටවුට්, බැනර් ආදිය ඉවත් කිරීමට අදාළ කටයුතු සම්බන්ධයෙන් පොලිස්පතිවරයා ඇතුළු ඉහළ නිලධාරීන් හා දේශපාලන පක්ෂ ලේකම්වරුන් ද සමඟ සාකච්ඡා

පවත්වා අවශ්‍ය තීරණ ගනු ලැබේ. දිස්ත්‍රික් මට්ටමේදී, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමේ ඉහළ පොලිස් නිලධාරීන් හා බලයලත් නියෝජිතයන් සහ ස්වාධීන කණ්ඩායම් නායකයන්ද සමඟ සාකච්ඡා කොට දිස්ත්‍රික් මට්ටමේදී අවශ්‍යවන ආරක්ෂාව සම්බන්ධයෙන් අදාළ තීරණ ගනු ලැබේ. මෙවැනි සාකච්ඡාවලදී දේශපාලන පක්ෂ විසින් පසුගිය ඡන්ද විමසීම් අත්දැකීම් ද සමඟ ඡන්ද නීති බලාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයන් මැතිවරණ ව්‍යාපාරයේදී මුහුණ දෙන ගැටලු මුහුණට මුහුණලා සාකච්ඡා කර තීරණ ගැනීමට අවස්ථාව ලැබුණි.

61. ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමත් සමඟම මැතිවරණ මහලේකම් කාර්යාලයේ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ ප්‍රධානත්වයෙන් ඒකකයක් ස්ථාපිත කරනු ලැබූ අතර, දිස්ත්‍රික් මට්ටමේදී පොලිස් අධිකාරිවරයකු හෝ සහකාර පොලිස් අධිකාරිවරයකුගේ අධීක්ෂණය යටතේ වෙනමම ඒකකයක් පිහිටවුන ලදී. මීට අමතරව ජනාධිපතිවරණ ඡන්ද විමසීමකදී මෙන්ම දිස්ත්‍රික්කයේ විශාලත්වය හා විශේෂ ආරක්ෂාවක් ලබාදිය යුතුව ඇතැයි තීරණය කරන ලද ප්‍රදේශ කේන්ද්‍ර කොට ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හෝ වෙනත් රාජ්‍ය ආයතනවල විශේෂ පොලිස් ඒකක ද පිහිටුවීමට පියවර ගන්නා ලදී. එලෙස පිහිටුවන ලද පොලිස් ඒකක සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන් ද වෙනමම කාර්යය මණ්ඩලයක් ද අනුයුක්ත කරන ලද අතර, දේශපාලන පක්ෂවල නියෝජිතයන්ට මෙන්ම මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන්ට ද එයට සහභාගී වීමට අවස්ථාව සලසන ලදී.

62. ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කළ අවස්ථාවේ සිට මැතිවරණ මහලේකම් කාර්යාලයට හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවලට/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍ය ආරක්ෂාව සැලසීමත් විශේෂ පොලිස් ආරක්ෂාව අවශ්‍ය වන අපේක්ෂකයන් සඳහා ආරක්ෂාව සැලසීමත් පොදුවේ ඡන්ද විමසීම් අවස්ථාවේ සියලුම ඡන්ද පොළ සඳහා පොලිස් නිලධාරීන් දෙදෙනකු යෙදවීම හා ජංගම පොලිස් මුර සේවා සඳහා නිලධාරීන් යෙදවීම, ඡන්ද විමසීමෙන් පසු ආරක්ෂිතව ඡන්ද පෙට්ටි ගෙනැත් කිරීමේ මධ්‍යස්ථාන වෙත රැගෙන ඒම, ප්‍රතිඵල ප්‍රකාශය තෙක් අදාළ මධ්‍යස්ථාන වෙත ආරක්ෂාව සැලසීම මෙන්ම ප්‍රතිඵල ප්‍රකාශයෙන් පසුව සතියක කාලයක් යන තෙක් නීතිය හා සාමය ආරක්ෂා කිරීමට පියවර ගැනීම ආදී විශාල කාර්යභාරයක් පොලීසිය වෙත පැවරෙන අතර, එම කාර්යය සාර්ථකව ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවර පොලිස්පතිවරයා විසින් ගන්නා ලදී.

තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වලට මැතිවරණය හා සම්බන්ධ ද්‍රව්‍ය නොමිලයේ තැපෑලෙන් යැවීමට ඇති අයිතිවාසිකම

63. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 125 වන වගන්තිය අනුව යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්ට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනය හා ඒ මැතිවරණයේ ඡන්ද විමසීම් දිනයට පෙර දහවන දිනය යන මේ දෙදින අතර යම් වේලාවක අදාළ මැතිවරණ කොට්ඨාසයේ ඡන්දහිමි නාමලේඛනයේ නම් සඳහන් එක් එක් ඡන්දහිමියා වෙත එම මැතිවරණයට පමණක් සම්බන්ධ කරුණු ඇතුළත් එක් තැපැල් පණිවිඩයක් සාමාන්‍ය තැපෑලෙන්, තැපැල් ගාස්තු ගෙවීමකින් තොරව යැවීමට හිමිකම ඇත. මේ සම්බන්ධයෙන් 2015.07.21 දින තැපැල්පතිවරයා දැනුම්වත් කිරීමට ද පියවර ගන්නා ලදී. ඡන්ද හිමියා වෙත තැපැල් පණිවිඩය යැවීමේදී තැපෑලට භාරදීම හා තැපැල් පණිවිඩයේ දිග පළල, එයට මුද්‍රා තබන, එය පිළියෙල කරන හා ඒ පිළිබඳව ක්‍රියාකරන ආකාරය තැපැල්පතිවරයා විසින් තීරණය කරනු ලැබීමෙන් අනතුරුව එම උපදෙස් තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙත හා ස්වාධීන කණ්ඩායම් නායකයන් වෙත 2015.07.14 දින තැපැල්පතිවරයා විසින් දන්වන ලදී.

64. තැපැල් පණිවිඩ තැපැල් කාර්යාල වෙත භාරදීමට බලය ඇති අය මෙන්ම භාරදිය යුතු තැපැල් කාර්යාල පිළිබඳ විස්තර ද විශේෂයෙන්ම මෙම තැපැල් පණිවුඩ පරීක්ෂා කිරීම සඳහා විවෘතව තැබිය යුතු බවට උපදෙස් ද තැපැල්පතිවරයා විසින් නිකුත් කරන ලද ඉහත සඳහන් කළ චක්‍රලේඛය

මඟින් පෙන්වා දී ඇත. එම උපදෙස් තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල නායකයන් වෙත එක් එක් දිස්ත්‍රික්කය භාර තේරීම්භාර නිලධාරී මඟින් ලබාදීමට කටයුතු කෙරිණි.

65. නිදහස් තැපැල් පහසුකම යොදා ගනිමින් සිදු කරන ලද අක්‍රමිකතා දෙකක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මැතිවරණයේදී පැමිණිලි ලැබුණි. ගාල්ල දිස්ත්‍රික්කයේ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකු විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ වෙනත් පක්ෂයකින් තරග කරනු ලබන අපේක්ෂකයකුගේ මැතිවරණ ලියකියවිලි තැපැල් කිරීමට දරන ලද උත්සාහයක් සහ බදුල්ල දිස්ත්‍රික්කයේ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකු විසින් වෙනත් පක්ෂයක අපේක්ෂකයකුගේ මැතිවරණ ලියකියවිලි නිදහස් තැපැල් පහසුකම යටතේ යැවීමට දරන ලද උත්සාහයක් සම්බන්ධයෙන් තැපැල්පතිවරයා මඟින් අදාළ තැපැල් අධිකාරිවරුන් දැනුම්වත් කර එම තැපැල් පණිවිඩ බෙදාහැරීම නැවැත්වීමට වහාම පියවර ගන්නා ලදී.

දේශපාලන ගුවන්විදුලි හා රූපවාහිනී ප්‍රචාර

66. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 126 වගන්තියට අනුව නාමයෝජනා කාලසීමාවෙන් අවසන් දිනයේ සිට එක් සතියක් ඇතුළත කරනු ලබන ඉල්ලීමක් මත යම් මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් නාමයෝජනා පත්‍රයක් භාරදී ඇති සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම හෝ ස්වාධීන කණ්ඩායමකටම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හෝ සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමට නියමිත අවසන් දිනට පසුව එළඹෙන දිනයේ සිට ඡන්ද විමසීම පටන් ගැනීමට පැය හැත්තෑ දෙකකට කලින් අවසන් වන කාලය ඇතුළත ගුවන්විදුලි ප්‍රචාරයන් සඳහා හිමිකම ඇත.

67. ගුවන්විදුලි විකාශන සම්බන්ධයෙන් වනවිට එම පක්ෂය හෝ කණ්ඩායම එක් මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් පමණක් නාමයෝජනා පත්‍ර භාර දී ඇතිනම් විනාඩි 30ක කාලයක් ද මැතිවරණ කොට්ඨාස 14ක් දක්වා තරග කරන යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට අපේක්ෂකයන් එකසිය තිස්දෙදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් නාමයෝජනා කර ඇතිනම් විනාඩි හැටක මුළු කාලයක් ද මැතිවරණ කොට්ඨාස 14කට වැඩි සහ අපේක්ෂකයන් එකසිය තිස්දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවක් නාමයෝජනා කර ඇති යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට විනාඩි අනූවක මුළු කාලයක් ද ලබාගැනීමට හිමිකම තිබුණි. මෙම ගුවන් විකාශන පහසුකම ලබා ගැනීම හැර කිසිදු අපේක්ෂකයකු විසින් තමාගේ තෝරාපත්කර ගැනීම සඳහා අනුග්‍රහය දැක්වීමට ගුවන් විකාශන පහසුකම කෙලින්ම හෝ අන්අයුරකින් පාවිච්චි නොකළයුතු බව පනතේ 126 (6) වගන්තියෙහි දක්වා ඇත.

68. පාර්ලිමේන්තු පනතේ නියමිත කාලසීමාව තුළ දේශපාලන පක්ෂ දොළහකින් සහ ස්වාධීන කණ්ඩායම් දෙකකින් ගුවන්විදුලි ප්‍රචාර සඳහා ඉල්ලීම් ඉදිරිපත් වූ අතර ඒවා අවශ්‍ය කටයුතු සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා සභාපතිවරුන් වෙත යොමුකරන ලදී. ඊට අමතරව ගුවන් විදුලි ප්‍රචාර සඳහා පහසුකම් ලබන පක්ෂ හා කණ්ඩායම් මොනවාද යන්නත්, තරගකරන එක් එක් පක්ෂයට හා කණ්ඩායමට හිමි ගුවන් කාලය පිළිබඳවත් පනතේ අදාළ නීතිමය ප්‍රතිපාදනයන් හා අදාළ සභාපතිවරුන් වෙත දන්වා යවන ලදී.

69. දේශපාලන ගුවන්විදුලි ප්‍රචාරණ පහසුකම් නොමිලයේ ලබාදිය යුතු බවට පනතේ සඳහන් නොවන බැවින් ඒ සම්බන්ධයෙන් දරනු ලබන වියදම සම්බන්ධයෙන් ගැටලු මතු වුවද දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වලට ගුවන් ප්‍රචාරණ පහසුකම් සැලසිය යුතු බවට පනතේ සඳහන්වීමත් මීට පෙර පැවති පාර්ලිමේන්තු මැතිවරණ වෙනුවෙන් මෙම පහසුකම නොමිලයේ ලබාදී තිබීමත් සැලකිල්ලට ගෙන මෙම ඡන්ද විමසීමේදී ගුවන් ප්‍රචාරණ පහසුකම් නොමිලයේ ලබාදීමට කටයුතු කරන ලදී.

පිළිගත් දේශපාලන පක්ෂවලට රජයේ ආධාර

70. කලින් පවත්වන ලද මහ මැතිවරණයේදී තරගකොට, දෙන ලද වලංගු ඡන්ද මුළු සංඛ්‍යාවෙන් සියයට එකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවක් ලබා ඇතිනම් සහ ප්‍රදානය ගෙවිය යුතුව ඇති මහ මැතිවරණයේදී ඒ පිළිගත් දේශපාලන පක්ෂවලින්

ඒ මැතිවරණ කොට්ඨාස වෙනුවෙන් නාමයෝජනා පත්‍රයක් භාරදී ඇතිනම් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 වන වගන්තියට අනුව එම පිළිගත් දේශපාලන පක්ෂ රජයේ ආධාර ලබා ගැනීමට හිමිකම ලැබේ.

71. එම මුදල එම පක්ෂය විසින් ලබාගන්නා ලද එක් ඡන්දයකට ශත 50ක් බැගින් ගණන් බලන ලද මුදලකි. ඒ අනුව 2015 මහ මැතිවරණයට තරග කරන ලද එක්සත් ජනතා නිදහස් සන්ධානය, එක්සත් ජාතික පක්ෂය හා ඉලංකෙයි තමිල් අරසුකච්චි යන පක්ෂවලට රජයේ මුදල් ආධාර ලබා ගැනීමට හිමිකම ලැබුණි. එක් එක් පක්ෂය වෙනුවෙන් ගෙවනු ලැබූ රජයේ ආධාර මුදල සහ එම පක්ෂ වෙනුවෙන් රජයේ ආධාර ලෙස ගෙවනු ලැබූ මුළු මුදල පහත දැක්වේ:-

පක්ෂයේ නම	**තරග කරනු ලබන මැතිවරණ කොට්ඨාස සඳහා 2010 මැතිවරණයේදී ලබාගෙන ඇති ඡන්ද සංඛ්‍යාව**	**ගෙවූ මුදල**
එක්සත් ජනතා නිදහස් සන්ධානය	4,846,388	2,423,194.00
එක්සත් ජාතික පක්ෂය	2,357,057	1,178,528.50
ඉලංකෙයි තමිල් අරසුකච්චි	233,190	116,595.00
ගෙවන ලද මුළු මුදල		**3,718,317.00**

මැතිවරණ නිරීක්ෂණ කටයුතු

දේශීය නිරීක්ෂණ ආයතන

72. ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතු සඳහා කිසිදු ඡන්ද විමසීම් පනතකින් අවසර ලබා දී නැති නමුත් තරග කරනු ලබන දේශපාලන පක්ෂවල එකඟතාවය මත පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම මේ සම්බන්ධයෙන් පළපුරුද්ද හා අත්දැකීම් සහිත නිරීක්ෂණ ආයතන කිහිපයකට ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා අවසර ලබා දෙන ලද අතර එම නිරීක්ෂණ සංවිධානවල නම් පහත දැක්වේ.

- ❖ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL)
- ❖ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)
- ❖ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (CaFFE)
- ❖ නිදහස් සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (MFFE)
- ❖ ලක්බිමේ මවුවරු සහ දියණියෝ (MDL)
- ❖ මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය (NPOC)
- ❖ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TI-SL)
- ❖ ශ්‍රී ලංකා විද්‍යාර්ථීන්ගේ හා වෘත්තිකයන්ගේ සංගමය (SLAPA)

73. මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල කාර්යභාරය සම්බන්ධයෙන් සාකච්ඡාවක් මැතිවරණ මහලේකම් කාර්යාලයේදී 2015.07.09 දින පවත්වන ලද අතර, ඡන්ද විමසීම් නිරීක්ෂණය සඳහා ඉදිරිපත්ව සිටින සියලුම නිරීක්ෂණ සංවිධානවල ක්‍රියාකාරීත්වය හා සාමාජිකයන්ට අදාළ විස්තර වාර්තාවක් ද ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතුවලදී තෝරා ගත් සංවිධාන වෙත ඡන්ද පොළ තුළ රැදී සිටීමින් තම නිරීක්ෂණ කටයුතු කිරීමට ද අවසරය ලබා දෙන හෙයින් මෙම මහ මැතිවරණයේදී ඡන්ද විමසීම් නිරීක්ෂණය සඳහා අවසරලත් නිරීක්ෂණ ආයතන හා නිරීක්ෂකයන් විසින් පිළිපැදිය යුතු උපමාන ද හඳුන්වා දෙන ලද අතර අදාළ උපමාන උපලේඛන 02 මඟින් දක්වා ඇත.

74. ඡන්ද මධ්‍යස්ථාන තුළ ස්ථිතික නිරීක්ෂණ හා ජංගම නිරීක්ෂණ ද්විත්වයට යෙදවිය හැකි නිරීක්ෂණ ආයතන ලෙස නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL) හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) අවසර ලබා දෙන ලදී. ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍ර පිවිසුම් ස්ථාන දක්වා පමණක් ජංගම නිරීක්ෂකයන් යෙදවීමට නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (CaFFE), ලක්බිමේ මවුවරු සහ දියණියෝ (MDL) හා නිදහස් සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (MFFE) ට අවසර දෙන ලදී.ඉහත ආයතනවල විධායක අධ්‍යක්ෂ, සම කැඳවුම්කරු, ප්‍රධාන සම්බන්ධීකාරක යන නිලතල දරන්නන්ට දිවයිනේ ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයක් නිරීක්ෂණයට අවසර ලබා දුන්

අතර අදාළ සංවිධානවල දිස්ත්‍රික් නියෝජිතයාට තම දිස්ත්‍රික්කයේ ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයක් නිරීක්ෂණයට ද අවසර දෙන ලදී. එමෙන්ම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TI-SL) සංවිධානයේ විධායක අධ්‍යක්ෂකට, ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානයේ (NPOC) ජාතික සංවිධායකට, ශ්‍රී ලංකා විද්‍යාර්ථීන්ගේ හා වෘත්තිකයන්ගේ සංගමයේ (SLAPA) සභාපති හා නියෝජ්‍ය සභාපති යන අයට දිවයිනේ ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයක් නිරීක්ෂණයට අවස්ථාව සලසන ලදී.

75. පසුගිය ජනාධිපතිවරණයේදී මෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයේදී ද ඡන්ද ගණන් කිරීමේ ශාලා/ ශාලා පරිශ්‍ර/ ප්‍රතිඵල වගුගත කිරීමේ ශාලා නිරීක්ෂණයට දේශීය නිරීක්ෂණ ආයතනවලට ඉඩ දෙන ලදී. ඡන්ද ගණන් කිරීමේ ශාලා නිරීක්ෂණයේදී දිස්ත්‍රික්කයට අදාළ සියලුම නිරීක්ෂණ සංවිධාන නියෝජනය කරමින් එක් නිරීක්ෂණ සංවිධානයකට පමණක් ඒ ඒ ශාලා ප්‍රමාණය අනුව එක් ශාලා කණ්ඩයක් සඳහා එක් නියෝජිතයකු බැගින් පත්කිරීමට හැකි බව සියලුම තේරීම්භාර නිලධාරීන්ට මෙන්ම නිරීක්ෂණ සංවිධානවලට දන්වන ලදී. මෙලෙස පත්කරනු ලබන නියෝජිතයන්ගෙන් විස්තර ඡන්ද විමසීම් දිනට පෙර මැතිවරණ කොමසාරිස් හෝ තේරීම්භාර නිලධාරී වෙත ඉදිරිපත් කොට අවසරයක් ලබාගත යුතු බවට වූ උපදෙස් නිරීක්ෂණ සංවිධානවලට දන්වන ලදී. ඡන්ද විමසීමේ සහ ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණයට අවසර ලබා දී ඇති සියලුම නිරීක්ෂණ සංවිධානවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, නිලධාරීන් සහ සියලුම නිරීක්ෂයන් විසින් ඡන්ද විමසීම් රාජකාරිවල නිරතවීමට පෙර ප්‍රතිඥාවක් ලබා දිය යුතු බවට නියමයක් පනවන ලද අතර, එම ප්‍රතිඥා අදාළ නිරීක්ෂණ ආයතන විසින් තම භාරයට ගෙන ඉල්ලා සිටි අවස්ථාවක මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු විය.

විදේශීය නිරීක්ෂණ ආයතන

76. පාර්ලිමේන්තු මැතිවරණ කටයුතු නිරීක්ෂණය සඳහා නිරීක්ෂකයන් සහභාගි කරවන ලෙස දකුණු ආසියාතික මැතිවරණ කළමනාකරණ ආයතන සංසදයෙන් (FEMBoSA) ඉල්ලා සිටින ලදී. ඒ අනුව එම ආයතනය විසින් නිරීක්ෂකයන් තිස්පස් දෙනෙකු සහභාගි කරවීමට කටයුතු කරන ලද අතර, එම නිරීක්ෂණ කණ්ඩායම 2015.08.08 සහ 2015.08.09 යන දෙදින ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී. සියලුම නිරීක්ෂකයන් 2015.08.10 දින මැතිවරණ කොමසාරිස්වරයා හමුවූ අතර, ඡන්ද විමසීමට හා ගණන් කිරීමට අදාළ කරුණු මෙන්ම ඒ ඒ දිස්ත්‍රික්ක වෙත අනුයුක්ත කිරීමේ වැඩපිළිවෙළ එම සාකච්ඡාවේදී පැහැදිලි කරන ලදී. නිරීක්ෂකයන් ඒ ඒ දිස්ත්‍රික්කවලට අනුයුක්ත කළ පසු සම්බන්ධීකරණ නිලධාරීන් හා ආරක්ෂක කටයුතු පිළියෙල කිරීම මෙන්ම ඡන්ද විමසීම් හා ඡන්ද ගණන් කිරීම් නිරීක්ෂණය සඳහා වූ වැඩපිළිවෙළ තේරීම්භාර නිලධාරීන් විසින් සංවිධානය කළ යුතු බවට උපදෙස් තේරීම්භාර නිලධාරී වෙත දන්වන ලදී. ඊට අමතරව යුරෝපා සංගමයෙන් සහ පොදුරාජ්‍ය මණ්ඩලය මඟින් ද නිරීක්ෂණ කණ්ඩායමක් සහභාගි කරන ලද අතර, එම නිරීක්ෂකයන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම සහ තේරීම්භාර නිලධාරීන්ගේ සහය ඔවුන් සඳහා ලබාදීමට පමණක් මැතිවරණ දෙපාර්තමේන්තුව මැදිහත් විණි.

පැමිණිලි මධ්‍යස්ථාන පිහිටුවීම

77. විවිධ දේශපාලන පක්ෂ, අපේක්ෂකයන්, සිවිල් සංවිධාන හා මහජනතාව විසින් ඡන්ද විමසීම් අවස්ථාවකදී කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් ඡන්ද විමසීම් නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වන බව අදාළ පාර්ශ්ව වෙත ඒත්තු ගැන්වීමට නම් එම පැමිණිලි ක්ෂණිකව විභාග කිරීමේ හා තීරණ ගැනීමේ ක්‍රමවේදයක් තිබිය යුතුය. එසේ නොවන විට පැමිණිලි කිරීමෙන් පලක් නොවන බවට හා නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් තම යුතුකම් හා වගකීම් ඉටු නොකරන බවට මතයක් සමාජගත වේ. එම තත්ත්වය ඡන්ද විමසීම් නීති හැල්ලුවට ලක්කරමින් කටයුතු කරන පිරිස් දිරිගැන්වීමට ද හේතුවක් වී ඡන්ද විමසීමේ විශ්වාසනීයත්වය ගිලිහීයාමේ තත්ත්වයකට පත්වීම නොවැළැක්විය හැකිවනු ඇත. මේ තත්ත්වය අවබෝධ කර ගනිමින් පසුගිය ජනාධිපතිවරණයේදී මෙන්ම මෙම පාර්ලිමේන්තු මැතිවරණයේදී ද විධිමත් පරිදි පැමිණිලි මධ්‍යස්ථාන ඇති කරමින් මැතිවරණ නීති බලාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

78. මෙම පාර්ලිමේන්තු මැතිවරණයේදී ද මැතිවරණ කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ අතිරේක මැතිවරණ කොමසාරිස්වරයකු සහ විශ්‍රාමික සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් දෙදෙනකු යටතේ මැතිවරණ මහලේකම් කාර්යාලයේ ප්‍රධාන පැමිණිලි මධ්‍යස්ථානය ස්ථාපිත කළ අතර, ඒ සඳහා පොලිස්පති නියෝජනය කරමින් නියෝජ්‍ය පොලිස්පතිවරයකු හා පොලිස් අධිකාරීවරයකු යටතේ පොලිස් නිලධාරී කණ්ඩායමක්ද අනුයුක්ත කරන ලදී. නාමයෝජනා භාර ගැනීමේ අවසන් දිනෙන් ආරම්භ කරන ලද මෙම පැමිණිලි මධ්‍යස්ථානයේ කටයුතු නිරීක්ෂණයට තරග කරනු ලබන දේශපාලන පක්ෂ නියෝජිතයන්ට මෙන්ම නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන්ටද අවස්ථාව සලසන ලදී.

79. මෙයට සමගාමීව සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් පොලිස් අධිකාරී හෝ සහකාර පොලිස් අධිකාරී මට්ටමේ නිලධරයකු හා පොලිස් කණ්ඩායමක් යටතේ දිස්ත්‍රික් මට්ටමේ පැමිණිලි මධ්‍යස්ථානයක්ද පිහිටුවන ලදී. මෙම පැමිණිලි මධ්‍යස්ථානවල කටයුතු භාරව තේරීම්භාර නිලධාරී යටතේ සහකාර තේරීම්භාර නිලධාරියකු පූර්ණ කාලීනව සේවයේ යොදවන ලදී. පැමිණිලි මධ්‍යස්ථානයේ කටයුතු නිරීක්ෂණයට දිස්ත්‍රික්කයට තරග කරනු ලබන දේශපාලන පක්ෂවල නියෝජිතයන්ට මෙන්ම නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන්ටද සහභාගි වීමට අවස්ථාව සලසන ලදී.

80. ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ පැමිණිලි මධ්‍යස්ථානවලට අමතරව දිස්ත්‍රික්කවල විශාලත්වය හා ගමනාගමන දුෂ්කරතා මෙන්ම පසුගිය ඡන්ද විමසීම්වලදී විශේෂ ආරක්ෂාවක් ලබා දී තිබූ ප්‍රදේශ හඳුනාගෙන සහකාර තේරීම්භාර නිලධාරියකු හා පොලිස් පරීක්ෂකයකු යටතේ පොලිස් කණ්ඩාමක් ද සහිතව ප්‍රාදේශීය මට්ටමේ පැමිණිලි මධ්‍යස්ථාන ද පිහිටුවන ලදී. මෙම පැමිණිලි මධ්‍යස්ථානද නාමයෝජනා කාලසීමාව අවසන් වීමෙන් පසු ස්ථානගත කිරීමට තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් දුන් අතර, මීට අමතරව ඡන්ද විමසීම් දිනට පෙර දින හා ඡන්ද විමසීම් දින කටයුතු අධීක්ෂණයට සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් රජයේ පොදු ස්ථාන යොදා ගනිමින් සහකාර තේරීම්භාර නිලධාරීන් දෙදෙනකු හා පොලිස් නිලධරයන් තිදෙනෙකුගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාල ද ස්ථානගත කරන ලදී.

81. මෙලෙස පිහිටුවන ලද පැමිණිලි මධ්‍යස්ථානවලින් බලාපොරොත්තු වූයේ ඡන්ද විමසීම් නීති උල්ලංඝණය සම්බන්ධයෙන් ක්ෂණිකව පැමිණිලි ඉදිරිපත් කිරීම පහසු වනු වස් දේශපාලන පක්ෂ අපේක්ෂකයන්, සිවිල් සංවිධාන සහ විශේෂයෙන් මහජනතාවට අවස්ථාව සැලසීමයි. මේ තුළින් පැමිණිලි භාරගැනීමත් ඒවා සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ යාන්ත්‍රණයක් ඇති කර ඒවාට සාධාරණ අන්දමින් විසඳුම් ලබාදීමත් තුළින් ඡන්ද දායකයාට ඡන්ද විමසීම් දින ඡන්ද පොළට ගොස් නිදහස්ව හා සාධාරණව තම ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි යහපත් වාතාවරණයක් ඇති කිරීම මුඛ්‍ය පරමාර්ථය විය. මෙම පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ පැමිණිලි සාරාංශය සටහන XV හි ඇතුළත්ව ඇත.

නිවේදිත මැතිවරණ කාර්යාල පිහිටුවීම හා මැතිවරණ ප්‍රචාරණ කටයුතු

82. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වන වගන්තියට අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට මැතිවරණ කොට්ඨාස මට්ටමින්, ඡන්ද ප්‍රදේශ මට්ටමින් සහ ඡන්ද කොට්ඨාස මට්ටමින් තම පක්ෂ කාර්යාල නැතහොත් නිවේදිත මැතිවරණ කාර්යාල පිහිටුවා ගැනීමට හිමිකම ඇත. පනතේ විධිවිධාන අනුව එලෙස පිහිටුවන ඡන්ද විමසීම් කාර්යාල සම්බන්ධයෙන් දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී මෙන්ම අදාළ බලප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයා ද දැනුම්වත් කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් නාමයෝජනා භාර ගැනීමට අදාළව පැවති සාකච්ඡා වලදී ද පක්ෂ ලේකම්වරුන් දැනුම්වත් කරන ලද අතර, නිවේදිත මැතිවරණ කාර්යාල හා ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් 2015.07.06 දිනැතිව සියලුම පක්ෂ ලේකම්වරුන් වෙත ලිඛිතව ද දන්වන ලදී. ඒ අනුව පිහිටුවනු ලබන කාර්යාල වර්ගය අනුව නියමිත පාටින් යුතු

ආකෘති භාවිතා කොට පිටපත් තුනකින් සම්පූර්ණ කිරීමත්, ඒ සඳහා ග්‍රාම නිලධාරි නිර්දේශය ලබා ගැනීමටත් ඉන්පසුව දිස්ත්‍රික් ත්‍රේරීම්හාර නිලධාරී වෙත ඉදිරිපත් කොට ත්‍රේරීම්හාර නිලධාරී අනුමැතිය සහිතව පිටපත් දෙකක් ආපසු භාරදුන් පසු ඒවා ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති වෙත භාරදී පොලිස් ස්ථානාධිපති අනුමැතිය සහිතව ආපසු භාරදෙනු ලබන පිටපත පක්ෂ කාර්යාලය තුළ තබාගත යුතු බවට හා හැකි සෑම විටම අනුමැතිය ලද ලිපියෙහි ඡායා පිටපතක් පක්ෂ කාර්යාලය තුළ ප්‍රදර්ශනය කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ද තරග කරනු ලබන පක්ෂ සහ කණ්ඩායම් නායකයන් දැනුම්වත් කරන ලදී.

83. නිවේදිත මැතිවරණ කාර්යාල පිහිටුවීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙළ කාර්යාල විවෘත කර තැබිය හැකි වේලාවන් මෙන්ම පක්ෂ/ කණ්ඩායම් දෙකක කාර්යාල තදාසන්නව පිහිටුවීම නොකළයුතු බවට හා පක්ෂයක හෝ කණ්ඩායමක අපේක්ෂකයකු ප්‍රචර්ධනයට හෝ අගතියට පත්වන ආකාරයේ ප්‍රචාරණයන් සිදු නොකළ යුතුවන බවට උපදෙස් ද තරග කරනු ලබන පක්ෂ/ කණ්ඩායම් වෙත ලබා දෙන ලදී. උපදෙස් පරිදි කාර්යාල පිහිටුවීම හා ඊට අදාළ සෙසු කාර්යයන් ඉටුවේද යන්න පරීක්ෂා කිරීම ත්‍රේරීම්හාර නිලධාරී නියෝජිතයන්ගෙන් මෙන්ම අදාළ පොලිස් ජංගම සේවා මඟින් ද පරීක්ෂාවට ලක් කරන ලදී. එවැනි පරීක්ෂණ වලදී උපදෙස් ප්‍රකාරව පිහිටුවා නොමැති සහ විශේෂයෙන් වෙනත් පක්ෂ සහ කණ්ඩායම්වල අපේක්ෂකයන් ප්‍රචර්ධනය වන ආකාරයේ ප්‍රචාරණ කටයුතු සිදුකරන ලද කාර්යාලවල බලපත්‍ර අවලංගු කිරීමටද පියවර ගන්නා ලදී.

84. විශේෂයෙන්ම ඡන්ද විමසීමට අදාළ "නිහඬ කාලසීමාව තුළ" එනම් ඡන්ද විමසීම් දිනට පැය 48කට පෙර වූ කාලසීමාව තුළ නිවේදිත මැතිවරණ කාර්යාල ඉවත්කර ගැනීම හා ප්‍රචාරක කටයුතු සීමා කිරීමට අදාළව තරග කරනු ලබන පක්ෂ/ කණ්ඩායම්වල බලයලත් නියෝජිතයන් හා ස්වාධීන කණ්ඩායම් නායකයන් මෙන්ම ඔවුන් මඟින් අපේක්ෂකයන් ද දැනුම්වත් කිරීමට පියවර ගත් අතර, ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනය පස්වන උපලේඛනය ලෙස අමුණා ඇත.

85. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ සඳහන් මැතිවරණ නීති බලාත්මක කිරීමට අදාළව පොලීසිය සමඟ එක්ව මැතිවරණ දෙපාර්තමේන්තුව ගත හැකි සෑම පියවරක්ම ගනු ලැබූ අතර, ඒ අතර තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්වලින් සිවිල් සංවිධානවලින් මෙන්ම මහජනතාවගෙන් ලැබුණු පැමිණිලි අනුව ක්‍රියාකරමින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට කටයුතු කරන ලදී. විශේෂයෙන්ම පෝස්ටර්, කටවුට්, බැනර් ප්‍රදර්ශනය අත්පත්‍රිකා බෙදාහැරීම, රථ පෙළපාළි, ශබ්ද විකාශන මඟින් කරන ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ ලේකම්වරුන්/ ස්වාධීන කණ්ඩායම් නායකයන් සමඟ පැවති සාකච්ඡාවලදී මතුවූ කරුණුවලට අදාළව දෙපාර්ශ්වය විසින් පැමිණි එකඟතා සැලකිල්ලට ගෙන මැතිවරණ කොමසාරිස්වරයා විසින් මාධ්‍ය නිවේදනයක් ද නිකුත් කරන ලදී. එම නිවේදනය අටවන උපලේඛනය ලෙස යා කොට ඇත.

රාජ්‍ය සම්පත් අවභාවිතය වැළැක්වීම

86. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) සහ 104 ආ (5) (ඇ) (1) අනුව්‍යවස්ථාවලට අනුව ඡන්ද විමසීමකදී තරග කරනු ලබන යම් අපේක්ෂකයකු තෝරාපත් කර ගැනීම ප්‍රචර්ධනය කිරීමේ අරමුණෙන් හෝ වළක්වාලීමේ කාර්යය සඳහා රජයට අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් භාවිතා කිරීම වැළැක්වීමට මැතිවරණ කොමිසමට බලය පැවරී ඇත. එසේම මැතිවරණය නිසි ලෙස පැවැත්වීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ සහය ලබා ගැනීම සඳහා ද අවශ්‍ය විධිවිධාන මෙම සංශෝධන තුළ ඇතුළත් කර ඇත. පාර්ලිමේන්තු මැතිවරණය පවත්වනු ලබන අවස්ථාව වනවිට මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කර නොමැති වුවද, මැතිවරණ කොමසාරිස්වරයාට එම බලතල හිමිවන බව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 49 වන වගන්තියේ 3 (අ) උපවගන්තියේ සඳහන් වේ. 2015 ජනවාරි මස 08 වන දින පැවති ජනාධිපතිවරණයේදී මුහුණදුන් කරුණු සැලකිල්ලට ගෙන ඒවා යළි ඇති නොවීමට අවශ්‍ය පියවර ගැනීම වශයෙන් මැතිවරණ

දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය සම්පත් අවභාවිතය වැළැක්වීමට හා රාජ්‍ය නිලධාරීන්ගේ සහය මැතිවරණ රාජකාරි සඳහා ලබා ගැනීමට අදාළ වූ උපදෙස් අංක 1923/4 හා 2015.07.13 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. එම ගැසට් නිවේදනය උපලේඛන 9 ලෙස වාර්තාවට ඇතුළත් කර ඇත. ඊට අමතරව මෙම උපදෙස් තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙත ලබා දීමටත් සියලුම රාජ්‍ය ආයතන වෙත තැපැල් මඟින් යැවීමටත් පියවර ගන්නා ලදී.

87. මෙයට පූර්වයෙන් පැවති සෑම මැතිවරණයකදීම බලයේ සිටින පක්ෂය රජයේ සම්පත් අනිසි ලෙස භාවිතා කරමින් තම පක්ෂය නියෝජනය කරන අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට මෙන්ම විරුද්ධ පාක්ෂිකයන් අගතියට ලක්කිරීමට හැකි උපරිම අයුරින් කටයුතු කිරීම සාමාන්‍ය තත්ත්වය වුවද දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව රාජ්‍ය සම්පත් අවභාවිතය වැළැක්වීම සඳහා පියවර ගැනීමට මැතිවරණ කොමිසම හෙවත් තත්කාලයේ මැතිවරණ කොමසාරිස්වරයාට බලතල හිමිවීමත් සමඟ බලයේ සිටි පක්ෂ විසින් ගනු ලැබූ එවැනි ක්‍රියාමාර්ග වැළැක්වීමට හැකි උපරිම අයුරින් ක්‍රියාකිරීම නිසා මෙම මැතිවරණයේදී තත්ත්වය යම්තාක් දුරකට සුභදායි මට්ටමක පැවති බව කිවයුතුය. රජයේ දේපළ දේශපාලන කටයුතු සඳහා භාවිතයත් රජයේ මුදල් වැය කරමින් විවිධ උත්සව සංවිධානය කිරීම මෙන්ම මහජනතාව වෙත භාණ්ඩ බෙදාහැරීම හා විශේෂ සහන ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, රජයේ නිලධාරීන් දේශපාලන කටයුතුවලට යොදා ගැනීම, රාජ්‍ය සේවය සඳහා අලුතින් පුද්ගලයන් බඳවා ගැනීම, රජයේ සේවයේ උසස්වීම් මාරුවීම් දේශපාලන අවශ්‍යතාව පරිදි සිදු කිරීම පසුගිය ඡන්ද විමසීම් වලදී බොහෝ විට දැකගත හැකිය. දහනව වන සංශෝධනයට අදාළ කරුණු සම්බන්ධයෙන් දේශපාලඥයන් මෙන්ම රජයේ ඉහළ නිලධාරීන්ද දැනුම්වත් වීමේ ප්‍රතිඵලයක් ලෙස ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව එවැනි ක්‍රියාමාර්ග වලින් වැළකී සිටීමට එසේකරන්නන්ට සිදු විය. මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් අනුව නොවැළැක්විය හැකි අත්‍යවශ්‍ය කරුණක් මත යම් රජයේ ආයතනයකට සේවකයන් බඳවා ගැනීමක් හෝ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් කිරීමට සිදුවී ඇතිනම් එය මැතිවරණ කොමසාරිස්වරයා වෙත දන්වා පූර්ව අනුමැතිය ලබා ගෙන සිදුකළ යුතු විය. තවද මේ සම්බන්ධයෙන් විවිධ සිවිල් සංවිධාන, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා මහජනතාවද දැනුම්වත් වීමේ ප්‍රතිඵලයක් ලෙස දිස්ත්‍රික් මට්ටමෙන් මැතිවරණ මහලේකම් කාර්යාලයේ පිහිටි පැමිණිලි මධ්‍යස්ථාන වෙත ක්ෂණිකව මෙවැනි තොරතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි. බොහෝ විට ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂවල තරග කරනු ලබන අපේක්ෂකයන් තොරතුරු දෙනවාට අමතරව තම පක්ෂයේම අපේක්ෂකයන් අතුරින් එම පක්ෂයේම අපේක්ෂකයන් එවැනි වැරදි කරනු ලබන විට එම අපේක්ෂකයන්ගේ තොරතුරු වාර්තාවීම විශේෂත්වයකි.

88. රාජ්‍ය දේපළ අවභාවිතය වැළැක්වීම සහ මැතිවරණය නිසිලෙස පැවැත්වීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ සහය ලබා ගැනීම වෙනුවෙන් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට්පත්‍රයේ ඇතුළත් තොරතුරු සියලුම රජයේ කාර්යාල වෙත යැවීමටද ක්‍රියා කරන ලදී.

විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ

89. පූර්ව ඡන්ද විමසීම් කිහිපයකදීම මාධ්‍ය උපමාන නිකුත් කිරීම සිදු වුවද මාධ්‍ය ආයතන ඒ කෙරෙහි දක්වන ලද ප්‍රතික්‍රියා යහපත් මට්ටමක නොතිබුණි. පසුගිය ජනාධිපතිවරණයේදී ද අත්දුටු දෙය වූයේ රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය මැතිවරණ කොමසාරිස්වරයාගේ මාධ්‍ය උපමාන කෙරෙහි අවධානයක් යොමු නොකොට සිය කටයුතු කරගෙන යාමයි. මෙම මැතිවරණයේදී සුපුරුදු පරිදි මාධ්‍ය උපමාන පිළිබඳව සැකසූ කෙටුම්පතක් මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කොට ඉන් අනතුරුව මාධ්‍ය ආයතන ප්‍රධානීන් විසින් නම් කරන ලද නියෝජිතයන් සමඟ සාකච්ඡා කිරීමෙන් ලද පොදු එකඟතාවය ද සහිතව මාධ්‍ය උපමාන ප්‍රසිද්ධියට පත්කිරීමට කටයුතු කරන ලදී. ඒ අතර දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (5) අනු

ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවට/ මැතිවරණ කොමසාරිස්වරයාට ඡන්ද විමසීමක් නිදහස්ව හා සාධාරණව පැවැත්වීම සහතික කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය ආයතන හා ක්‍රියාකාරීන් විසින් පිළිපැදිය යුතු උපමාන නිකුත් කිරීමට හැකි බවට තහවුරු කරන ලදී.

90. දහ නව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව කොමිෂන් සභාව විසින් උචිතයැයි සලකනු ලබන යම් ගුවන්විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වාගෙන යන්නෙකු හෝ ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු, ප්‍රකාශකයකු හෝ වෙත උපමාන නිකුත් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව/ මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඇත. මෙහිදී රජයට සම්බන්ධ සියලු ආයතන වෙත උපමාන නිකුත් කිරීම මෙන්ම ඒවා නොපිළිපදින අවස්ථාවක අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ බලය ද මැතිවරණ කොමිසමට ලබා දී ඇත. පෞද්ගලික මාධ්‍ය වෙත උපමාන නිකුත් කළ හැකි වුවද ඒවා ක්‍රියාත්මක නොවන අවස්ථාවල කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි නැත. කෙසේ වෙතත් ඒ තත්ත්වය සැලකිල්ලට ගෙන ඉහත සඳහන් කළ පරිදි රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ද නියෝජනය වන පරිදි කමිටුවක් පත් කොට මාධ්‍ය උපමාන කෙටුම්පත් ලබා දී ඒවා සකස් විය යුතු ආකාරය සාකච්ඡා කොට මාධ්‍ය උපමාන අදාළ ආයතන වෙත ලබා දෙන ලදී. එම ක්‍රියාමාර්ග නිසා මුලින්ම තම ආයතනය විසින්ම එකඟ වූ කරුණු වලට අනුගතව වැඩ කිරීමට හා ස්වයංවාරණයක් පවත්වාගැනීමටත් සියලු මාධ්‍ය ආයතනවලට සිදු විය. මේ තත්ත්වය පාර්ලිමේන්තු මැතිවරණය නිදහස් හා සාධාරණව පැවැත්වීමට පහසුවක් විය.

91. මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීම නිදහස්ව හා සාධාරණව පැවැත්වීම සඳහා පනවනු ලබන විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය ආයතන හා ක්‍රියාකාරීන් විසින් පිළිපැදිය යුතු උපමාන තිස් හතරක් ඇතුළත් නිවේදනය අංක 1925/4 හා 2015 ජූලි මස 27 දිනැතිව අතිවිශේෂ ගැසට් පත්‍රය පළකරන ලදී. අදාළ ගැසට් නිවේදනය අංක 6 උපලේඛනය ලෙස මෙම වාර්තාවට යා කොට ඇත.

දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම

92. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(8) උප වගන්තියට අනුව මැතිවරණ කාලය තුළදී දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම සංග්‍රහයක් නිකුත් කිරීමට කොමිෂන් සභාවට හැකියාව ඇත. විශේෂයෙන් පසුගිය කාලය තුළ පවත්වන ලද පළාත්සභා ඡන්ද විමසීම් සැලකිල්ලට ගත් විට කෙසේ හෝ ජයග්‍රහණය කිරීම තම එකම අරමුණ කර ගනිමින් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් ක්‍රියා කළ ආකාරය මනාව පිළිබිඹු විය. ඒ තුළ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට වන බාධා සැලකිල්ලට ගෙන මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2012 පළාත්සභා ඡන්ද විමසීමේ සිට අපේක්ෂක ආචාරධර්ම පද්ධතියක් ප්‍රකාශයට පත් කරන ලදී. එලෙස ප්‍රකාශයට පත්කිරීමට පෙර ඒ සඳහා දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල එකඟතාව ලබා ගැනීමට ද ක්‍රියා කරන ලදී.

93. එලෙස ආරම්භ කරන ලද අපේක්ෂක ආචාර ධර්ම පද්ධතිය 2015 මහමැතිවරණයේදී දේශපාලන පක්ෂවල නායකයන් ලේකම්වරුන් ඇතුළු සියලුම ප්‍රමුඛ තනතුරුධාරීන්, තරග කරන අපේක්ෂකයන්, පළාත්සභා හා පළාත් පාලන ආයතන නියෝජනය කරන දේශපාලනඥයන් සියලුම දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් හා අපේක්ෂකයන්ගේ ආධාරකරුවන්ට මෙන්ම ඡන්ද විමසීමේදී තරග කරනු ලබන ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන්ටද බලපැවැත්වෙන පරිදි නිකුත් කරන ලදී. මේ යටතේ මැතිවරණ නීතියට අවනත වීම, සාමාන්‍ය හැසිරීම, මැතිවරණ ප්‍රචාරණ කටයුතු, ඡන්ද විමසීම් දින හා ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම හා වෙනත් විශේෂ කරුණු යටතේ ඉහත කී සියලු තැනැත්තන් කෙලෙස ක්‍රියාකළ යුතුද යන්න ගැන පැහැදිලි කිරීම් දක්වා ඇත. මෙම උපදෙස්වලට අනුගත වෙමින් ක්‍රියාකිරීම සඳහා දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්, තරග කරනු ලබන අපේක්ෂකයන් විසින් යාන්ත්‍රණයක් සකස්කරගනු ඇතැයි අපේක්ෂා කරන ලද අතර, එම අරමුණු වලට පිටුපා ක්‍රියාකරන ලද පක්ෂ හා අපේක්ෂකයන් වෙත ඒ තත්ත්වය පෙන්වා දී ඒවා නිවැරදි කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට උපදෙස් දෙන ලදී. අපේක්ෂක ආචාර ධර්ම ප්‍රසිද්ධියට පත්වීම තුළ ඡන්දදායකයන් තුළින් ද විවිධ පක්ෂ/

සංවිධානවලින්ද ආචාර ධර්මවලට පිටුපා කටයුතු කරනු ලබන අවස්ථා සම්බන්ධයෙන් පැමිණිලි කිරීම යහපත් තත්ත්වයක් විය. මේ ආකාරයෙන් ප්‍රකාශයට පත් කරන ලද තරග කරනු ලබන අපේක්ෂකයන් විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම පද්ධතිය අංක 1924/44 හා 2015 ජූලි මස 23 දිනැතිව අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමට ද පියවර ගන්නා ලද අතර, අදාළ ගැසට් පත්‍රය අංක 7 දරන උපලේඛනය ලෙස මෙම වාර්තාවට යා කොට ඇත.

ඡන්ද විමසීම

94. ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව හා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තිය යටතේ වූ නිවේදනය 2015.06.26 වන දින අංක 1920/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කිරීම අනුව මෙම පාර්ලිමේන්තු මැතිවරණය 2015 අගෝස්තු මස 17 වන දින පැවැත්විණි. ඡන්ද විමසීම් කාලය පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වා විය.

95. ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව එළඹෙන ඡන්ද විමසීම් දිනය හා ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට අදාළ කාර්යයන් ඡන්ද විමසීමේ උච්ඡතම අවස්ථා ලෙස සැලකේ. ඡන්ද විමසීමේ දිනට පෙර ඡන්ද විමසීම පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන නිලධාරීන්, ඡන්ද පෙට්ටි සහ ඡන්ද පත්‍රිකා ඇතුළු ආරක්ෂිත ද්‍රව්‍ය හා ලිපිලේඛන ඊට පෙරදින ඡන්ද මධ්‍යස්ථාන වෙත යැවීම දිස්ත්‍රික් ත්‍රේරීම්හාර නිලධාරීන් වෙත පැවරී ඇති මූලික වගකීමකි. ඒ යටතේ ඡන්ද මධ්‍යස්ථාන අනුව නිලධාරීන් නම්කොට පත්වීම් ලිපි තැපෑලෙන්ම යැවීම හා ඡන්ද පොළට අවශ්‍ය කරන ඡන්ද පෙට්ටි ඡන්ද පත්‍රිකා ඇතුළු වෙනත් ලිපිද්‍රව්‍ය මධ්‍යස්ථාන අනුව ගොනුකොට තැබීමත්, ඒවා ප්‍රවාහනය සඳහා අවශ්‍ය වාහන සූදානම් කර තැබීමත් කළ යුතු වේ. මෙම මැතිවරණයේදී ද පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම ඡන්ද මධ්‍යස්ථානභාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති හැර සෙසු ඡන්ද පොළ කාර්යය මණ්ඩලයට ඡන්ද විමසීම් දිනට පෙරදින පස්වරු 2.00ට පෙර, පොදු ප්‍රවාහන පහසුකම් යටතේ ගමන් පහසුව සලසා ගැනීමට අවස්ථාව සලසා දී තිබූ අතර, විශේෂයෙන්ම යාපනය අර්ධද්වීපයේ දූපත්වල පැවති ඡන්ද මධ්‍යස්ථාන සඳහා යාම් ඊම් සඳහා නාවික හමුදාවේ සහාය ද අදාළ කාර්යය මණ්ඩල වෙත ලබාදෙන ලදී.

96. ඡන්ද මධ්‍යස්ථාන භාරව යන සියලුම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් මෙන්ම ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක කටයුතු අධීක්ෂණය භාරව යන කලාප භාර සහකාර ත්‍රේරීම්හාර නිලධාරීන් වෙත ත්‍රේරීම්හාර නිලධාරී විසින් ප්‍රවාහන පහසුකම් සලසන ලදී. ඡන්ද පොළ භාරව යන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් මෙන්ම ඡන්ද පොළ අධීක්ෂණ කටයුතු භාරව යන කලාප භාර සහකාර ත්‍රේරීම්හාර නිලධාරීන් ද ඡන්ද විමසීම් දිනට පෙරදින දිස්ත්‍රික් ත්‍රේරීම්හාර නිලධාරී විසින් දන්වා ඇති ස්ථාන වෙත වාර්තා කිරීම අනිවාර්යය වේ. මක්නිසාද යත් එම නිලධාරීන් අනුයුක්ත කර ඇති ඡන්ද පොළ විස්තර ඔවුන් වෙත ලබාදෙනුයේ එලෙස වාර්තා කිරීමෙන් පසුව වීමයි. මේ අනුව ඡන්ද පොළ භාරව හා අධීක්ෂණ භාරව යන කිසිදු නිලධරයෙකු ඡන්ද විමසීම් දිනට පූර්වයෙන් වූ දිනය තෙක් තමා අනුයුක්ත කර ඇති ඡන්ද පොළ හා තමාට අධීක්ෂණයට ඇති ඡන්ද පොළවල් කුමක්ද යන්න නොදනී. ත්‍රේරීම්හාර නිලධාරී වෙත ඡන්ද විමසීම් දිනට පෙරදින පෙරවරුවේ වාර්තා කිරීමෙන් පසුව ඒ අවස්ථාව වන විට මැතිවරණ කොමසාරිස්වරයා විසින් දන්වා ඇති විශේෂ උපදෙස් ඇතිනම් ඒ ගැන මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ගතයුතු පියවර ත්‍රේරීම්හාර නිලධාරීන් හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් පැහැදිලි කරදීම සිදුකෙරිණ. ඉන්පසුව තමන්ට අදාළ විධිමත් පත්වීම් ලිපි භාරගෙන ඊට අදාළ නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත ගොස් ඡන්ද පොළට නියමිත ඡන්ද පෙට්ටි, ඡන්ද පත්‍රිකා ඇතුළු අනෙකුත් ලිපිද්‍රව්‍ය භාරගෙන ඡන්ද පොළට වෙන්කර ඇති වාහනයෙන් ත්‍රේරීම්හාර නිලධාරී විසින් දන්වා ඇති ඡන්ද පොළ මාර්ග විස්තරය පරිදි එම මාර්ගයේම ඡන්ද පොළ වෙත යාම එම නිලධාරීන්ගේ වගකීම වේ.

97. ඡන්ද විමසීම් දිනට පෙරදින වනවිට ඡන්ද පොළ ඡන්ද විමසීමට සුදුසු පරිදි අදාළ පහසුකම් සහිතව පිළියෙලකර තැබීම ඒ ඒ වසම්වල ග්‍රාම

නිලධාරී සතු වගකීමක් වේ. තේරීම්භාර නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් ග්‍රාම නිලධාරීන් දැනුම්වත්කොට එම කාර්යය ඉටුකර ගනී. තමාට නියමිත ඡන්ද පොළ වෙත යන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා තමාට නියමිත ඡන්ද පොළ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට යෝග්‍ය පරිදි ඇත්ද යන්න හා ඡන්ද පෙට්ටි, ඡන්ද පත්‍රිකා ඇතුළු ආරක්ෂිත ද්‍රව්‍ය සුරක්ෂිතව තබා ගැනීමේ පහසුකම් ගැන සලකා බලනු ඇත. ඉන්පසුව එදින පස්වරු 2.00ට පෙර ඡන්ද පොළ වෙත වාර්තා කරන සෙසු කාර්ය මණ්ඩලය ද හඳුනාගෙන සියලුම නිලධාරීන් එක්ව පෙරහුරුවක් පවත්වා ඊට පසුදින පැවැත්වෙන ඡන්ද විමසීමේදී කටයුතු කළ යුතු ආකාරය ගැන පැහැදිලි කිරීම සිදුකෙරේ. පෙරහුරුව අවසන් වීමෙන් පසුව කාන්තා නිලධාරිනියන්ට තමාගේ නිවෙසට හෝ තමන් නැවතී සිටින තාවකාලික ස්ථාන වෙත යාමට අවසර ලැබෙන නමුත් ඔවුන් ඡන්ද විමසීම් දින පෙරවරු 6.00ට පෙර නැවත ඡන්ද පොළට වාර්තා කිරීම කොන්දේසියක් වනු ඇත. පිරිමි නිලධාරීන් සියලු දෙනා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා සමඟ අදාළ ඡන්ද පොළේ රාත්‍රිය ගතකළ යුතුවේ. පෙරහුරුව අවසන්වීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තමා භාරයේ ඇති ආරක්ෂිත ද්‍රව්‍ය මෙන්ම ලිපිද්‍රව්‍ය, ගබඩා ද්‍රව්‍ය ආදිය ප්‍රමාණවත්ව ඇත්ද යන්න නැවත පරීක්ෂාවට ලක්කොට නිවැරදි බව සනාථ කරගත යුතුය. මන්දයත් කිසියම් අඩුපාඩුවක් වෙතොත් ඡන්ද පොළ අධීක්ෂණය භාරව පැමිණෙන කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරී මඟින් තේරීම්භාර නිලධාරී දැනුම්වත්කොට ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර එම අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහාය.

98. ඡන්ද පොළ කිහිපයක් අධීක්ෂණය භාරව යන කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරී ඡන්ද විමසීමේ දිනට පෙරදින තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කර පත්වීම් ලිපි භාරගැනීමෙන් පසුව තමාට නියමිත ඡන්ද පොළවල ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් නිකුත් කිරීමේ මධ්‍යස්ථානවලට ගොස් බඩුභාණ්ඩාදිය භාරගැනීම නිරීක්ෂණය කොට ඔවුන් සියලු දෙනාම මධ්‍යස්ථාන වෙත පිටත් වූ පසුව තමාට නියමිත ඡන්ද පොළ අධීක්ෂණය සඳහා ක්ෂේත්‍රයට යා යුතුය. තමාට නියමිත ඡන්ද පොළ වෙත ගොස් පෙරහුරුව පවත්වා නැතිනම් එය පැවැත්වීමට උපදෙස් දී ඒ ඒ ඡන්ද පොළ නිරීක්ෂණය කිරීමත්, පසුදින ඡන්ද විමසීම නිසිලෙස පැවැත්වීමට බාධාවක් ඇතිනම් ඒ ගැන සාකච්ඡාකොට විසඳුම් ලබාදීමත්, විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තේරීම්භාර නිලධාරිගෙන් භාරගත් බඩු බාහිරාදිය නිසියාකාරව ඇති බවට නැවත පරීක්ෂාකර සනාථකර තහවුරු කරගත යුතුය. නිලධාරීන් හෝ බඩුබාහිරාදිය ද ලිපිලේඛන ද අඩුවක් ඇත්නම් ඒවා යථාවත් කිරීම ද ඔහුගේ වගකීමක් වේ. අධීක්ෂණයට නියමිත සියලු ඡන්ද පොළ නිරීක්ෂණයෙන් පසුව පසුදින පෙරවරු 7.00ට ඡන්ද විමසීම ආරම්භ කිරීමට සියලු කටයුතු සූදානම් බවට වන පළමු පණිවුඩය තේරීම්භාර නිලධාරී වෙත දුරකථන හා ෆැක්ස් මඟින් දැනුම්දිය යුතු වේ.

99. ඡන්ද විමසීම් දින සියලුම කාර්යය මණ්ඩලය ඡන්ද විමසීමට සූදානම්ව එදින පෙරවරු 6.00ට ඡන්ද පොළ වෙත පැමිණ සිටිය යුතු බව හා ඡන්ද දායකයන් සඳහා වූ උපදෙස් ඇතුළත් දැන්වීම් ප්‍රදර්ශනය ඡන්ද කුටි ස්ථානගත කිරීම හා ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීමට අවශ්‍ය දෑ සූදානම්කර ගැනීම ආදී මූලික කටයුතු ඡන්ද විමසීමට නියමිත වේලාවට පෙර අවසන් කළ යුතු බවට ද තේරීම්භාර නිලධාරී විසින් උපදෙස් ලබා දී තිබුණි. තරග කරනු ලබන එක් එක් පක්ෂය හා එක් එක් ස්වාධීන කණ්ඩායම සඳහා එක් ඡන්ද පොළකට නියෝජිතයන් දෙදෙනෙකු බැගින් පත්කිරීමට පනතින්ම බලය පැවරී ඇති බැවින්, ඡන්ද පොළ නියෝජිතයන්ට ඡන්ද විමසීමේ දින පෙරවරු 6.30ට පෙර ඡන්ද පොළ වෙත වාර්තා කිරීමට උපදෙස් දී තිබුණි. ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර, ඡන්ද විමසීම සඳහා භාවිතා කරනු ලබන ඡන්දභිමි නාමලේඛන, ඡන්ද පෙට්ටි, ඡන්ද පත්‍රිකා, නිල සලකුණු ආදිය පරීක්ෂා කර බැලීමට හා විශේෂයෙන් ඡන්ද පත්‍රිකාව පිටුපස තබනු ලබන නිල සලකුණ තෝරා ගැනීම නියෝජිතයන්ගේ ද සහභාගිත්වයෙන් සිදු කළ යුතු බැවින්, එම කටයුතුවලට සහභාගි වී ඡන්ද විමසීම පිළිබඳ විශ්වාසය නියෝජිතයන් තුළ තහවුරු කර ගැනීමට ඔවුන් වෙත මෙම අවස්ථාව සලසන ලදී. ඡන්ද පෙට්ටිය මුද්‍රාතැබීමට පෙර, ඡන්ද පෙට්ටිය තුළ

කිසිවක් නොමැති බවට හා ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබීමට පෙර හෝ මුද්‍රා තැබූ පසු නියෝජිතයන්ට අවශ්‍යනම් ඡන්ද පෙට්ටිය ඇතුළත හෝ පිටත තම මුද්‍රාවක් හෝ හඳුනාගැනීමේ සලකුණක් තැබීමටත් අවසර දෙන ලදී. නියෝජිත මුද්‍රාවක් තබන්නේ නම් ඒ සෑම මුද්‍රාවකම ආදර්ශයක් ඒ අවස්ථාවේම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ලබාදිය යුතුවිය.

100. 2015 අගෝස්තු මස 17 වන දින පෙරවරු 7.00ට දිවයින පුරා පිහිටි ඡන්ද මධ්‍යස්ථාන 12,317කදී ඡන්ද විමසීම බාධාවකින් තොරව ආරම්භ කිරීමට හැකියාව ලැබිණි. ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද හිමියන් 15,044,490ක් සුදුසුකම් ලබා තිබුණි. පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීමේ දිනට පෙර සිටම ඡන්ද විමසීම් දින පෙරවරුවේම ඡන්ද පොළ වෙත ගොස් තම ඡන්දය පාවිච්චි කරන ලෙස ඡන්දදායකයන්ගෙන් කළ ඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ ඡන්ද පොළවල පෙරවරු 7.00 වනවිටත් ඡන්ද දායකයන් රැස්ව සිටි බවට වාර්තා විය.

101. කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරී ඡන්ද විමසීමේ දින පෙරවරුවේ, මධ්‍යාන්න හා පස්වරුවේ වශයෙන් අවම වශයෙන් අවස්ථා තුනකදී ඡන්ද මධ්‍යස්ථාන අධීක්ෂණය කොට ඡන්ද විමසීම නියමිත වේලාවට ආරම්භ කළ බවට වන දෙවන පණිවිඩය හා ඡන්ද විමසීම් කටයුතු අවසන් කළ බවට වන තෙවන පණිවිඩය ද තේරීම්භාර නිලධාරි වෙත එවිය යුතුය. ඡන්ද විමසීම ආරම්භ වීමෙන් පසු ඡන්ද පොළ අධීක්ෂණය මෙන්ම ඡන්ද පොළ අවට ඡන්ද විමසීමේ නීති උල්ලංඝනය වන පරිදි කටයුතු සිදුවන්නේ නම් පොලීසියේ සහාය ලබාගෙන ඒවා වැළැක්වීම ද ඔහුගේ කාර්යභාරයට අයත් වේ. තවද ඡන්ද පොළක යම් කලබලයක්/ නීතිවිරෝධී සිදුවීමක් සිදුවූයේ නම් වහාම එම ස්ථානයට ගොස් පරීක්ෂා කර ඒ බව තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කළ යුතු අතරම, ඡන්ද පොළ නිලධාරීන් විසින් ඡන්ද විමසීම නීතියට අනුකූලව ඡන්ද විමසීම් රාජකාරී සිදු කරන බවට ද සෑහීමකට පත්විය යුතුය. ඡන්ද විමසීම අවසන්ව තමාගේ අධීක්ෂණයට අයත් සියලු ඡන්ද පොළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතින් ඡන්ද පොළෙන් පිටත් වූ බව තහවුරු කර ගැනීමෙන් පසුව තේරීම්භාර නිලධාරී කාර්යාලයට වාර්තාකොට ඡන්ද විමසීමට අදාළව තමන් පවත්වාගෙන ගිය ජ'නලය තේරීම්භාර නිලධාරී වෙත භාරදීම ද කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරි විසින් කළ යුතු වේ.

102. මැතිවරණ මහලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවල මෙන්ම දිස්ත්‍රික් මට්ටමේ තෝරාගත් විශේෂිත ස්ථානවල පිහිටුවන ලද පැමිණිලි මධ්‍යස්ථානවල කටයුතු ඡන්ද විමසීම් දින මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු විධිමත් කළ අතර, ඒ තුළින් ඡන්ද විමසීමට අදාළව ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වීමට හැකියාව ලැබිණි. ඊට අමතරව ඡන්ද විමසීම් දිනට පෙරදින සිට සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, සහකාර තේරීම්භාර නිලධාරීන් දෙදෙනෙකුගේ හා පොලිස් පරීක්ෂකවරයකුගේ සහභාගිත්වයෙන් පිහිටුවන ලද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලවලටද දේශපාලන පක්ෂවලට, නිරීක්ෂණ සංවිධානවලට හෝ ඡන්ද දායකයන්ට ඕනෑම පැමිණිල්ලක් සිදුකිරීමට අවස්ථාව සලසන ලදී. එලෙස ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ඒ අවස්ථාවේදීම සහකාර තේරීම්භාර නිලධාරියකු හා පොලිස් නිලධාරීන් යොදවා පරීක්ෂණ සිදුකිරීමේ වැඩපිළිවෙළ ද ක්‍රියාත්මක විය. ඒ සමඟම කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ ජංගම දුරකථන අංක ඉහත සඳහන් කළ සියලු පැමිණිලි මධ්‍යස්ථාන වෙත ලබාදෙමින් පැමිණිලි සම්බන්ධයෙන් ක්ෂණිකව ඔවුන් සම්බන්ධ කරගෙන තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ ආකාරයෙන් පොලිස් ජංගම රථවලින් ද තොරතුරු ක්ෂණිකව ලබාගැනීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක විය.

103. 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත මඟින් ඡන්ද පොළේදී ඡන්ද දායකයා වෙත ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර අනන්‍යතා ලේඛනයක් මඟින් ඡන්ද දායකයාගේ අනන්‍යතාව සනාථකර ගැනීම අනිවාර්ය වූ බැවින් ඡන්දපොළ කටයුතු වඩාත් සාමකාමීව පවත්වාගෙන යාමට හැකියාව ලැබුණි. තවද 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතින් පාර්ලිමේන්තු මැතිවරණ පනතට සංශෝධනයක් ලෙස එකතු කරන ලද 48

(අ) වගන්තියට අනුව ඡන්දපොළ තුළ යම්කිසි අසාමාන්‍ය සිද්ධි ඇතිවීම හේතුවෙන් එවැනි ඡන්ද පොළවල ඡන්ද විමසීම ශූන්‍ය කිරීමට මැතිවරණ කොමසාරිස්වරයාට බලය ලැබීමත් සමඟ, ඡන්ද පොළ තුළ හෝ පරිශ්‍රය තුළ බාධාවකින් තොරව ඡන්ද විමසීම පවත්වාගත හැකි වාතාවරණයක් ඇති වූ අතර මෙම පාර්ලිමේන්තු මැතිවරණයේදී ද එම තත්ත්වය දැකගත හැකි විය.

104. 2015 අගෝස්තු මස 17 දින පෙරවරු 7.00ට ආරම්භ කරන ලද ඡන්ද විමසීම එදින පස්වරු 4.00ට අවසන් කරන ලදී. ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ඡන්ද පත්‍රිකා අඩංගු ඡන්ද පෙට්ටි මුද්‍රා තබා තේරීම්භාර නිලධාරි වෙත රැගෙන ගොස් භාරදීම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ වගකීම වන අතර, එම කාර්ය නිසි උපදෙස් පරිදි ඉටුවන්නේ ද යන්න අධීක්ෂණය කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ වගකීම ද වේ. මීට අදාළ ක්‍රියාමාර්ග ගැනීමේදී දේශපාලන පක්ෂ හා මහජනතාව තුළ මුල්බැස ඇති මිථ්‍යා මත එනම් ඡන්ද විමසීම අවසන් වී ඡන්ද පෙට්ටි තේරීම්භාර නිලධාරි වෙත ප්‍රවාහනය කිරීමේදී ඡන්ද පෙට්ටි මාරු කිරීමක් සිදුකරන බවට වූ මතය දුරුකිරීම සඳහා ඡන්ද පොළ නියෝජනය කරන ඒ ඒ පක්ෂ/කණ්ඩායම්වල නියෝජිතයන් ඉදිරියේදීම ඒ සඳහා වූ විශේෂිත ක්‍රම අනුගමනය කළ යුතු බවට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතින් වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් උපදෙස් ලබාදී තිබුණි. ගනු ලැබූ එවැනි ක්‍රියාමාර්ග අතර,

* ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ඡන්ද පෙට්ටිය රාජ්‍ය ලාංඡනය සහිත ආරක්ෂිත ටේප්පටි වලින් මුද්‍රා තැබීම;
* ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ඡන්ද පොළ නියෝජිතයින්ට නැවතත් තමාගේ මුද්‍රාතැබිය හැකි වීම.(ස්ටිකර් මඟින්)
* ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පිටපත් භයකින් යුතු කාබනීකෘත කඩදාසියක සකස්කර, ඡන්ද පොළ නියෝජිතයන්, ඡන්ද පොළ නිරීක්ෂකයන්, ඡන්ද පොළ කාර්ය මණ්ඩලයේ සෙසු නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ද ඇතුළත්ව ඔවුන්ගේ නම්, තනතුරු හා ජාතික හැඳුනුම්පත් අංක ඇතුළත් කරන ලද ලේඛනයක අත්සන් යොදා, එම ලේඛනයේ මුල් පිටපත ඡන්ද පෙට්ටියේ පියන හා බඳ කොටස ආවරණය වන පරිදි ඇලවීමෙන්, දෙවන පිටපත ඡන්ද පත්‍රිකා ගිණුම බහාලන කවරයට බහාලමින්, තෙවන පිටපත ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ ප'නලය බහාලන කවරයට බහාලමින්, ඉතිරි පිටපත් තුන ලේඛනයේ අත්සන් තබන ලද පක්ෂ තුනක නියෝජිතයන් වෙත භාරදීමටත් උපදෙස් දෙන ලදී. මේ තුළින් ඡන්ද පොළට අදාළ ඡන්ද පෙට්ටියම ගණන් කිරීමේ ශාලාවට ලැබී ඇතිද යන්න ගැන තහවුරුවක් ගණන් කිරීමේ ශාලාවේදී දේශපාලන පක්ෂ නියෝජිතයින්ට බලාගත හැකිවනු ඇත;
* පිටපත් පහකින් යුතුව පිළියෙල කරනු ලබන ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ඡන්ද පත්‍රිකා ගිණුමේ පිටපතක් ඡන්ද පොළ නියෝජිතයන් වෙත ලබාදීම;
* ඡන්ද විමසීම අවසන්ව මුද්‍රා තබන ලද ඡන්ද පෙට්ටිය පොලිතීන් උරයක බහා ප්ලාස්ටික් ටැග් එකක් යොදා එම ටැග් එක හඳුනා ගැනීමේ අංක ඡන්ද පොළ නියෝජිතයන් වෙත ලබාදීම;
* ඡන්ද පෙට්ටිය ආපසු ගණන් කිරීමේ ශාලා වෙත රැගෙන යාමේදී කැමති ඕනෑම දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වල ඡන්ද පොළ නියෝජිතයකු බැඟින් තම වාහනයෙන් ඡන්ද පෙට්ටිය රැගෙන යන වාහනය පසුපස ගණන් කිරීමේ ශාලා පරිශ්‍රය ආසන්නයේ පිහිටා ඇති අවසාන මුර කපොල්ල දක්වා යාමට හැකිවන පරිදි අවසර පත්‍රයක් නිකුත් කිරීම;
* ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍රයේ දී ඡන්ද පෙට්ටි මාරු කරන බවට වූ සැකය දුරු කිරීම සඳහා ගණන් කිරීමේ ශාලා පරිශ්‍රය ආසන්නයේ පිහිටි අවසාන මුර කපොල්ලෙන් පිට ගණන් කිරීම් ශාලාව දක්වා රැඳී සිට ගණන් කිරීම සඳහා පත්කළ නියෝජිතයන් පස්දෙනාගෙන් එක් අයෙකුට, නිරීක්ෂණය සඳහා අවස්ථාව ලබාදෙන ලදී;
* එමෙන්ම එම නියෝජිතයාට ප.ව 3.00 න් පසු ගණන් කිරීමේ ශාලාව නිරීක්ෂණයට ද

අවස්ථාව ලබා දුන් අතර එමඟින් ලකුණු කළ ඡන්ද පත්‍රිකා සහිත පෙට්ටි ගණන් කිරීමේ ශාලා තුළ ඇති බවට වූ සැකය දුරු කළ හැකි විය.

- තේරීම්භාර නිලධාරි විසින් නියමකර ඇති මාර්ගයේම ඡන්ද පෙට්ටිය රැගෙන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් පැමිණිය යුතු බව තහවුරු කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්/ සහකාර තේරීම්භාර නිලධාරීන්/පොලිස් නිලධාරීන්ගෙන් සමන්විත පරීක්ෂණ මුර කපොළු පිහිටුවීම සහ එම ස්ථාන සඳහා දේශපාලන පක්ෂ/ කණ්ඩායම් නියෝජිතයන්ට ද අවස්ථාව ලබා දීම තුළින් පක්ෂ/ කණ්ඩායම් වලට ඒ බව තහවුරු කරගත හැකි වනු ඇත.

යන කරුණු ප්‍රධාන වේ. මේ තුළින් ඡන්ද පොළේදී මුද්‍රා තබන ලද ඡන්ද පෙට්ටි ගණන්කිරීමේ ශාලාවට ලැබී ඇති බවට තහවුරු කර ගැනීමට පක්ෂ / කණ්ඩායම්වලට අවස්ථාව සලසන ලදී.

105. පස්වරු 4.00ට ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ඉහත සඳහන් කළ පරිදි ඡන්ද පෙට්ටි මුද්‍රා තබා, ඉතිරි ඡන්ද පත්‍රිකා, පාවිච්චි කරන ලද ඡන්දහිමි නාමලේඛනය, පාවිච්චි කළ නොකළ මුද්‍රා ආදිය ද ඡන්ද පොළ නියෝජිතයන් ඉදිරියේ මුද්‍රා තබා ඡන්ද පොළේ සියලු කටයුතු අවසන්කොට ඡන්ද පෙට්ටිය රැගෙන ආ මාර්ගයේම ආපසු රැගෙනවිත් තේරීම්භාර නිලධාරී වෙත භාරදීමට නියමිත විය. මෙම මැතිවරණයේදී සියලුම ඡන්ද පොළවල ඡන්ද පෙට්ටි ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත ඡන්ද විමසීමේ දින රාත්‍රී 10.00ට පෙර ලැබුණු බවට තේරීම්භාර නිලධාරීන් වාර්තා කරන ලදී. ඡන්ද ගණන් කිරීම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් පරිදි, ගණන් කිරීමේ ශාලාවට අදාළ සියලු ඡන්ද පෙට්ටි ලැබී තිබීම, ගණන් කිරීමේ නියෝජිතයින් හා කාර්ය මණ්ඩල වෙත දැනුම් දී තිබූ ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට නියමිත වූ වේලාව එළඹ තිබීම යන කරුණු සැලකිල්ලට ගෙන ඡන්ද ගණන් කිරීම ආරම්භ කරන ලදී.

ඡන්ද පත්‍රිකා ගණන් කිරීම

106. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 49 වැනි වගන්තියේ සිට 56 වැනි වගන්තිය දක්වා වූ වගන්ති වලින් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම පිළිබඳව ද, එම පනතේ දෙවැනි උපලේඛනයේ 18 සිට 28 දක්වා වූ නියෝග වලින් තැපැල් ඡන්ද ගණන් කිරීම පිළිබඳව නියෝග ද දක්වා ඇත. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 50 වන වගන්තියට අනුව, තේරීම්භාර නිලධාරි විසින්, තරග කරනු ලබන එක් එක් පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ට හෝ බලයලත් නියෝජිතයන්ට සහ ස්වාධීන කණ්ඩායම් නායකයන් වෙත ද ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල පිහිටීම, ඡන්ද ගණන් කිරීම ආරම්භ කරන දිනය හා වේලාව සහ එක් එක් ඡන්ද ගණන් කිරීමේ ශාලාවකට වෙන් කරන ලද ඡන්ද පොළවල විස්තරයක් ද යැවිය යුතුය.

107. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද ගණන් කිරීමේ ස්ථාන හඳුනා ගැනීම, ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය පත් කිරීම මෙන්ම ඡන්ද ගණන් කිරීම් කටයුතු නිරීක්ෂණයට පැමිණිය හැකි ගණන් කිරීමේ නියෝජිතයන් සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් දැනුම්වත් කිරීම ද කළ යුතු වේ. ඡන්ද ගණන් කිරීමේ ශාලා පිහිටුවීමේදී එක් සාමාන්‍ය ගණන් කිරීම් ශාලාවකට ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව 10,000 - 12,500ත් අතර වන සේ ඡන්ද පොළ අනුව වෙන් කිරීම සිදු කෙරේ. මෙහිදී ඡන්ද පොළ අංක අනුපිළිවෙළ වෙනුවට වෙනස් වූ ඡන්ද කොට්ඨාස අහඹු ලෙස තෝරා ගණන් කිරීමේ ශාලා සඳහා යෙදීමට ද තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

108. තැපැල් ඡන්ද පැකැට්ටු 1,500 - 2,000ත් අතර ප්‍රමාණයකට එක් තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලාවක් බැඟින් පිහිටුවීමට උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත් ඡන්ද ගණන් කිරීම සඳහා පත් කළ යුතු කාර්ය මණ්ඩලය තරග කරනු ලබන පක්ෂ/ කණ්ඩායම් අනුව පත් කරනු ලැබිය හැකි නියෝජිතයින් ප්‍රමාණය සැලකිල්ලට ගත්විට ඉහත කී සීමාවන් තුළ ගණන් කිරීමේ ශාලා පිහිටුවීමට නොහැකි වූ අවස්ථා ද විය. එක් සාමාන්‍ය ගණන් කිරීමේ ශාලාවකට කාර්ය මණ්ඩලය 30 - 40ත් අතර සංඛ්‍යාවක් සහ තැපැල් ඡන්ද ගණන් කිරීම

සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හැර අවම වශයෙන් නිලධාරීන් 15ක් පත් කිරීමටත්, සාමාන්‍ය ගණන් කිරීමේ නියෝජිතයන් එක් පක්ෂයකට හෝ කණ්ඩායමකට එක් ගණන් කිරීමේ ශාලාවක් වෙනුවෙන් 5 දෙනකු බැගින් පත් කිරීමට ඇති හැකියාවත් සැලකිල්ලට ගෙන ගණන් කිරීමේ ශාලා පිහිටුවීමට තේරීම්භාර නිලධාරීන්ට සිදුවීම ඊට හේතු විය. සියලුම දිස්ත්‍රික්කවලට අදාළව ඡන්ද ගණන් කිරීමේ ශාලා 1,600ක් පිහිටුවන ලද අතර, ඉන් 1,283ක් සාමාන්‍ය ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ ශාලා සහ 317ක් තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලා වූ අතර, එක් එක් දිස්ත්‍රික්ක අනුව පිහිටුවන ලද මුළු ගණන් කිරීමේ ශාලා ප්‍රමාණයට අදාළ විස්තරය අංක X සටහනෙහි දක්වා ඇත.

109. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 51 වන වගන්තියට අනුව තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානය සඳහා නියෝජිතයන් පස්දෙනකු බැගින් පත්කිරීමට හා තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සඳහා නියෝජිතයන් දෙදෙනකු බැගින් පත්කිරීමට හැකියාව ඇත. තේරීම්භාර නිලධාරි විසින් පිළිගත් දේශපාලන පක්ෂවල බලයලත් නියෝජිතයන් සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන් වෙත යවනු ලබන ගණන් කිරීමේ නිවේදනයේ සඳහන් එක් එක් ගණන් කිරීමේ ශාලාවට ඒ අනුව නියෝජිතයන් පත්කිරීමට හා ඔවුන් වෙත තේරීම්භාර නිලධාරි අවසර පත්‍ර ඡන්ද ගණන් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර ලබාදීමට ද බලයලත් නියෝජිතයන්/ ස්වාධීන කණ්ඩායම් නායකයන් කටයුතු කළ යුතුය. ඡන්ද ගණන් කිරීමේදී, විශේෂයෙන් මනාප ගණන් කිරීමේ කටයුතුවලදී අක්‍රමිකතා සිදුවන්නේය යන උපකල්පනය මත පිහිටා බොහෝ දේශපාලන පක්ෂ තවදුරටත් කටයුතු කරන බැවින්, දේශපාලන නිත්‍ය නියෝජිත රැස්වීම්වලදී එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් නියෝජිතයකු බැගින් පත්කිරීමට අවසර ඉල්ලා සිටියත්, එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි බැවින්, මැතිවරණ කොට්ඨාසයට තරග කරනු ලබන අපේක්ෂක සංඛ්‍යාව සැලකිල්ලට ගෙන, මනාප ගණන් කරන අවස්ථාවේ දී එක් එක් පක්ෂයට අතිරේක නියෝජිතයකු පත්කිරීමට අවසරය ලබාදීමට මැතිවරණ කොමසාරිස්වරයාගේ එකඟතාව හිමිවිය. එම අතිරේක නියෝජිතයන්ට ගණන් කිරීමේ පරිශ්‍රය තුළ රැඳිසිටීමට පහසුකම් සැලසීමටත්, මනාප ගණන් කිරීමේ අවස්ථාවේ දී නියමිත ශාලාවට යොමු කිරීමටත් අවශ්‍ය වැඩපිළිවෙළ සකසන ලදී. ඊට අමතරව එක් එක් ගණන් කිරීමේ පරිශ්‍රය සඳහා පක්ෂ ලේකම්වරයාට විශේෂ නියෝජිතයකු පත්කිරීමටත්, තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂයක නායකයාට ඔහුට/ ඇයට හිමි විශේෂ ආරක්ෂක හට පිරිස් හේතුවෙන් ඕනෑම ගණන් කිරීමේ මධ්‍යස්ථානයකට යාමට බාධා ඇතිවිටක ඒ වෙනුවට විශේෂ නියෝජිතයකු පත් කිරීමටත්, ඔහුට සියලුම ගණන් කිරීමේ ශාලාවලට යාමටත් අවසරය ලබාදෙන ලදී. එවැනි ඉල්ලීම් එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් හා එක්සත් ජාතික පක්ෂයෙන් ලැබුණු අතර, ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කය වෙනුවෙන් බලයලත් නියෝජිත මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙනුත් කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් බලයලත් නියෝජිත රනිල් වික්‍රමසිංහ මහතා වෙනුවෙනුත් නියෝජිතයකු බැගින් පත් කිරීම සිදු කරන ලදී. ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍රයේ දී/ ගණන් කිරීමේ ශාලාවේ දී ඡන්ද පෙට්ටි මාරු කිරීම සිදු කෙරෙනවාය යන මතය දුරු කිරීම සඳහා එක් එක් පක්ෂයට/ ස්වාධීන කණ්ඩායමට එක් එක් සාමාන්‍ය ගණන් කිරීමේ ශාලාවකට පත් කළ හැකි නියෝජිතයන් පස්දෙනාගෙන් එක් අයකුට ඡන්ද විමසීම් දින ප.ව. 3.00 සිට අදාළ පරිශ්‍රයේ/ ගණන් කිරීමේ ශාලාවේ රැඳිසිටීමට හා අවශ්‍ය නම් ගණන් කිරීමේ ශාලාව පරීක්ෂා කර බැලීමටත් අවසරය තේරීම්භාර නිලධාරි විසින් ලබා දෙන ලදී.

110. ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව, ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් රැගෙන එන ඡන්ද පෙට්ටි ඇතුළු ආරක්ෂිත බඩු බාහිරාදිය භාරගැනීම සඳහා වූ වැඩපිළිවෙළ තේරීම්භාර නිලධාරි අධීක්ෂණය යටතේ සිදු වූ අතර, බඩු බාහිරාදිය භාරගත් පසු ඡන්ද ගණන් කිරීමට අදාළ ද්‍රව්‍ය වෙනමමත්, අනෙකුත් මුද්‍රා තබන ලද කවර හා අනෙකුත් බඩු බාහිරාදිය වෙනමමත් ගණන් කිරීමේ ශාලාව තුළම තැන්පත් කරන ලදී. ඡන්ද විමසීම් දින පස්වරුවේ ඡන්ද ගණන් කිරීමේ ශාලාවට පැමිණෙන ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි විසින් ගණන් කිරීමට අදාළ දෑ

ලිඛිතව තමා භාරයට ගෙන ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පියවර ගනු ලැබේ.

111. ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයට ඡන්ද ගණන් කිරීමේ දින ප.ව. 6.00ට පෙර ගණන් කිරීමේ ශාලාවලට වාර්තා කරන ලෙස උපදෙස් දී තිබුණි. තැපැල් ඡන්ද ගණන් කිරීම ඡන්ද විමසීම් දින ප.ව. 4.30 ට ඇරඹීමට සැලසුම් කරන ලද බැවින් තැපැල් ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය එදින ප.ව. 3.00ට අදාළ ගණන් කිරීමේ ශාලාවට වාර්තා කළ යුතු විය. ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය බොහෝ දිස්ත්‍රික්කවල එම දිස්ත්‍රික්කයෙන්ම තෝරාගත් නිලධාරීන්ගෙන් සමන්විත විය. කෙසේ වෙතත්, ගණන් කිරීමේ කටයුතු අධීක්ෂණය කරන සහකාර තේරීම්භාර නිලධාරීන් කොළඹ දිස්ත්‍රික්කයෙන් අනෙකුත් දිස්ත්‍රික්ක වෙත යවන ලදී. එලෙස කොළඹින් යවන ලද සියලුම නිලධාරීන් මැතිවරණ මහලේකම් කාර්යාලයේදී පුහුණු කරන ලද අතර, දිස්ත්‍රික් මට්ටමේ දී තේරීම්භාර නිලධාරි විසින් අවශ්‍ය පුහුණු කිරීම් කරන ලදී. ඡන්ද ගණන් කිරීමේ සෙසු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම ගණන් කිරීම් ආරම්භ කිරීමට පෙර ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් විසින් සිදු කෙරිණ.

112. ඡන්ද ගණන් කිරීමේ ශාලා සකස් කර අවසන් වූ අවස්ථාවේ සිට එම ස්ථාන සඳහා ආරක්ෂාව සැලසීම පොලීසියේ වගකීම විය. ඒ අනුව, එම ආරක්ෂක වැඩපිළිවෙළ ඡන්ද ගණන් කිරීම අවසන් කර ප්‍රතිඵලය ප්‍රකාශ කිරීම දක්වාම ක්‍රියාත්මක කෙරේ. ඡන්ද ගණන් කිරීමේ අවස්ථාවේදී ද එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයකට පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ආරක්ෂාව සඳහා ලබාදුන් අතර, පරිශ්‍රයේ ආරක්ෂාව සඳහා සහ තේරීම්භාර නිලධාරි ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරනු ලබන ස්ථානය සඳහා ද විශේෂ ආරක්ෂාවක් සලසන ලදී. එක් එක් පරිශ්‍රයේ සිට ප්‍රතිඵල ලේඛන තේරීම්භාර නිලධාරි වෙත රැගෙන ඒමේදී පොලිස් නිලධාරීන් කැටුව පැමිණිය යුතු බවට ද සියලුම ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් දැනුම්වත් කරන ලදී.

113. ඡන්ද ගණන් කිරීම් ආරම්භ කිරීම සඳහා මූලික කොන්දේසි තුනක් සම්පූර්ණ විය යුතු බවට සියලුම ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් උපදෙස් පන්තිවලදී දැනුම්වත් කරන ලදී. ගණන් කිරීමේ ශාලාවට අදාළ සියලුම ඡන්ද පෙට්ටි ලැබී තිබීම, තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් වෙත දන්වනු ලැබූ ඡන්ද ගණන් කිරීම ඇරඹීමේ වේලාව පසුවී තිබීම හා ඡන්ද පොළවල කලබල පිළිබඳ වාර්තාව පරීක්ෂා කිරීමෙන් පසු ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීම සඳහා තේරීම්භාර නිලධාරී නියෝගය ලැබී තිබීම එම මූලික කොන්දේසි වේ. කෙසේ වෙතත් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර ඡන්ද ගණන් කිරීමේ ශාලා වෙත නියෝජිතයන් වාර්තා කර ඇත්ද නැත්ද යන්න ගැන සැලකිලිමත්ව, පැමිණ නැතිනම් ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් අදාළ ගණන් කිරීමේ ශාලාවේ ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට සූදානම් බැවින් වහාම වාර්තා කරන ලෙසට නියෝජිතයන් දැනුම්වත් කිරීමට ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර ඡන්දපොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පොළ කලබල සම්බන්ධයෙන් පවත්වා ගෙන යන ලද Z කවරයේ බහාලූ වාර්තාව විවෘත කර, එහි සඳහන් ඡන්ද පොළ තොරතුරු ZCCO වාර්තාවේ සටහන් කර තේරීම්භාර නිලධාරි වෙත යැවිය යුතුය. තේරීම්භාර නිලධාරි විසින් එම වාර්තාව හා ඒ වනවිට තමා වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් දන්වා ඇති තොරතුරු ද පරීක්ෂා කර බලා අදාළ ඡන්ද පොළවල කිසිදු කලබලයක් සිදුව නොමැති බව තහවුරු කර ගැනීමෙන් පසුව ZCCO වාර්තාවේ පිටපතක් සමඟ ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමේ නියෝගය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි වෙත එවනු ලැබේ. Z වාර්තාව තුළින් හෝ ඒ වනවිටත් තේරීම්භාර නිලධාරි වෙත හෝ මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබී ඇති පැමිණිලි අනුව යම් ඡන්ද පොළක් තුළ කිසියම් කලබලයක් සිදුව ඇත්නම් ඊට අදාළ ඡන්ද පොළ සම්බන්ධයෙන් කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරි පවත්වාගෙන යන ZARO වාර්තාව ඡන්ද පොළ දේශීය මැතිවරණ නිරීක්ෂකයන් විසින් පවත්වාගෙන යන ZLOB වාර්තා පරීක්ෂා කිරීම හා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති ඇතුළු සෙසු අදාළ නිලධාරීන්ගෙන් ප්‍රකාශ ද ලබාගෙන එම තොරතුරු මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කොට අදාළ ඡන්ද පොළ ඡන්ද ගණන් කිරීම් සම්බන්ධයෙන් උපදෙස් ලබා ගත යුතු වේ. නිදහස්

හා සාධාරණ ඡන්ද විමසීමකට බාධාවන ආකාරයෙන් සිද්ධීන් සිදුව ඇති බවට මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිගමනය කරන්නේ නම් එවැනි ඡන්ද පොළවල ඡන්ද විමසීම ශූන්‍ය කොට ඒ සඳහා නැවත ඡන්ද විමසීමක් පැවැත්වීමටත්, ඒ අදාළ ඡන්ද පොළවල් හැර අනෙක් ඡන්ද පොළ ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ හැකි බවටත් උපදෙස් තේරීම්භාර නිලධාරීන්ට ලබාදෙනු ඇත. එවැනි අවස්ථාවක ශූන්‍ය කෙරෙන ඡන්ද පොළවල් හැර ගණන් කරනු ලබන අනෙකුත් ඡන්ද පොළවලට අදාළ ප්‍රතිඵල තේරීම්භාර නිලධාරි විසින් වෙනම මුද්‍රා තබා තමා භාරයේ තබාගෙන ශූන්‍ය කරන ඡන්දපොළ සඳහා පවත්වන නැවත ඡන්ද විමසීමෙන් පසුව එම ඡන්ද පොළවල ඡන්ද ගණන් කර, එම ගණන් කිරීම් ශාලාවට අදාළ එක් එක් පක්ෂ/ කණ්ඩායම් ලබාගත් ඡන්ද ප්‍රමාණය තීරණය කරනු ලැබේ. ඉන්පසුව සියලුම ගණන් කිරීම් ශාලාවලින් ඒ ඒ කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව එකතුකොට මැතිවරණ කොට්ඨාසයෙන් එක් එක් පක්ෂ/ කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කෙරේ.

114. ඡන්ද ගණන් කිරීම අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කෙරෙන අතර, පළමුවන අදියරේ දී එක් එක් ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද සංඛ්‍යාව ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් භාර දී ඇති ඡන්ද පත්‍රිකා ගිණුම හා සැසඳේ ද යන්න පරීක්ෂා කෙරේ. මෙහිදී ප්‍රථමයෙන් ඡන්ද පත්‍රිකා ගිණුම විවෘත කර, එහි සඳහන් ඡන්ද පොළේ නම අනුව ඊට අදාළ ඡන්ද පෙට්ටිය විවෘතකර ගණන් කිරීමට ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී නියෝග කෙරේ. මෙහිදී විවෘත කරන ලද ඡන්ද පත්‍රිකා ගිණුමට අදාළ විස්තර ගණන් කිරීමේ නියෝජිතයන්ට පරීක්ෂා කිරීමට ඉඩ සැලසේ. මෙහිදී ඡන්ද පත්‍රිකා ගිණුමේ සඳහන් සංඛ්‍යා සහ ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද සංඛ්‍යාව සැසඳේ නම් එය ධාරකයට යොමු කරන අතර, නොසැසඳේ නම් තවත් අවස්ථා දෙකක් ගණනය කර එම ප්‍රතිඵලය ඡන්ද පෙට්ටියේ තිබූ සත්‍ය ඡන්ද සංඛ්‍යාව ලෙස පිළිගනු ඇත. ඒ ආකාරයෙන් ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අදාළ සියලුම ඡන්ද පෙට්ටිවල ඇති ඡන්ද පත්‍රිකා ගණනය කිරීම පළමු අදියර යටතේ සිදුවේ.

115. ඡන්ද ගණන් කිරීමේ දෙවන අදියර යටතේ එක් එක් පක්ෂය හා කණ්ඩායම් අනුව ඡන්ද පත්‍රිකා තේරීම, ගණන් කිරීම, පරීක්ෂා කිරීම, නැවත පරීක්ෂාව හා අභියු පරීක්ෂාව යන කාණ්ඩ පහ යටතේ ඡන්ද පත්‍රිකා ගණනය කිරීම හා පරීක්ෂාව සිදු කොට එක් එක් පක්ෂය හා කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කෙරේ. මෙහිදී ඒ ඒ පක්ෂ/ කණ්ඩායම් වෙත ඡන්ද පත්‍රිකා තේරීම සම්බන්ධයෙන් පසුගිය ඡන්ද විමසීම්වලදී ලැබුණු පැමිණිලි පදනම් කර ගෙන එනම් වෙනත් පක්ෂ හෝ කණ්ඩායම්වල ඡන්ද පත්‍රිකා ඊට අදාළ නොවන පෙට්ටිවල බහාලන බවට ලැබුණු පැමිණිලි ගැන සැලකිල්ල යොමු කොට පළමු උප අදියර යටතේ මුළු කාර්යය මණ්ඩලය යොදා ඒ ඒ පක්ෂ අනුව තේරීමත් නැවත පරීක්ෂාවක් සිදු කොට දෙවන උප අදියර යටතේ නැවත තේරීම, ගණන් කිරීම, පරීක්ෂා කිරීම, නැවත පරීක්ෂා කිරීම හා අභියු පරීක්ෂාව සිදු කොට එක් එක් පක්ෂය/ කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීමට අදාළ උපදෙස් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් වෙත ලබා දෙන ලදී. ඡන්ද ගණන් කිරීමේ දෙවන අදියර අවසානයේ ඒ ඒ පක්ෂ හා කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ප්‍රතිඵලය තේරීම්භාර නිලධාරී වෙත භාරදීමෙන් පසුව ඡන්ද ගණන් කිරීමේ තුන්වන අදියර ආරම්භ කෙරිණි.

116. ඡන්ද ගණන් කිරීමේ තුන්වන අදියරේදී සිදු කෙරෙනුයේ ඒ ඒ පක්ෂ/ කණ්ඩායම්වල අපේක්ෂකයන් ලබා ගත් මනාප ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීමයි. එහිදී වැඩිම ඡන්ද ලබා ගත් පක්ෂයෙන් ආරම්භ කර අනුපිළිවෙළට සියලුම පක්ෂ/ කණ්ඩායම්වලින් තේරී පත්වී ඇති පක්ෂ/ කණ්ඩායම්වල අපේක්ෂකයන් ලබා ගත් මනාප ඡන්ද ගණන් කිරීම සිදු වේ. ඒ අනුව වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් පක්ෂයේ ඡන්ද පත්‍රිකා රැගෙන ඒවා කාර්යය මණ්ඩලය යොදා ගනිමින් කාණ්ඩ හයකට වෙන් කරනු ලැබේ. එනම් මනාප 1ක් සලකුණු කරන ලද, මනාප 2 ක් සලකුණු කරන ලද, මනාප 3ක් සලකුණු කරන ලද, මනාප සලකුණු කර නොමැති මනාප අවිනිශ්චිත හා මනාප 3ට වඩා ලකුණු කර ඇති ලෙස වෙන්කොට ඊට අදාළ පෙට්ටිවලට බහාලනු ලැබේ. ඉන්පසුව ගණනය කිරීම් සඳහා මනාප වලංගු නොවන ඡන්ද

පත්‍රිකා කාණ්ඩ අනුව වෙන වෙනම කවරවල තබා මුද්‍රා තබා වලංගු මනාප1, මනාප 2, මනාප 3 ඡන්ද පත්‍රිකා පමණක් රැගෙන නැවත පරීක්ෂා කිරීමෙන් පසුව සැසැඳුම් පත්‍රිකාවල සලකුණු කිරීම හා නැවත පරීක්ෂාව සිදු කෙරේ. ඒ ආකාරයෙන් ඒ පක්ෂය/ කණ්ඩායමේ ඡන්ද පත්‍රිකාවල අඩංගු මුළු මනාප ප්‍රමාණය එම පක්ෂයෙන් තරග කරනු ලබන අපේක්ෂකයන් අතර බෙදී යන ආකාරය දැක්වෙන ප්‍රතිඵලය අදාළ ආකෘතියේ සටහන් කර තේරීම්භාර නිලධාරී වෙත භාරදීමෙන් පසුව අනුපිළිවෙළට ඊළඟ වැඩිම ඡන්ද ලබාගත් පක්ෂයේ/ කණ්ඩායමේ මනාප ගණන් කිරීම සිදු කෙරේ.

ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම

117. 1988 අංක 35 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 15 සහ 16 වගන්ති සමඟ කියැවිය යුතු 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 57 සිට 62 දක්වා වූ වගන්ති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ප්‍රතිඵල වගුගත කිරීම සම්බන්ධ නීතිමය තත්ත්වය පැහැදිලි කෙරේ. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 57 වන වගන්තියට අනුව ප්‍රතිඵල ප්‍රකාශයට පත්කෙරෙනු ලබන වේලාව සහ ස්ථානය පිළිබඳ දැන්වීමක් තේරීම්භාර නිලධාරී විසින් පක්ෂවල ලේකම්වරුන්ට හෝ බලයලත් නියෝජිතයන්ට හා ස්වාධීන කණ්ඩායම් නායකයන්ට යැවිය යුතු වේ.

118. පාර්ලිමේන්තු මැතිවරණ, පනතේ 58 වන වගන්තියට අනුව ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමේ කටයුතු ඇරඹීමට පෙර පක්ෂ ලේකම්/ බලයලත් නියෝජිත විසින් සහ ස්වාධීන කණ්ඩායම් නායක විසින් නියෝජිතයන් දෙදෙනකු මේ සඳහා පත් කළ හැකිය. කෙසේ වෙතත් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට අදාළව මැතිවරණ මහලේකම් කාර්යාලයේදී පැවති පක්ෂ ලේකම්/ නිත්‍ය නියෝජිත රැස්වීම්වලදී ලද එකඟතාවය පරිදි ප්‍රතිඵල වගුගත කිරීමේ ස්ථානයට පක්ෂ ලේකම්ට තවත් විශේෂ නියෝජිතයකු පත් කිරීමට අවසර ලබා දෙන ලද අතර මැතිවරණයේදී මන්ත්‍රී ආසන දිනා ගන්නා පක්ෂ/ කණ්ඩායම්වල අපේක්ෂකයන්ට ප්‍රතිඵල වගුගත කිරීමේ ස්ථානයට පැමිණ සිටීමට අවසරපත් ලබා දෙන ලෙස තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. මීට අමතරව පරිශ්‍ර සම්බන්ධීකරණ මධ්‍යස්ථාන සඳහා පරිගණකයක්ද සහිතව අදාළ පරිශ්‍රයේ ගණන් කිරීමේ ශාලාවලින් තම පක්ෂයේ නියෝජිතයන් විසින් රැගෙනවිත් භාර දෙන ලද ප්‍රතිඵල ලේඛන අනුව ප්‍රතිඵල සාරාංශ කිරීමේ කටයුතු සඳහා තවත් නියෝජිතයන් දෙදෙනෙකු පත් කිරීමට පක්ෂ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායම් නායකයාට බලය දෙන ලද අතර, ඒ සඳහා පක්ෂ/ කණ්ඩායම්වලට වෙන වෙනම ස්ථානද වෙන් කර දෙන ලදී.

119. දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිඵල වගුගත කිරීමේ සහ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ ස්ථානය තෝරා ගැනීමේදී සියලුම ගණන් කිරීමේ ශාලාවලට පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක් වීම, ගමනාගමන පහසුකම්, විදුලි ආලෝකය සැපයීම ආරක්ෂක විධිවිධාන සැලසීම, දුරකථන ෆැක්ස් පහසුකම් සැලසීම යන කරුණු මෙන්ම තේරීම්භාර නිලධාරීන්ට සියලු කටයුතු නිරන්තර අධීක්ෂණයට ලක්කළ හැකි ස්ථානයක් තෝරා ගැනීමට තේරීම්භාර නිලධාරීට උපදෙස් දෙන ලදී. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලය මේ සඳහා තෝරා ගන්නේ නම් කච්චේරියේ රැස්වීම් ශාලාව යොදාගත යුතු බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් බැහැරවූ ස්ථානයක් තෝරා ගන්නා විට ඉහත කී පහසුකම් ගැන අවධානය යොමු කර එම ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටි පරිශ්‍රයෙන් ස්ථානයක් තෝරා ගන්නා ලෙසත් දන්වන ලදී. තවද ප්‍රතිඵල වගුගත කිරීමේ ස්ථානය සකස් කර ඇති ආකාරය සම්බන්ධයෙන් පසුගිය ඡන්ද විමසීම්වලට අදාළව දේශපාලන පක්ෂ/ කණ්ඩායම් වලින් ලැබුණු පැමිණිලි ගැන අවධානය යොමු කොට ප්‍රතිඵල අතින් සැකසීම හා පරිගණකයෙන් සැකසීමට අදාළ සියලු කටයුතු නියෝජිතයන්ට හා අපේක්ෂකයන්ට පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි වන පරිදි ප්‍රතිඵල වගුගත කිරීමේ ශාලා පිළියෙල කළ හැකි ආකාරය සම්බන්ධයෙන් ලිඛිත උපදෙස් තේරීම්භාර නිලධාරීන් වෙත දෙන ලදී. ඒ අනුව ප්‍රතිඵල අතින් හා පරිගණකයෙන් සැකසෙන මේස වටා පක්ෂ/ කණ්ඩායම්වල නියෝජිතයන්ට ගමන් පහසුව සැලසෙන පරිදි ශාලාව සකස් කිරීමට හැකි සෑම උත්සාහයක්ම තේරීම්භාර නිලධාරීන් විසින් ගන්නා ලදී.

120. ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශයට අදාළව සිදුකෙරෙන කාර්යයන් අතර ගණන් කිරීමේ ශාලාවලින් ලැබෙන ප්‍රතිඵල ලේඛන භාරගැනීම එක් එක් පක්ෂය /ස්වාධීන කණ්ඩායමට ලබා ඇති ඡන්ද සංඛ්‍යාව නිශ්චය කිරීම, එක් එක් පක්ෂය / ස්වාධීන කණ්ඩායමට ලැබී ඇති ඡන්ද සංඛ්‍යාවට සමානුපාතිකව හිමිවන මන්ත්‍රීධුර සංඛ්‍යාව තීරණය කිරීම හා එක් එක් පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම යටතේ තරග කරන ලද අපේක්ෂකයන් විසින් ලබා ඇති මනාප සංඛ්‍යාව ගණන් බැලීම සිදු කෙරේ. තේරීම්භාර නිලධාරී විසින් සාමාන්‍ය ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන, තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සහ අදාළ වන්නේ නම් වෙනත් ඡන්ද පොළකදී ඡන්දය දෙන ලද ඡන්ද දායකයන්ගේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන ආදී සියලුම මධ්‍යස්ථානවල ඡන්ද ගණන් කිරීම භාර නිලධාරීන් විසින් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 53(7) වගන්තිය යටතේ සකස් කරනු ලබන ලිඛිත ප්‍රකාශ ප්‍රතිඵල මධ්‍යස්ථානයට ලැබුණු පසුව අවසන් ප්‍රතිඵලය ගණනය කිරීම සිදුකරනු ලැබේ. ගණන් කිරීමේ ශාලාවලින් ප්‍රතිඵල ලේඛන තේරීම්භාර නිලධාරී වෙත ලැබුණු පසුව ඒවා පරීක්ෂා කිරීම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් විසින් සිදු කර නිරවද්‍යතාව සහතික කිරීමෙන් පසුව එහි ඡායාපිටපත් ගෙන තේරීම්භාර නිලධාරීගේ සහතිකය ද ලබා ගැනීමෙන් පසුව මැතිවරණ කොමසාරිස්වරයා වෙත ෆැක්ස් මඟින් යොමු කරන ලද අතර, මුල් පිටපත ප්‍රතිඵල අතින් සකස් කිරීමේ අංශයට සහ ඡායාපිටපතක් පරිගණකයෙන් ප්‍රතිඵල සැකසීමේ අංශයටත් භාර දීම සිදු කෙරෙන අතර, මැතිවරණ කොමසාරිස් වෙත යවන ලද ෆැක්ස් වාර්තාව ලද පසුව තේරීම්භාර නිලධාරී දුරකථනයෙන් විමසා ෆැක්ස් සටහනේ සංඛ්‍යා නිවැරදි බවට තහවුරු කර ගැනීමෙන් පසුව මැතිවරණ මහලේකම් කාර්යාලයේ ද අතින් හා පරිගණක භාවිතයෙන් ප්‍රතිඵල සකස් කිරීම සිදු කෙරිණි.

121. ඉහත සඳහන් කළ ආකාරයෙන් දිස්ත්‍රික් මට්ටමේදී, ඡන්ද ප්‍රදේශ මට්ටමින්, මැතිවරණ කොට්ඨාසයේ තැපැල් ඡන්ද ප්‍රතිඵලය ලෙස හා මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් එක් එක් පක්ෂ/ කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව හා ඒ අනුව ඒ ඒ පක්ෂයට/ කණ්ඩායමට හිමි විය යුතු මන්ත්‍රීධුර සංඛ්‍යාව ද මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරී විසින් ගණනය කරන ලදී. ඡන්ද ප්‍රදේශයට අදාළ සියලුම ගණන් කිරීමේ ශාලාවලින් ප්‍රතිඵල ලේඛන ලද පසු එම ඡන්ද ප්‍රදේශයෙන් ඒ ඒ පක්ෂ/ කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කරයි. මෙහිදී අතින් සකස් කිරීමේ අංශයෙන් ලැබෙන ප්‍රතිඵලය පරිගණක අංශයෙන් සකස් කෙරුණු ප්‍රතිඵලය හා සසඳා නිවැරදි නම් පමණක් එම ප්‍රතිඵලය මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත ෆැක්ස් කිරීම හා දුරකථනයෙන් දැනුම් දීම සිදු කරන ලදී. ඒ ආකාරයෙන් මැතිවරණ කොමසාරිස්වරයා වෙත දිස්ත්‍රික්කයෙන් ලැබුණු ඡන්ද ප්‍රදේශ මට්ටමේ ප්‍රතිඵලය මැතිවරණ මහලේකම් කාර්යාලයේ අතින් හා පරිගණකයෙන් වගුගත කරන ලද ප්‍රතිඵලයට සමාන ද යන්න පරීක්ෂා කර බලා සමාන නම් නිවැරදි බවට තේරීම්භාර නිලධාරී වෙත දැනුම් දුන් අතර, ඒ සමඟ මාධ්‍ය මඟින් ප්‍රචාරය කිරීම ද සිදු කෙරිණි. ඒ ආකාරයෙන් දිස්ත්‍රික්කයේ සියලුම ඡන්ද ප්‍රදේශ හා තැපැල් ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශ කිරීමෙන් පසුව සියලුම ඡන්ද ප්‍රදේශවලින් හා දිස්ත්‍රික් තැපැල් ඡන්ද වලින් ඒ ඒ පක්ෂය/ ස්වාධීන කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව ගණනය කර ඒ තුළින් ඒ ඒ පක්ෂය/ ස්වාධීන කණ්ඩායමට හිමි මන්ත්‍රීධුර සංඛ්‍යාව ගණනය කොට මැතිවරණ කොමසාරිස්වරයා වෙත තේරීම්භාර නිලධාරී විසින් එවනු ලැබේ. එම ප්‍රතිඵලය මැතිවරණ මහලේකම් කාර්යාලයේ වගුගත කරන ලද ප්‍රතිඵලයට සමාන නම් දිස්ත්‍රික් මට්ටමෙන් එක් එක් පක්ෂයට/ ස්වාධීන කණ්ඩායමට හිමි මන්ත්‍රීධුර සංඛ්‍යාව ද දැක්වෙන ප්‍රතිඵලය ද මාධ්‍ය වෙත නිකුත් කිරීමට පියවර ගන්නා ලදී. මෙම ප්‍රතිඵල මැතිවරණ මහලේකම් කාර්යාලයේදී නැවත වගුගත කොට පරීක්ෂා කිරීම හා මාධ්‍ය ආයතන වෙත නිකුත් කිරීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් කොළඹ විශ්ව විද්‍යාලයෙහි පරිගණක පාසලෙහි සහාය ඇතුව සිදු කරන ලදී.

122. මෙම පාර්ලිමේන්තු මැතිවරණයේදී එක් එක් මැතිවරණ කොට්ඨාසය යටතේ මන්ත්‍රීවරුන් තෝරාපත්කර ගැනීමට හිමිකම් ලද පිළිගත් දේශපාලන පක්ෂ ලබාගත් ඡන්ද සංඛ්‍යාව, වලංගු ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතය සහ හිමි වූ මන්ත්‍රීධුර සංඛ්‍යාවත්, මන්ත්‍රීධුර හිමි නොවූ සෙසු පිළිගත්

දේශපාලන පක්ෂ සියල්ල හා ස්වාධීන කණ්ඩායම් සියල්ල ලබාගත් ඡන්ද සංඛ්‍යාව හා එහි ප්‍රතිශතය පිළිබඳ විස්තර අංක XI දරන සටහනෙහි දක්වා ඇත. එහි සාරාංශයක් අංක XII සටහනෙහි දක්වා ඇත.

123. එක් එක් පක්ෂයට/ ස්වාධීන කණ්ඩායමට හිමි මන්ත්‍රීධුර සංඛ්‍යාව ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව ඒ ඒ පක්ෂය/ ස්වාධීන කණ්ඩායම වෙනුවෙන් තරග කරන ලද අපේක්ෂකයන්ගෙන් කුමන අපේක්ෂකයන් මන්ත්‍රීධුර සඳහා සුදුසුකම් ලබන්නේ ද යන්න එක් එක් අපේක්ෂකයා වෙත දෙන ලද මනාප ඡන්ද ප්‍රමාණය එකතු කොට තීරණය කළ යුතුව ඇත. ඒ අනුව මන්ත්‍රීධුර හිමි පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් වෙත ඡන්ද දායකයා විසින් ලබා දී ඇති මනාප ඒ සඳහා ගණන් බැලිය යුතුය. එක් ඡන්ද දායකයකුට තමා කැමති පක්ෂයට ඡන්දය සලකුණු කිරීමට හා එම පක්ෂයේ අපේක්ෂකයන් තිදෙනෙකුට නොවැඩි ගණනකට ස්වකීය මනාපය ප්‍රකාශ කිරීමට අවස්ථාව පාර්ලිමේන්තු මැතිවරණ පනතට අනුව ඇත. ඒ අනුව ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී විසින් ඒ ඒ පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව තේරීම්භාර නිලධාරී වෙත දැන්වීමෙන් පසුව වැඩියෙන්ම ඡන්ද ලබා ගත් පක්ෂයෙන් පටන්ගෙන ඒ ඒ පක්ෂයේ අපේක්ෂකයන් ලබාගත් මනාප සංඛ්‍යාව ගණනය කර මනාප ප්‍රතිඵලය ද තේරීම්භාර නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු විය. ඒ ආකාරයෙන් සියලුම ගණන් කිරීමේ ශාලාවලින් එක් එක් පක්ෂය/ ස්වාධීන කණ්ඩායම් තරග කරන ලද අපේක්ෂකයන් ලබාගත් මනාප ඡන්ද සංඛ්‍යාවට අදාළ විස්තර තේරීම්භාර නිලධාරී වෙත ලැබුණු පසු ඒවා ඡන්ද ප්‍රදේශ මට්ටමෙන් හා දිස්ත්‍රික් මට්ටමෙන් සකස්කොට ඒ ඒ පක්ෂයට හිමි මන්ත්‍රීධුර සංඛ්‍යාවට අනුව ඒ ඒ පක්ෂය/ ස්වාධීන කණ්ඩායමෙන් තරග කොට වැඩිම මනාප සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයන් අතරින් තේරීපත්වන අපේක්ෂකයන්ගේ නම් තේරීම්භාර නිලධාරී විසින් ප්‍රකාශයට පත් කිරීම සිදුකෙරේ.

124. එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ සෑම ඡන්ද කොට්ඨාසයකම කිසිදු බාධාවකින් තොරව ඡන්ද විමසීම පැවැත්වීම සිදු කළේ නම් සහ තරග කරන ලද සියලුම පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වලට අදාළ ඡන්ද සංඛ්‍යාවන් සහ එම පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් වලින් තරග කරන ලද අපේක්ෂකයන් ලබා ගත් මනාප සංඛ්‍යාවන් පිළිබඳ අවසන් ප්‍රතිඵල ලේඛන සකස් කළේ නම් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ දෙවන උපලේඛනයේ "ඕ" ආකෘතියට සාරානුකූල වාර්තාවක් තේරීම්භාර නිලධාරී විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත සැපයිය යුතු අතර, එසේ තෝරාපත් කර ගන්නා ලද මන්ත්‍රීවරයන්ගේ නම් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළකිරීමෙන් ප්‍රසිද්ධ කළයුතු විය. ඒ අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයට අනුව 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62වන වගන්තිය අනුව තෝරාපත් කරගනු ලැබූ මන්ත්‍රීවරයන්ගේ විස්තර අංක 1928/3 හා 2015.08.19 දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලදී. දහවන උපලේඛනයේ ලෙස අදාළ ගැසට් නිවේදනය අමුණා ඇත.

125. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරාපත් කර ගැනීමේ මහ මැතිවරණයකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වන ව්‍යවස්ථාවේ සඳහන් මන්ත්‍රීවරයන් එකසිය අනූහය දෙනා (196) තෝරාපත්කර ගනු ලැබූ බව ප්‍රකාශ කිරීමෙන් පසුව ඉතිරි මන්ත්‍රීධුර විසිනවය (29) ඒ මැතිවරණයට තරග කරන ලද එක් එක් දේශපාලන පක්ෂයට සහ ස්වාධීන කණ්ඩායමට මහ මැතිවරණයේදී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාව ඒ මහ මැතිවරණයේදී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාවට සමානුපාතිකව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ වන ව්‍යවස්ථාව පරිදි මැතිවරණ කොමසාරිස්වරයා විසින් බෙදා වෙන් කළ යුතුය. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර හිමි වූ පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්වල විස්තර ලැබුණු මන්ත්‍රීධුර සංඛ්‍යාව අංක XIII දරන සටහනෙන් දක්වා ඇත. තෝරාපත් කර ගන්නා ලද මන්ත්‍රීවරයන්ට අදාළ විස්තර අංක 1928/25 දරන 2015.08.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය (එකොළොස්වන උපලේඛනය හා අංක 1929/4 දරන 2015.05.24 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය දොළොස්වන උපලේඛනය) මඟින් පළ කිරීමට ද කටයුතු කරන ලදී.

ඡන්ද විමසීම වෙනුවෙන් දරන ලද වියදම

126. දිවයින පුරා පිහිටි මැතිවරණ කොට්ඨාස 22ක (පරිපාලන දිස්ත්‍රික්ක 25ක) පවත්වන ලද මෙම පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්ද හිමියන් 15,044,490 දෙනෙකු වෙනුවෙන් අදාළ පහසුකම් සලසා ඡන්ද ගණන් කිරීම සිදුකොට ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන ලදී. ඒ වෙනුවෙන් වැය වූ මුළු මුදල රුපියල් මිලියන 2,975 කි. ඒ අනුව මෙම පාර්ලිමේන්තු මැතිවරණයේ දී ලියාපදිංචි එක් ඡන්ද දායකයකු වෙනුවෙන් දරන ලද වියදම රුපියල් 197.77 කි.

127. මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේ දී පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම රුපියල් මිලියන 976 කි. මෙම පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් වැය කළ මුළු මුදල වූ රුපියල් මිලියන 2,975 න් රුපියල් මිලියන 1,999 හෙවත් ප්‍රතිශතයක් ලෙස 67.19% ක් ඍජුවම මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් දරන ලදී.

128. මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේ ඡන්ද විමසීම් කටයුතු වෙනුවෙන් ඉටු කරනු ලබන සේවා සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලද රජයේ දෙපාර්තමේන්තු පහක් විසින් වියදම් දරන ලද අතර, ඒවානම් පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව, මුද්‍රණ දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වේ. පාර්ලිමේන්තු මැතිවරණය සඳහා වැය වූ මුදලින් එම ආයතන විසින් වැය කරන ලද මුදල් ප්‍රතිශතයක් ලෙස පහත දක්වා ඇත.

දෙපාර්තමේන්තුව	වැය කළ මුදල රු.	ප්‍රතිශතය
පොලිස් දෙපාර්තමේන්තුව	438,381,416.92	14.73%
තැපැල් දෙපාර්තමේන්තුව	359,964,000.00	12.09%
මුද්‍රණ දෙපාර්තමේන්තුව	177,234,422.42	5.95%
පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	556,550.00	0.02%
කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	507,110.00	0.02%
එකතුව	**976,643,449.34**	**32.81%**

129. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, මෙම මැතිවරණය වෙනුවෙන් රුපියල් 177,234,422.42 ක් වැය කර ඇත. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ එම මුළු වියදමෙන් රුපියල් 82,817,848.08 හෙවත් 46.73% ක් වැය වී ඇත්තේ ඡන්ද පත්‍රිකා සහ ද්විත්ව ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා ය. පෞද්ගලික අංශයෙන් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා මුද්‍රණය කර ගැනීම සඳහා රුපියල් 22,683,376.70ක් මැතිවරණ දෙපාර්තමේන්තුව වැය කර ඇත.

130. මෙම පාර්ලිමේන්තු මැතිවරණයේදී පොලිස් දෙපාර්තමේන්තුව දරන ලද වියදම රුපියල් 438,381,416.92 කි. ඉන් රුපියල් 31,372,850.00 ක් අදාළ වූයේ විශේෂ කාර්ය බලකාය, රාජ්‍ය බුද්ධි සේවය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට ය. පොලිස් දෙපාර්තමේන්තුව වෙත වෙන්කළ ප්‍රතිපාදනවලින් වියදම් වූ මුදලින් රුපියල් මිලියන 147 ක් පොලිස්, විශේෂ බලකා හා බුද්ධි අංශ නිලධාරීන්ගේ සංයුක්ත දීමනා වෙනුවෙන් ද, මැතිවරණ කොමසාරිස්වරයාගේ අවසරය ඇතිව මැතිවරණ රාජකාරි සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට අවශ්‍ය අමතර වාහන කුලී පදනම යටතේ ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 132 ක් ද, රුපියල් මිලියන 60 ක් පොලිස් දෙපාර්තමේන්තුවේ වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් ද වැය කර තිබුණි. පොලිස් දෙපාර්තමේන්තුව විසින් නීති විරෝධී දැන්වීම් ඉවත් කිරීම සඳහා රුපියල් මිලියන 55 ක් හා පොලිස් නිලධාරීන්ගේ සුභ සාධන කටයුතු සඳහා රුපියල් මිලියන 25 ක් වැය කර ඇත.

131. ඡන්ද විමසීම් අවස්ථාවලදී තැපැල් දෙපාර්තමේන්තුව මගින් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදා හැරීම, තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු කවර සහතික කිරීමේ නිලධාරීන්ට බෙදා හැරීම හා ආපසු භාරදීම්භාර නිලධාරීන්ට භාර දීම, මැතිවරණ රාජකාරිවල නිරත නිලධාරීන්ගේ පත්වීම් ලිපි බෙදා හැරීම ආදී ඉටු කරවා ගතයුතු විශේෂ රාජකාරී කිහිපයක් ද ඇත. ඒවා වෙනුවෙන් එම දෙපාර්තමේන්තුවට මැතිවරණ කොමසාරිස්වරයා විසින් මුදල් ප්‍රතිපාදන වෙන්කර දෙනු ලැබේ. ඒ ආකාරයට මෙම මැතිවරණය වෙනුවෙන් රුපියල් 359,964,000.00 ක් තැපැල් දෙපාර්තමේන්තුවට

වෙන්කර දී තිබුණි. ඉන් රුපියල් මිලියන 229 ක් සේවක අතිකාල වෙනුවෙන් ද, මුද්දර හා තැපැල් ගාස්තු වශයෙන් රුපියල් මිලියන 104 ක් ද, දුරකථන හා වෙනත් වියදම් සඳහා රුපියල් මිලියන 24 ක් ද, රුපියල් මිලියන 2 ක් ලිපිද්‍රව්‍ය වෙනුවෙන් ද, ඉන්ධන වෙනුවෙන් රුපියල් මිලියනයකට ආසන්න මුදලක් ද ප්‍රධාන වියදම් වශයෙන් දරා ඇත.

132. මෙම මැතිවරණයේදී මුළු වියදම, වියදමේ ස්වභාවය අනුව පහත පරිදි වර්ගීකරණය කර දැක්විය හැකිය.

වියදමේ ස්වභාවය	**වැය කළ මුදල රු.**	**ප්‍රතිශතය**
කාර්ය මණ්ඩල වැටුප්, වියදම් හා අතිකාල	1,515,934,919.48	50.95%
වාහන සඳහා කුලී	212,257,231.27	7.13%
ලිපි ද්‍රව්‍ය/කාර්යාල භාණ්ඩ වැනි වියදම්	140,426,251.69	4.72%
ඉන්ධන	146,519,705.22	4.92%
ඉදිකිරීම් හා අළුත්වැඩියා	68,154,804.21	2.29%
සුභසාධන වියදම්	187,058,709.25	6.30%
මුද්‍රණ වියදම්	200,885,124.87	6.75%
නීති විරෝධී ප්‍රදර්ශන පුවරු ඉවත් කිරීම	54,756,287.51	1.84%
මුද්දර හා තැපැල් ගාස්තු	104,244,862.30	3.50%
විදේශ නිරීක්ෂණ සඳහා පහසුකම් සැලසීම	16,467,339.50	0.55%
විදුලිය	120,480,655.93	4.05%
ජලය, දුරකථන ඇතුළු සේවා හා වෙනත් වියදම්	208,212,731.04	7%
එකතුව	**2,975,398,622.27**	**100.00%**

133. මේ අනුව පාර්ලිමේන්තු මැතිවරණය සඳහා වියදම් වූ මුළු මුදලින් 50.95% ක ප්‍රමාණයක් වූ වැඩිම ප්‍රතිශතයක් කාර්ය මණ්ඩල ගෙවීම් සඳහා දැරීමට සිදුවී ඇති බව පෙන්වා දිය හැකිය. ඊළඟ වැඩිම ප්‍රතිශතය පිළිවෙළින් වාහන කුලී සඳහා 7.13% ක් ද, වෙනත් සේවා සඳහා 7% ක් ද, මුද්‍රණ කටයුතුවලට 6.75% ක් ද, සුබසාධන කටයුතු සඳහා 6.30% ක් ද, ඉන්ධන සඳහා 4.92% ක් ද, ලිපි ද්‍රව්‍ය/ කාර්යාල භාණ්ඩ සඳහා 4.72% ක් ද, විදුලිය සඳහා 4.05% ක් ද, මුද්දර හා තැපැල් ගාස්තු සඳහා 3.5% ක් ද වේ.

134. සේවා හා වෙනත් වියදම් යටතේ දරා ඇති මුළු වියදම රුපියල් මිලියන 208 ක් හෙවත් වියදමින් 7%ක් තුළ ඡන්ද පොළ කටයුතු සඳහා සේවා සැපයීම වෙනුවෙන් ග්‍රාම නිලධාරීන්ට ගෙවූ රුපියල් මිලියන 104 ක් ද, ජලය සැපයීම සඳහා

රුපියල් මිලියන 14 ක් ද, සන්නිවේදන කටයුතු සඳහා රුපියල් මිලියන 11 ක් ද ඇතුළත්ව ඇත.

135. පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ සම්පූර්ණ වියදම් වාර්තාව අංක XIV දරන සටහනෙහි දක්වා ඇත.

නිරීක්ෂණ හා නිර්දේශ

මැතිවරණ කාර්ය මණ්ඩලය

136. ඡන්ද විමසීමේ මූලික කටයුතු සංවිධානය, ඡන්ද විමසීම, ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශය යන සියලු කාර්යයන් ඉටු කරනුයේ රාජ්‍ය නිලධරයන් හා සේවකයන් විසිනි. එබැවින් ඡන්ද විමසීමක් ආරම්භයේදී සිදුකරන රාජ්‍ය නිලධාරී සංගණනයේදී තම ආයතනයේ සේවයේ නියුතු සියලුම අයගේ තොරතුරු මැතිවරණ කොමසාරිස්වරයා වෙත/ තේරීම්භාර නිලධාරී වෙත සැපයීම ඒ ඒ ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් වේ. එහෙත් පසුගිය ඡන්ද විමසිම්වලදී දැකගත හැකිවූයේ බොහෝවිට ආයතන ප්‍රධානීන් විසින් මැතිවරණ රාජකාරි සඳහා සහභාගී වීමට කැමති අය කවුරුන්දැයි යන්න තම කාර්යය මණ්ඩලයෙන් විමසා එම නිලධාරීන්ගේ/ සේවකයන්ගේ තොරතුරු මැතිවරණ කොමසාරිස්/ තේරීම්භාර නිලධාරී වෙත ලබා දීමයි. මේ නිසා ඡන්ද විමසීම් රාජකාරි සඳහා සුදුසුකම් හා පලපුරුද්ද සහිත නිලධාරීන්ගේ අඩුවීමේ ගැටලුවට මුහුණ දීමට සියලුම තේරීම්භාර නිලධාරීන්ට සිදුවීම වැළැක්විය නොහැකි විය. මෙම තත්ත්වය අවම කරගැනීම සඳහා තම ආයතනය තුළ සේවයේ නියුතු සියලු නිලධාරින්ට අදාළ විස්තර මැතිවරණ කොමසාරිස් වෙත ලබා දිය යුතු බවට ජනාධිපති ලේකම්වරයා මඟින් ආයතන ප්‍රධානීන් වෙත දන්වා යැවීමටද කටයුතු කරන ලදී.

137. පසුගිය ඡන්ද විමසීම්වලදී මෙම තත්ත්වය පොදුවේ බලපාන ලද කරුණක් බැවින් ඊට මුහුණදීමේ පියවරක් ලෙස ඡන්ද විමසීමක් ඉලක්ක කර රජයේ නිලධාරීන්ගේ තොරතුරු කැඳවීම වෙනුවට රජයේ නිලධාරීන් පිළිබඳව දත්ත එක්රැස් කොට තබා ගැනීම හා නිරන්තරව යාවත්කාලීන කළ හැකි වන ආකාරයේ පරිගණක වැඩසටහනක් කෙරෙහි අවධානය යොමුකිරීමට කාලය එළඹ ඇත. එවැනි ක්‍රමවේදයක් ඡන්ද විමසීම් මූලික කටයුතු පහසු කරලීමට ද රුකුලක් වේ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උප ව්‍යවස්ථාව අනුව මැතිවරණ පැවැත්වීමට අදාළ කටයුතු සාර්ථක කර ගැනීමට සියලුම රජයේ සේවකයන් මැතිවරණ කොමිෂන් සභාව වෙත සහාය දිය යුතු බවට වන විධිවිධාන සහ මෙලෙස කටයුතු නොකරන රාජ්‍ය නිලධාරීන් සඳහා රුපියල් ලක්ෂයක දඩයක් සහ වසර තුනක බන්ධනාගාරගත කිරීමක් කළ හැකි බවට වන නෛතික ප්‍රතිපාදන මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ඉදිරියේදී මනා පිටුවහලක් වනු ඇත. කෙසේ වෙතත් එවැනි යහපත් වාතාවරණයක් ඇතිවිය හැක්කේ එවැනි නීති ඒ ආකාරයෙන් බලාත්මක කිරීමට මැතිවරණ කොමිසම දරන උත්සාහය මතය. රටෙහි ප්‍රජාතන්ත්‍රවාදය පවත්වාගෙන යාම සඳහා නෛතික බලපෑම් නොකර රාජ්‍ය සේවකයන්ගේ දායකත්වය ලැබීම නිරතුරු අගය කරනු ඇත.

නාමයෝජනා

138. පාර්ලිමේන්තු මැතිවරණය සඳහා වූ නාමයෝජනා භාර ගැනීම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ප්‍රකාශය ගැසට් පත්‍රයේ පළකළ දිනයෙන් පසුව එළඹෙන දහ වන දිනයෙන් ආරම්භව එම ප්‍රකාශනයේ දිනයට පසුව එළඹෙන දහහත් වන දින මධ්‍යාහ්න 12.00ට අවසන් වේ. මේ අනුව නාමයෝජනා භාරගැනීම සඳහා දින හතහමාරක කාලයක් ඇත. එහෙත් සෙනසුරාදා ඉරිදා දින ද යෙදෙන බැවින් මෙම කාලය දින පහහමාරකට පමණ සීමා විය හැකිය. පසුගිය ඡන්ද විමසීම් ගැන අධ්‍යයනය කරන විට නාමයෝජනා භාරගැනීම සඳහා මෙලෙස සතියක කාලයක් වෙන් කර තිබුණ ද බොහෝ පක්ෂ/ කණ්ඩායම් සිය නාමයෝජනා පත්‍ර භාරදෙනුයේ අවසන් දින දෙක තුන තුළ බව පෙනී යයි. ඒ නිසාම නාමයෝජනා සම්බන්ධ පසු කටයුතු නිසි ලෙස ඉටු කිරීමටද තේරීම්භාර නිලධාරීන්ට ගැටලු මතු වේ. මෙම පාර්ලිමේන්තු මැතිවරණය ගත් විට නාමයෝජනා කාලසීමාව තුළ සියලුම පක්ෂ/ කණ්ඩායම් වෙතින් ඉදිරිපත් වූ නාමයෝජනා පත්‍ර ප්‍රමාණය 537ක් වූ අතර, එයින් වැඩි සංඛ්‍යාවක් අවසන් දින දෙකහමාර තුළ ඉදිරිපත්ව ඇත. නාමයෝජනා භාර ගැනීමේ කාල

වකවානු තීරණය වූ පසු තේරීම්භාර නිලධාරී හා දිස්ත්‍රික් මට්ටමේ ප්‍රධාන සහකාර තේරීම්භාර නිලධාරී ලෙස මැතිවරණ කටයුතු සංවිධානය කරනු ලබන නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයා එම ස්ථානයේ කාර්යාල වේලාව තුළ රැඳී සිටීම අනිවාර්යය කරමින් මැතිවරණ කොමසාරිස්වරයා උපදෙස් නිකුත් කරනු ලබයි. පාර්ලිමේන්තු මැතිවරණයේ සියලු කටයුතු සඳහා සති හතක් වැනි කාලයක් වෙන්ව තිබියදී එයින් සතියක්ම මේ වෙනුවෙන් කැප කිරීම ඇත්තෙන්ම මැතිවරණ සංවිධාන කටයුතුවලට ද බාධාවකි. විශේෂයෙන්ම ඡන්ද ක්‍රමය තුළ පවතින මනාප ක්‍රමය හා බලයේ සිටින ආණ්ඩුවෙන් සිදුකෙරෙන බලපෑම් ද සැලකිල්ලට ගෙන සැබෑ ලෙස තරග කරනු ලබන පක්ෂ කිහිපයක් වෙනත් පක්ෂවල හෝ ස්වාධීන කණ්ඩායම්වල සහාය ලබා ගනිමින් ඡන්දපොළ නියෝජිතයන්, ගණන් කිරීමේ නියෝජිතයන් වැඩි ප්‍රමාණයක් පත්කර ගැනීම සඳහා එම පක්ෂ/ කණ්ඩායම් තරගයට එක් කරනු ලැබේ. මේ නිසාම මැතිවරණය වෙනුවෙන් දැරීමට සිදුවන වියදම නොඑසේනම් මහජන මුදල් විශාල ප්‍රමාණයක් අනවශ්‍ය ආකාරයෙන් වියදම් කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුවට සිදුව ඇත.

139. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 16 වන වගන්තිය අනුව පිළිගත් දේශපාලන පක්ෂ සඳහා ඇප තැන්පත් කිරීම අවශ්‍ය නොවන අතර, ස්වාධීන කණ්ඩායම් සඳහා එක් අපේක්ෂකයෙකුට රු. 2,000.00 බැගින් ඇප මුදල් තැන්පත් කළ යුතු වේ. මෙම මුදල තීරණය කර ඇත්තේ 1981 වර්ෂයේදීය. මෙම තත්ත්වය යම්තාක් දුරකට හෝ සමනය කර ගැනීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් තරග කරන්නේ නම් ඒ සෑම තරඟ කරනු ලබන පක්ෂයක/ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයන් ඇප තැන්පතු කළ යුතු බවට හා එසේ තබනු ලබන ඇපය දැනට අයකරනු ලබන ප්‍රමාණයට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිකිරීමට පියවර ගත යුතුය. ඒ සමඟ ම නාමයෝජනා භාරගැනීමේ කාලසීමාව දින තුනකට පමණ සීමා කිරීම හා නාමයෝජනා සම්බන්ධ තීරණ ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම සඳහා වෙනම වූ එක් දිනක් හෝ දින භාගයක් පමණ ප්‍රකාශයට පත් කිරීමත් සුදුසුය. එසේ නොවන විට නාමයෝජනා අවසන් දිනය මධ්‍යාහ්න 12.00 දක්වා වැඩි නාමයෝජනා භාරගෙන එදිනට මධ්‍යාහ්න 12.00 සිට තව පැය 1 ½ක පමණ කාලයක් විරෝධතා ඉදිරිපත් කිරීමටද අවස්ථාව ලබා දී විරෝධතා පරීක්ෂා කර අවශ්‍යතාව පරිදි මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා ගනිමින් ඒ සඳහා තීරණ ලබා දී එතෙක් ලැබුණු නාමයෝජනා පරීක්ෂා කර බලා ඒ අවස්ථාවේදීම නාමයෝජනා සම්බන්ධයෙන් තීරණ ලබා දීමේදී තේරීම්භාර නිලධාරීන් දැඩි අපහසුතා වලට ලක්වීම නොවැළැක්විය හැකිවනු ඇත. මෙම කාර්යබහුලත්වය තුළ යම් යම් අතපසුවීම් සිදුවීමට ඇති හැකියාවද බැහැරකළ නොහැකි අතර එවැනි අවස්ථාවක අඩුතරමින් නීතියේ පිහිට පැතීමට අදාළ සාධාරණය ඉෂ්ට නොවූ පාර්ශවයට ඇති හැකියාව නිසා ඉතාමත් අවිවේකී පරිසරයක් තුළ කටයුතු කළ රජයේ නිලධාරීන් ගැන වැරදි අවබෝධයක් සමාජගත වීමට ඇති හැකියාව ද බැහැර කළ නොහැකිය. එවැනි චෝදනාවක් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීමේ වගකීම පැවරී ඇති මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත එල්ලවීම කිසිසේත්ම සුදුසු නොවේ.

තැපැල් ඡන්ද

140. ඡන්ද විමසීම් දින තමාට වෙන්කරන ලද ඡන්ද පොළ වෙත පෞද්ගලිකව ගොස් ඡන්දය දීමට නොහැකිවන ආකාරයෙන් වූ යම් සේවාවක නිරතව සිටින්නා වූ හෝ මැතිවරණ රාජකාරිවල නිරතවීමට සිදුව ඇති රජයේ සේවකයන්ට තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම හිමිවේ. පාර්ලිමේන්තු මැතිවරණ පනත අනුව මැතිවරණය ප්‍රකාශයට පත් කළ දිනට සතියකට පසුව හා සති දෙකකට පෙර වූ කාල සීමාව තුළ තැපෑලෙන් ඡන්දය දීම සඳහා වූ ඉල්ලීමක් තේරීම් භාර නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුවේ. එහෙත් මෙම නියමය පනතේම සඳහන් පරිදි යම් අපේක්ෂකයකුට ද තැපෑලෙන් ඡන්දය ඉල්ලුම් කළ හැකිය යන්න සමග නොගැළපීමක් ඇතිවේ. හේතුව අපේක්ෂකයකු ද නැද්ද යන්න තීරණය වන්නේ නාමයෝජනා භාරගැනීමේ අවසන් දිනයේ නාමයෝජනා පත්‍රය පිළිගන්නේ ද නැද්ද යන කරුණ මත වේ. එසේ නාමයෝජනා පත්‍රය පිළිගතහොත් පමණක් ඔහු අපේක්ෂකයකු වන අතර, එවිට ඔහුට අවශ්‍ය නම් තැපැල් ඡන්දය ද ඉල්ලුම් කළ හැකිය. එහෙත්

පනතේ නියමයට අනුව ඒ වනවිට තැපැල් ඡන්දය ඉල්ලුම් කිරීමේ කාලය අවසන්ව ඇත. ඒ අනුව පනතේ සඳහන් නුවූව ද දැනට අනුගමනය කරන පරිදි ම තැපැල් ඡන්ද කාලසීමාව නාමයෝජනා අවසන් දිනය දක්වා බවට සංශෝධන සිදුකිරීම වඩාත් උචිතය.

141. තැපැල් ඡන්ද ක්‍රියාවලියේ දී තැපැල් ඡන්ද ඉල්ලුම්පත් භාරගැනීම හා පරීක්ෂාව, තැපැල් ඡන්ද නාමලේඛන සැකසීම, තැපැල් ඡන්ද නිකුත් කිරීම, තැපැල් ඡන්ද සලකුණු කිරීම හා අදාළ පැකැට්ටු භාරගැනීම හා ගණන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ඇතුළු කරුණු ගණනාවක් ඉතා කෙටි කලක් තුළ අවසන් කරගත යුතුව ඇත. විශේෂයෙන් සලකා බලන විට මැතිවරණ සංවිධාන ක්‍රියාවලියේ වැඩි බරක්, වැඩි කාල සීමාවක් තැපැල් ඡන්ද සඳහා යෙදවීමට තේරීම්භාර නිලධාරීන්ට සිදුවීමෙන් එය අනිකුත් සංවිධාන කටයුතුවලට බාධාවක්ව ඇත.

142. පසුගිය ඡන්ද විමසීම් ගැන අවධානය යොමුකළ විට තැපැල් ඡන්ද සඳහා සුදුසුකම් නොලබන එහෙත් අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යනු ලබන රෝහල් කාර්ය මණ්ඩල, වරාය, ගුවන් තොටුපල, අධිවේගී මාර්ග ආදියෙහි සේවය කරන බොහෝ දෙනෙකුට මේ නිසා ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අවස්ථාව අහිමිව ඇත. මැතිවරණ අවස්ථාවක මේ ආකාරයෙන් තැපැල් ඡන්ද අහිමිව ඇති බොහෝ පාර්ශ්වවල ඉල්ලීම්වලට කන්දීමට මැතිවරණ කොමසාරිස්වරයාට මෙන්ම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ට සිදුව ඇත. ඒ සඳහා අනුමැතිය ලබාදීමට මැතිවරණ කොමසාරිස්වරයාට හෝ තේරීම් භාර නිලධරයාට හැකියාවක් නොමැති බව හා ඒ සඳහා පාර්ලිමේන්තුව හරහා අදාළ නීති සංශෝධනය විය යුතු බව පැහැදිලි කරදීමට ද ඔවුන්හට කාලය මිඩංගු කිරීමට සිදුවේ. මේ තත්ත්වය සැලකිල්ලට ගත් මැතිවරණ කොමසාරිස්වරයා අදාළ නීති සංශෝධනය සඳහා පියවර ගන්නා ලෙස ඉල්ලීම් කරනු ලැබූ අතර, මේ සම්බන්ධයෙන් සියලුම දේශපාලන පක්ෂ ලේකම්වරුන් ඇතුළු ව්‍යවස්ථා සම්පාදකයින් දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී.

143. මේ ආකාරයෙන් දැනට ක්‍රියාත්මක තැපැල් ඡන්ද ක්‍රියාවලියේ ඇති සංකීර්ණතාව හේතුවෙන් ඒ සඳහා ගතවන කාලය, කරනු ලබන වියදම මෙන්ම තැපැල් ඡන්ද ක්‍රියාවලියට ඇතුළත් කළ හැකි අත්‍යවශ්‍ය සේවා ඉටුකරන සේවකයන් අතහැර තිබීම යන කරුණු සැලකිල්ලට ගෙන මේ සඳහා සුදුසු විසඳුම් සෙවීම අනිවාර්යයෙන් කළ යුතුව ඇත. මේ සඳහා ඡන්ද විමසීම් දිනට පූර්වයේ නිශ්චිත ස්ථාන හඳුනාගෙන පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීමට (Advanced voting) අවස්ථාව සැලසීම හෝ ඡන්ද විමසීමේ දින වෙනත් ඡන්ද පොලකදී ඡන්දය දීමට පහසුකම් සලස්වා දීම වඩාත් ප්‍රඥාගෝචර වේ. ඒ තුළින් තැපැල් ඡන්ද නිකුත් කිරීම්, සලකුණු කර පැකැට් කර ආපසු තේරීම්භාර නිලධාරී වෙත එවීම වැනි ක්‍රියාමාර්ග ඉවත්කළ හැකිවනු ඇත. දේශපාලන පක්ෂවලට ඡන්ද විමසීම් දිනක ඡන්ද පොළ නියෝජිතයන් පත්කරන ආකාරයෙන්ම පහසුවෙන් තැපැල් ඡන්ද සඳහා වූ ඡන්ද පොළවල කටයුතු නිරීක්ෂණයට නියෝජිතයන් පත්කිරීම ද පහසුවනු ඇත. දැනට සහතික කිරීමේ නිලධාරී කාර්යාලවලට නියෝජිතයන් පත්කිරීමට අවස්ථාව සලසා ඇතත් එම ක්‍රියාවලිය ඉතා සංකීර්ණ බැවින් එය ඉටුනොවන අවස්ථා බහුලය. ඒ ආකාරයෙන්ම තැපැල් ඡන්ද ඉල්ලුම්කරන බොහෝදෙනා එම දිස්ත්‍රික්කවලම මැතිවරණ රාජකාරී සඳහා තෝරාගැනෙන අයවලුන් බැවින් ඡන්ද විමසීම් දින ඡන්ද පොළේදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ඉදිරියේ ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සැලසීම ද ක්‍රියාත්මක කළ හැකිය. ඒ සඳහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත තේරීම්භාර නිලධාරී විසින් නිකුත් කර ඇති පත්වීම් ලිපිය ඉදිරිපත් කිරීම හා තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රමාණවත් බවට නීති සම්පාදනය ප්‍රමාණවත් වේ.

දේශපාලන පක්ෂ හා අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා රජයේ දේපළ භාවිතා කිරීම

144. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ ව්‍යවස්ථාව සංශෝධනය කරමින් හඳුන්වාදෙන ලද 104 ආ (4) (අ) ව්‍යවස්ථාවට අනුව රජයට හෝ රාජ්‍ය සංස්ථාවකට අයත් නිශ්චල හෝ චංචල දේපළක් මැතිවරණයට තරග කරන යම් දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යොදාගැනීම, මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත

කොමිෂන් සභාවේ සභාපති හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මගින් තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට පවරා ඇත. මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන තාක් එම බලතල ක්‍රියාත්මක කිරීමේ බලය මැතිවරණ කොමසාරිස්වරයාට පැවරී ඇතත්, පවතින දේශපාලන වටපිටාව සහ රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාත්මකවීමේ ස්වභාවය මත එම කාර්යය නිසි ලෙස ක්‍රියාවේ යෙදවීම අපහසුව ඇත. ඡන්ද විමසීම් ආරම්භයේදීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් රාජ්‍ය දේපළ අවභාවිතය වැළැක්වීමට අදාළව උපදෙස් ගැසට් නිවේදන මඟින් ජනමාධ්‍ය මඟින් ප්‍රසිද්ධ කිරීමට අමතරව තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ අපේක්ෂකයන් වෙත හා ඒවා ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින ඉහළ රාජ්‍ය නිලධාරීන් වෙත යවමින් ඔවුන් දැනුවත් කළ ද සියල්ලන්ම මේ කෙරෙහි නිසි ලෙස අවධානය යොමු කරන බවක් නොපෙනේ.

145. ඡන්ද විමසීම් කාලසීමාව තුළ මෙම උපදෙස් කඩකරමින් කටයුතු කරන බවට විවිධ සංවිධාන වලින්, අපේක්ෂකයන්ගෙන් හා මහජනතාවගෙන් පැමිණිලි මධ්‍යස්ථාන වෙත බොහෝ පැමිණිලි ලැබුණු අතර, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා හැකිතාක් දුරට ඒවා නතර කිරීමට පියවර ගන්නා ලදී. ලැබුණු පැමිණිලි අතර රජයේ වාහන, ගොඩනැඟිලි මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීම මෙන්ම රාජ්‍ය සේවයට බඳවා ගැනීම හා රාජ්‍ය උත්සව සංවිධානය මඟින් අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා කටයුතු කරන බවට ලැබුණු පැමිණිලි වේ. මේ තත්ත්වය සඳහා දේශපාලන කළමනාකාරීත්වයේ ස්වභාවය ද බලපා ඇත. 1978 ව්‍යවස්ථාවට පෙර ප්‍රබලම අධිකාරිය දැරුවේ පාර්ලිමේන්තුව පමණි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව දේශපාලන සංවිධාන ඡන්ද දායකයා ඉදිරියේ තම ශක්තිය උරගා බැලීම සඳහා යොමු විය යුතු විය. ඒ නිසාම රාජ්‍ය සේවයට හා ආරක්ෂක සේවාවන්ට තම කටයුතු ස්වාධීනව මෙහෙයවීමේ හැකියාව තිබුණි. 1978න් පසුව තත්ත්වය වෙනස් වෙමින් අද වනවිට අධිකාරී බලතල දරන දේශපාලන ව්‍යුහය ප්‍රධාන ස්තර හතරකට ගොඩනැගී ඇත. ඒවා නම් විධායක ජනාධිපති, පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වේ. මෙයින් එක් ආයතනයක් ඡන්ද විමසීමකට භාජනය වන අවස්ථාවේදී අනෙකුත් ආයතන සියල්ල රාජ්‍ය බලයද සහිතව එදිනෙදා කටයුතුවල යෙදේ. මේ නිසා රාජ්‍ය බලය හා බැඳි, තරඟ කරනු ලබන පක්ෂ/ අපේක්ෂකයන් කුමන වරදක් කළ ද ආරක්ෂාව සැපයේයැයි විශ්වාසයෙන් කටයුතු කිරීමත් නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශ පවතින දේශපාලන බලතුලනය හා සහජීවනයෙන් සිටීමට පෙළඹීමත් මත මෙම තත්ත්වය තවත් තීව්‍ර වේ. එබැවින් අඩුම තරමින් ප්‍රධාන මැතිවරණ දෙක වන ජනාධිපතිවරණය හා මහමැතිවරණය හෝ එකම දිනක පැවැත්විය හැකි වන පරිදි නීති සංශෝධනය ගෙන ඒම තුළින් යම් තරමක හෝ විශ්වාසයක් ගොඩනැඟිය හැකි වනු ඇත. ඉදිරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් හෝ මැතිවරණ කොමිසමේ උපදෙස් නොතකා ක්‍රියාකරන රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවල සේවකයන්ට දඬුවම් කිරීමට පනවා ඇති නීති රීති මෙන්ම මෙම උපදෙස් කඩකරනු ලබන පක්ෂ/ කණ්ඩායම්වල අපේක්ෂකයන්ට මෙන්ම බලතල අවභාවිතා කරනු ලබන දේශපාලන අධිකාරිවලට විරුද්ධව ක්‍රියාකිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට පැවරීමට කටයුතු කරන්නේ නම් මෙයින් වඩාත් යහපත් ප්‍රතිඵල බලාපොරොත්තු විය හැකි වනු ඇත.

මාධ්‍ය උපමාන

146. ඡන්ද විමසීමක් අවස්ථාවකදී තරඟ කරනු ලබන අපේක්ෂකයන් රටේ දියුණුව සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් මහජනතාව (ඡන්දදායකයන්) වෙත රැගෙන යාම මූලික වශයෙන්ම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් සිදු කෙරේ. මාධ්‍ය ආයතන රජයේ හෝ පෞද්ගලික අංශයේ වුවද ඒවායේ කාර්යභාරය විය යුත්තේ ඇති තතු ඇති සැටියෙන් ඡන්දදායකයා වෙත තොරතුරු ගලායාමට අවස්ථාව සැලසීමයි. එසේ නොමැතිව රාජ්‍ය මාධ්‍ය ආයතන පවතින රජයේ ගුණ වර්ණනා කිරීමත්, පෞද්ගලික මාධ්‍ය ආයතන තම හාම්පුතුන් දරන දේශපාලන මත මාධ්‍ය මඟින් ප්‍රචාරය කිරීමටත් කටයුතු කළහොත් මහජනතාව (ඡන්දදායකයන්) අසරණ වනු ඇත. මේ තත්ත්වය පිළිබඳව පැහැදිලිව අවබෝධ කර ගනිමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ද හඳුන්වා දුන් පරිදි මාධ්‍ය උපමාන නිකුත් කිරීමට කටයුතු

කරන ලදී. මාධ්‍ය උපමාන නිකුත් කිරීමට පෙර සියලු මාධ්‍ය ආයතනවල අදහස් ලබා ගැනීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස මහ මැතිවරණයේදී යම් තරමක සුහදායී තත්ත්වයක් දැකගත හැකි වුවද මැතිවරණ කොමිෂන් සභාවට රාජ්‍ය හෝ පෞද්ගලික මාධ්‍ය යන භේදයකින් තොරව මාධ්‍ය උපමාන කඩකරන අවස්ථාවලදී ක්‍රියාකිරීමට අවශ්‍ය බලතල ලබා දීම අත්‍යවශ්‍ය වේ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ද රජයේ මාධ්‍ය සම්බන්ධයෙන් එම බලතල ලබා දී ඇතත් පෞද්ගලික මාධ්‍ය ආයතන කෙරෙහි එම බලතල ක්‍රියාත්මක කළ නොහැකි වේ. පොදුවේ පසුගිය ඡන්ද විමසීම් ගැන අවධානය යොමු කළ විට රාජ්‍ය මාධ්‍ය ආයතන රජයට පක්ෂපාතීව කරුණු දක්වන්නේය යන විශ්වාසය තුළ ඡන්දදායකයා පෞද්ගලික මාධ්‍ය කෙරේ වැඩිපුර යොමුවන අවස්ථා තිබිය හැකිය. එවැනි අවස්ථාවක පෞද්ගලික මාධ්‍ය ආයතනද දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා යොමුව ඇති නම් ඡන්ද දායකයාට පවතින දේශපාලන වාතාවරණය ගැන තීරණයක් ගැනීම ඉතා අසීරු වනු ඇත. එබැවින් රාජ්‍ය මාධ්‍ය ආයතන මෙන්ම පෞද්ගලික මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් ද මැතිවරණ කාලසීමාව තුළ මාධ්‍ය උපමාන අනුවම කටයුතු කළයුතු බවට නියෝග පැනවීමට මෙන්ම ඒවා කඩකරන අවස්ථාවලදී අදාළ නාලිකා වසා දැමීම හෝ මැතිවරණ කාලසීමාව පුරා දේශපාලන කටයුතු ප්‍රචාරය වළක්වාලීමේ නියෝගය පැනවීමට මැතිවරණ කොමිෂන් සභාවට බලතල ලබා දීම අත්‍යවශ්‍ය වේ.

හදිසි සහ අත්‍යවශ්‍ය සේවාවල තැපැල් ඡන්ද පහසුකම අහිමි සේවකයන්ගේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම

147. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 122 වන වගන්තියට අනුව පෞද්ගලිකව ඡන්දය දීමට හැකිවනු පිණිස සේවා නියුක්තිකයන්ට නිවාඩු ලබා දීම සේවායෝජකයන්ගේ යුතුකම බවට සඳහන් කර ඇත. එවැනි ඉල්ලීමක් ලද විට සේවායෝජක විසින් ප්‍රමාණවත්යැයි සලකන පැය 04කට නොඅඩු කාලයක් සඳහා වූ වැටුප් සහිත නිවාඩුවක් ලබා දිය යුතුය. ඡන්ද විමසීම් අවස්ථාවලදී ලැබෙන පැමිණිලි ගැන අවධානය යොමු කළ විට ඡන්දය ප්‍රකාශකිරීම සඳහා යාමට ප්‍රමාණවත් කාලසීමාවක් සේවා යෝජකයන් විසින් ලබා නොදෙන බවටත්, සමහර අවස්ථාවල වැටුපෙන් එම දිනයන් සඳහා මුදල් අඩු කරන බවටත් පැමිණිලි ලැබේ. ඒ තත්ත්වය සැලකිල්ලට ගෙන පාර්ලිමේන්තු මැතිවරණයේදී මානව හිමිකම් කොමිෂන් සභාව ද සමඟ ඒකාබද්ධව සේවා නියුක්තිකයන්ට සේවා ස්ථානයේ සිට තමාට නියමිත ඡන්ද පොළට යාමට ඇති දුර පදනම් කරගෙන අවම වශයෙන් ලබා දිය යුතු නිවාඩු දින ගණන සම්බන්ධයෙන් එකඟතාවක් ඇති කරගෙන එය කම්කරු අමාත්‍යාංශය වෙතද ඉදිරිපත් කොට එමඟින් හාම්පුතුන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී. එම තොරතුරු මාධ්‍ය මඟින් ද ප්‍රකාශයට පත් කෙරිණි. සේවායෝජකයන් තම ආයතනයේ කටයුතු නිසි ලෙස පවත්වාගෙන යාම ගැන පමණක් සිතන අතර, සේවා නියුක්තිකයන් ඡන්දය ප්‍රකාශ කිරීම හෝ නොකිරීම ගැන අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයක් නොමැති වන්නට පුළුවන. එහෙත් අත් හළ නොහැකි ජනතා පරමාධිපත්‍ය යටතට ගැනෙන ඡන්දබලය ක්‍රියාත්මක කිරීමට යම් ආකාරයක බාධාවක් පැමිණවීම දඬුවම් ලැබිය හැකි වරදකි. එබැවින් සේවා නියුක්තිකයන්ට ඡන්දය දැමීම සඳහා තම ඡන්දපොළ වෙත යාමට ප්‍රමාණවත් කාලසීමාවක් නීතිගත කර ලබා දීම සඳහා අවශ්‍ය නීති සංශෝධන ගෙන ඒම මෙන්ම ඒවා පැහැර හරින සේවායෝජකයන්ට දඬුවම් ලබා දීමේ ක්‍රියාමාර්ග ගැනීමද අනිවාර්යෙන්ම කළ යුතු වනු ඇත.

මැතිවරණ ප්‍රචාරක කටයුතු

148. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 68 වගන්තියේ සිට 74 වන වගන්තිය දක්වා වගන්ති වලින් අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීම, පෙරහැර පැවැත්වීම, ප්‍රචාරක පත්‍රිකා මුද්‍රණය හා බෙදා හැරීම, දැන්වීම ප්‍රදර්ශනය හා ඡන්ද කාර්යාල පවත්වාගෙන යාම ගැන සඳහන් කර ඇත. නාමයෝජනා භාරගැනීමත් සමඟ ම සියලුම දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්වල තරග කරන ලද අපේක්ෂකයන් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී. ඒ සමඟ ම පොලිස්පතිවරයා මඟින් සියලුම ඉහළ පොලිස් නිලධාරීන් මෙන්ම පොලිස් ස්ථානාධිපතිවරුන් ද දැනුවත් කිරීමට මීට අදාළ නීති තදින් ක්‍රියාත්මක කළයුතු බවට උපදෙස් ලබා දෙන ලදී. එහෙත්

ක්‍රියාත්මක තලයේදී දේශපාලන පක්ෂ/ කණ්ඩායම් මෙන්ම තරග කරනු ලබන අපේක්ෂකයන් හා ඔවුන්ගේ උදව්කරුවන් ප්‍රසිද්ධියේම මෙම නීති උල්ලංඝනය කරමින් දැන්වීම්, පෝස්ටර්, කටවුට් ප්‍රදර්ශනය කරනු දක්නට ලැබුණි. මේ තත්ත්වය තුළ දිස්ත්‍රික් මට්ටමේ හා ප්‍රාදේශීය මට්ටමේ පිහිටි පැමිණිලි මධ්‍යස්ථානවලට ලැබෙන පැමිණිලි මත පදනම්ව පැමිණිලි මධ්‍යස්ථානවලට අනුයුක්ත රජයේ නිලධාරීන් හා පොලිස් නිලධාරීන්ගේ සහායෙන් හැකි උපරිමෙන් නීති විරෝධී ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර්, කටවුට් ඉවත් කරන ලද අතර, මැතිවරණ මහලේකම් කාර්යාලය සෘජුව සම්බන්ධ වෙමින් විශේෂිත කණ්ඩායම් පවා යොදවා මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

149. කෙසේ වෙතත් මෙහිදී පවතින ඡන්ද ක්‍රමය හා නීති රීති ගැන අවධානය යොමු කළහොත් මනාප ඡන්ද ක්‍රමය තුළ ඡන්දදායකයා තම මනාප අංකය පිළිබඳ නිසිලෙස දැනුවත් කිරීම ජයග්‍රහණය සඳහා අවශ්‍ය වන අතර, පවතින නීතිමය තත්ත්වය තුළ අපේක්ෂකයාට හෝ ඔහුගේ පවුලේ කිසිවෙකුට ඡන්දදායකයාගේ නිවසකටවත් යාමට නොහැකි තත්ත්වයක් තුළ අපේක්ෂකයා තම ඡන්දදායකයන් කෙලෙස දැනුවත් කළ යුතුද යන්න පිළිබඳ ගැටලුවට පත්වේ. මේ නිසාම නීතිය ගැන සැලකිල්ලකින් තොරව තම ජයග්‍රහණය ගැන පමණක් සිතා කටයුතු කිරීම සිදුවේ. නීතිමය තත්ත්වය කුමක් වුවද විශාල වශයෙන් මුදල් වියදම් කළ හැකි අපේක්ෂකයන් කුමන බාධා මැද වුවද තම ප්‍රචාරක කටයුතු සිදු කරන තත්ත්වයක් ද දැකිය හැකිය. ඒ තුළින් අනෙකුත් අපේක්ෂකයන්ට යම් අවාසියක්ද සිදු වේ. මුදල් වැඩිපුර වියදම් කළ හැකි අපේක්ෂකයා නීතිය ගැන නොසලකමින් තම ආධාරකරුවන් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරණ දැන්වීම් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් ඉවත් කළ ද ඊට පසුදින එයටත් වැඩියෙන් ඒවා ප්‍රදර්ශනයට ඔහුට හැකියාව ඇත. මෙවැනි පසුබිමක් තුළ සියලුම අපේක්ෂකයන් තම ඡන්ද ව්‍යාපාරය සාධාරණව ක්‍රියාත්මක කරන්නේද යන්න ගැන අවධානය යොමු කළ යුතුව ඇත.

150. ඉහතකී තත්ත්වය තුළ මැතිවරණ පනතින් නියමව ඇතත් තරග කරනු ලබන අපේක්ෂකයන්ට යම්තාක් දුරකට හෝ තමා සම්බන්ධයෙන් ප්‍රචාරයක් සිදු කර ගැනීමට අවස්ථාව සලසා ගැනීම පිණිස තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් නායකයන් සමඟ සාකච්ඡා කොට පොදු එකඟතාවයකට පැමිණ සියලුම අපේක්ෂකයන්ට සාධාරණ පසුබිමක් නිර්මාණය කර දීම සුදුසු වේ. ඒ සමඟ ම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා නිශ්චිත ස්ථාන මැතිවරණ කොමසාරිස්වරයා හා තේරීම්භාර නිලධාරී විසින් තීරණය කොට ඒවා ඒ ඒ පක්ෂ/ කණ්ඩායම් තරග කරන අපේක්ෂකයන් වෙත සාධාරණ අන්දමින් වෙන් කර දීමේ වැඩපිළිවෙලක් සැකසීමත්, අසීමිත මුදල් බලයක් සහිතව තරග කරනු ලබන අපේක්ෂකයන්ට වැඩි වාසි ලැබීමට ඇති හැකියාව ඉවත් කොට සියලුම අපේක්ෂකයන්ට සාධාරණව තම ඡන්ද ප්‍රචාරණ කටයුතු කරගෙන යාමට අවස්ථාව සලසමින් ප්‍රචාරණ කටයුතු සඳහා උපරිම වියදම් සීමාවක් අපේක්ෂකයන් වෙත පැනවීම හා ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේද යන්න අධීක්ෂණයට නිසි යාන්ත්‍රණයක් සැකසීමද මෙම ඡන්ද ක්‍රමය තුළ ඉතා වැදගත් වනු ඇත.

මැතිවරණ නීති බලාත්මක කිරීම

151. පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට අදාළ නීතිමය ප්‍රතිපාදන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ද සඳහන් වේ. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 128 වන වගන්තිය අනුව කොමසාරිස්වරයාගේ බලතල පැහැදිලි කර ඇති අතර, ඒ අනුව මැතිවරණය පැවැත්වීම, පරිපාලනය හා පොදුවේ මැතිවරණය මෙහෙයවීම හා අධීක්ෂණය ක්‍රියාත්මක කළයුතු වේ. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ කාර්යයන් සඳහා වැරදි, දූෂණ ක්‍රියා හා නීති විරෝධී ක්‍රියා පනතේ VI වන කොටසේ පැහැදිලි කර ඇති අතර, ඒ අනුව 66 වන වගන්තියේ සිට 76 වන වගන්තිය දක්වා "වැරදි" සම්බන්ධයෙන් ද 77 වන වගන්තියේ සිට 82 වන වගන්තිය දක්වා "දූෂණ ක්‍රියා" සම්බන්ධයෙන් ද 83 වන වගන්තියේ සිට 88 වන වගන්තිය දක්වා "නීති විරෝධී ක්‍රියා"සම්බන්ධයෙන් ද විස්තර දක්වා ඇත.

152. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාව අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම කොමිෂන් සභාවේ

පරමාර්ථය විය යුතු බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (ආ) (1) අනු ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරාපත් කර ගැනීම, පළාත් සභා මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම,පළාත් පාලන ආයතනවල සභිකයන් තෝරාපත් කර ගැනීම සහ ජනමත විචාරණ පැවැත්වීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතියක් මඟින් මැතිවරණ කොමිෂන් සභාව හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා දී ඇති හෝ පනවා ඇති සියලු බලතල කාර්යය සහ කර්තව්‍ය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ලෙස සඳහන් කර ඇත. තවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඇ(1) අනු ව්‍යවස්ථාවට අනුව ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විට කොමිෂන් සභාවට අවශ්‍ය පහසුකම් හා පොලිස් නිලධාරී සංඛ්‍යාවක් මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත පොලිස්පතිවරයා විසින් සැපයිය යුතු බව හා ඡන්ද විමසීමක් පැවැත්වීමේදී යම් අහිතකර විය හැකි යම් ක්‍රියා හෝ සිද්ධි වැළැක්වීමේ හා පාලනය කිරීමේ අවශ්‍යතාව මත සන්නද්ධ හමුදා යෙදවීම සම්බන්ධ ඉල්ලීමක් ජනාධිපතිවරයා වෙත යොමු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට හැකියාව ඇත. තවද මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවන තාක් මෙම බලතල ක්‍රියාත්මක කිරීම ඒ වන විටත් සේවයේ නියුතු මැතිවරණ කොමසාරිස්වරයාට කළ හැකි බව ද සඳහන් වේ. ඒ අනුව ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාවට සහාය දැක්වීම නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම නිලධාරීන්ගේ කාර්යයක් හා වගකීමක් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (2) ආ සහ 104 ඇ (4) අනු ව්‍යවස්ථාවල දැක්වේ.

153. ඉහත සඳහන් කළ ආකාරයෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති නීතිමය බලතල රාජ්‍ය නිලධාරීන් හා පොලිසියේ සහාය ඇතිව ක්‍රියාත්මක කිරීම මඟින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ වගකීමක් වේ. මැතිවරණ අවස්ථාවකදී මැතිවරණය නීත්‍යානුකූලව පවත්වාගෙන යාම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට හා තේරීම්භාර නිලධාරී වෙත සහාය වන ප්‍රධානම ආයතනය පොලිසිය වන බැවින් පොලිස්පතිවරයාගේ සිට පහළම නිලය දක්වා වූ සියලු නිලධාරීන්ගේ සහාය නීති බලාත්මක කිරීම සඳහා යොදා ගැනීම ඉතා වැදගත් වනු ඇත. මීට පෙර ද සඳහන් කළ මැතිවරණ පැවැත්වෙන අවස්ථාවක වෙනත් දේශපාලන අධිකාරීන්ද ක්‍රියාත්මක වන බැවින් පොලිසියට ඇතිවන දේශපාලන බලපෑම මත තමන් වෙත පැවරී ඇති කාර්යයන් නිසිලෙස ඉටු කිරීමේ බාධා පැමිණිය හැකි බැවින් එවැනි අවස්ථාවල පොලිසිය මෙහෙයවන නිලධාරීන් මෙන්ම මැතිවරණ කොමිසම ද ක්‍රියාත්මකව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් වෙනුවෙන් වූ තීරණ ගැනීම නීති බලාත්මක කිරීම අවශ්‍ය වේ. තවද නීති බලාත්මක කිරීම සඳහා පවත්නා රාමුව තුළ බාධා එල්ල වී ඇති බව මැතිවරණ කොමිෂන් සභාවට පෙනී යන්නේ නම් ඒවා ඉවත් කර ගැනීම සඳහා නව ක්‍රියාමාර්ග වෙත යොමුවිය යුතුය. උදාහරණ ලෙස මැතිවරණ කොමිෂන් සභාව වෙත ඡන්ද විමසීම් කාලයේදී ලැබෙන පැමිණිලි විභාග කිරීම සඳහා වෙනම වූ අධිකරණයක් පිහිටුවීම හෝ එවැනි පැමිණිලි නීතිපතිවරයා මඟින් අධිකරණය වෙත රැගෙන යාම වෙනුවට මැතිවරණ කොමිෂන් සභාව මඟින් සෘජුවම අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට හැකි වාතාවරණය සකසා ගැනීම මෙහිදී වඩාත් වැදගත් වනු ඇත.

154. පාර්ලිමේන්තු මැතිවරණය හා සබැඳි අධිකරණ ක්‍රියාමාර්ග

නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට අදාළව පහත පරිදි නඩු ගොනුකර ඇත.

යාපනය දිස්ත්‍රික්කයේ පී. ඇන්ටන් නිකුලස් මහතාගේ ස්වාධීන කණ්ඩායමට අදාළ නාමයෝජනා පිළිගන්නා ලෙසට ගොනුකළ CA (Writ)292/2015 පෙත්සම, කරුණු සලකා බලා ප්‍රතික්ෂේප කරමින් ගරු අධිකරණය විසින් තීන්දු ලබාදී ඇති අතර, යාපනය දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිදහස් පෙරමුණේ නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට එරෙහි එම පක්ෂයේ ලේකම් සාගර කාරියවසම් මහතා විසින් ගොනුකළ නඩුව ද [CA (Writ)300/2015] අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. යාපනය දිස්ත්‍රික්කයේ ස්වාධීන කණ්ඩායම් නායක මුරුගන් කුමාරවේල් මහතා විසින්, තම නාමයෝජනා ප්‍රතික්ෂේප වීමට එරෙහිව ගොනුකළ අංක CA(Writ)296/2015 දරන අභියාචනය ප්‍රතික්ෂේපකර ඇති අතර, මහනුවර,

නුවරඑළිය, බදුල්ල හා කෑගල්ල දිස්ත්‍රික්කවල එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හා ශ්‍රී ලංකා කම්කරු කොංග්‍රසයේ නාමයෝජනා සම්බන්ධයෙන් සිවිල් ක්‍රියාකාරිකයෙකු ලෙස ආනන්දන් මෝහන්දාස් මහතා විසින් පවරන ලද SC/FR/321/2015 දරන නඩුවට අදාළ පෙත්සම, පැමිණිලිකරුවන් ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් එම නඩුව ඉවත දමන ලදී.

රෝසි සේනානායක මහත්මිය විසින් කොළඹ දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයේ මනාප නැවත ගණන් කරන ලෙසට වූ SC/FR/355/2015 අධිකරණ පෙත්සම, ප්‍රතික්ෂේප කරන ලද්දේ, මනාප වැරදියට ගණන් කරන ලද්දේ යැයි අධිකරණයට දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කළ තැනැත්තන් එක්සත් ජාතික පක්ෂයේ මනාප ප්‍රතිඵල නිවැරදි බවට මනාප ප්‍රතිඵල ලේඛනවල, ප්‍රතිඵල නිකුත් කරන ලද අවස්ථාවේදී අත්සන් තැබීම හේතුවෙනි.

එමෙන්ම 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත අනුව පත්කරනු ලබන ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර පිළිබඳව, නාගානන්ද කොඩිතුවක්කු මහතා [SC(Writ)5/2015], ධර්මපාලගේ දොන් සෝමවීර චන්ද්‍රසිරි මහතා [SC/FR/338/2015], ඩී. ඊ. ඩබ්ලිව් ගුණසේකර මහතා [SC/FR/344/2015] හා මහාචාර්ය නිස්ස විතාරණ මහතා [S C / F R / 3 5 8/2015] අධිකරණ ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වූ බව වාර්තා වේ. සෝමවීර චන්ද්‍රසිරි මහතා මිය යෑම හේතුවෙන්, පැමිණිලි පාර්ශ්වය එම නඩුව ඉල්ලා අස්කර ගන්නා ලද අතර, සෙසු පෙත්සම් අධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලදී.

සමාප්තිය

155. පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත්කළ අවස්ථාවේ සිට මැතිවරණ කොමසාරිස්වරයා නිකුත් කළ උපදෙස් සහ කරන ලද ඉල්ලීම්වලට ක්ෂණික ප්‍රතිචාර දක්වමින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පොලිසිය විසින් දක්වන ලද සහාය ප්‍රශංසනීය වේ. විශේෂයෙන්ම ඡන්ද විමසීමක මූලික කටයුතු සංවිධානයේ සිට ඡන්ද විමසීම, ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශය දක්වා වූ කාර්යයන් සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය සපයා ගැනීම, පුහුණු කිරීම් ආදිය සාර්ථක කර ගැනීමට අමාත්‍යාංශ මෙන්ම දෙපාර්තමේන්තු ප්‍රධානීන් දක්වන ලද සහාය මෙන්ම මැතිවරණයේ කටයුතු නිදහස් හා සාධාරණ ලෙස පවත්වාගෙන යාමට පවත්නා නීති රාමුව තුළ හා මැතිවරණ කොමසාරිස්වරයාගේ නිරන්තර උපදෙස් පරිදි කටයුතු කරමින් පොලිස්පති ඇතුළු සෙසු පොලිස් නිලධරයන්ගෙන් ලද සහාය අතිමහත්ය. මැතිවරණ මහලේකම් කාර්යාලයේ සියලුම නිලධාරීන් මෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සෙසු නිලධාරීන් ඡන්ද විමසීම් දැන්වීම ප්‍රකාශයට පත් කිරීමේ සිට ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කෙරෙන තෙක් දිවා රෑ නොබලා කරන ලද කැපවීම විශේෂයෙන්ම සඳහන් කළ යුතුය. තරග කරන ලද දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයන් මැතිවරණ කොමසාරිස්වරයාගේ කැඳවීම මත හෝ ඔවුන්ට බලපාන ප්‍රශ්න ඉදිරිපත් කිරීම සඳහා ඉදිරිපත් වෙමින් මැතිවරණ මූලික කටයුතු සංවිධානයේ ගැටලු සහගත අවස්ථා යම් පමණකට හෝ විසඳා ගැනීමට හැකිවන සේ ලබා දුන් සහාය අගය කළ යුතුය. තවද දේශීය නිරීක්ෂණ සංවිධාන මැතිවරණ කටයුතු සංවිධානයේ විවිධ අවස්ථා සම්බන්ධයෙන් තම උපරිම දායකත්වය ලබා දෙමින් කටයුතු කළ අතර, ඒ තුළින් තරග කරන ලද පක්ෂ/ කණ්ඩායම්වලට ඡන්ද විමසීම නිදහස්ව හා සාධාරණව පැවති බව තහවුරු කිරීමට අවස්ථාව සැලසිණි. මැතිවරණ සංවිධාන කටයුතු සාර්ථක කර ගැනීමට ඡන්ද විමසීමට අදාළවන ලිපි ලේඛන මෙන්ම ඡන්ද පත්‍රිකා මුද්‍රණය කර දීමෙන් සහාය වූ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, ඡන්ද විමසීම් කාලසීමාව තුළ මැතිවරණ කොමසාරිස්වරයා මෙන්ම තේරීම්භාර නිලධාරී විසින් යොමු කෙරුණු ලැබූ විශාල ලිපි සංඛ්‍යාව මෙන්ම නිදහස් තැපැල් පහසුකම යටතේ දේශපාලන පක්ෂ ලේකම්වරුන් යොමු කළ විශාල ලිපි සංඛ්‍යාව මෙන්ම සෑම නිවසකටම නිල ඡන්ද දැන්වීම්පත් නියමිත කාලවකවානුව තුළ බෙදා හරිමින් සහාය දැක්වූ තැපැල් දෙපාර්තමේන්තුව ද, මැතිවරණ කාර්යය මණ්ඩල ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා පෞද්ගලික බස්රථ සමාගම් ද සන්නිවේදන පහසුකම් සලසමින්

දායකත්වය සැපයූ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ද ඡන්ද විමසීමේ මූලික කටයුතු ආරම්භයේ සිට ඡන්ද ගණන් කර ප්‍රතිඵල ප්‍රකාශ කරන තෙක් බාධාවකින් තොරව විදුලිය සැපයුම පවත්වා ගනිමින් දායකත්වය දැක්වූ ලංකා විදුලිබල මණ්ඩලය ද ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශයට පත්කිරීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත සහාය වූ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල ද මේ අවස්ථාවේ විශේෂයෙන් සිහිපත් කළ යුතුය. ඒ අතර ඡන්ද දායකයා මෙන්ම මහජනතාව මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සහ පක්ෂ ප්‍රතිපත්ති සැලසුම් ගැන දැනුවත් කරමින් තම වගකීම ඉටු කළ සියලුම මාධ්‍ය ආයතන ඡන්ද ගණන් කිරීම අවසානයේ ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට ද සක්‍රීය දායකත්වය ලබා දෙමින් ඉටුකළ සේවය ප්‍රශංසනීය වේ.

156. ඉහත සඳහන් කළ සියලුම ආයතන හා පුද්ගලයන් 2015.08.17 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය නිදහස් හා සාධාරණව පැවැත්වීමටත් ඒ තුළින් ඡන්දදායකයා, මහජනතාව, මැතිවරණ දෙපාර්තමේන්තුව කෙරෙහි තැබූ විශ්වාසය තවදුරටත් තහවුරු කිරීමට ලැබුණු අවස්ථාව සම්බන්ධයෙන් සියලු දෙනා වෙත මාගේ ප්‍රශංසාව මෙයින් පිරිනමමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

උපලේඛන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1920/38 - 2015 ජූනි මස 26 වැනි සිකුරාදා - 2015.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මගේ අංකය : සිඑස්ඒ/1/2/3.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තියේ විධිවිධාන අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මේ ප්‍රකාශනයෙන් -

(අ) අද දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි, පාර්ලිමේන්තුව විසුරුවා හරින අතර, අභිනව පාර්ලිමේන්තුව වර්ෂ දෙදහස් පහළොවක් වූ සැප්තැම්බර් මස පළමුවන දින රැස්වීම සඳහා කැඳවන බව ;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගන්නා දිනය වශයෙන් වර්ෂ දෙදහස් පහළොවක් වූ අගෝස්තු මස දහහත් වන දිනය නියම කරන බව ;

(ඇ) තේරීම් භාර නිලධරයන් විසින් නාමයෝජනා පත්‍ර භාර ගතයුතු වන්නේ යම් කාලසීමාවක් ඇතුළත ද, ඒ නාමයෝජනා කාලසීමාව වශයෙන් වර්ෂ දෙදහස් පහළොවක් වූ ජූලි මස හය වන දිනයෙන් ආරම්භව වර්ෂ දෙදහස් පහළොවක් වූ ජූලි මස දහතුන් වන දින දහවල් දොළහට අවසන් වන කාලසීමාව නියම කරන බව ; සහ

(ඈ) මෙහි උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් කර ඇත්තා වූ මැතිවරණ කොට්ඨාසය සඳහා තේරී පත්වීමට අපේක්ෂා කරන මන්ත්‍රී ධුරාපේක්ෂකයන්ගේ නාමයෝජනා කරනු ලැබිය යුතු එක් එක් ස්ථානය වශයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානය නියම කරන බව ;

මෙයින් සියල්ලෝම දැනගත යුතුය.

වර්ෂ දෙදහස් පහළොවක් වූ ජූනි මස විසිහය වන දින වූ මෙදින කොළඹ දී නිකුත් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

1A - G 21294 — 620 (2015/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛන - 1

උපලේඛනය

I වන තීරය	*II වන තීරය*
මැතිවරණ කොට්ඨාසය	*නාමයෝජනා කරනු ලැබිය යුතු ස්ථානය*
අංක 01 - කොළඹ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ
අංක 02 - ගම්පහ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ
අංක 03 - කළුතර	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර
අංක 04 - මහනුවර	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර
අංක 05 - මාතලේ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
අංක 06 - නුවරඑළිය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය
අංක 07 - ගාල්ල	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල
අංක 08 - මාතර	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර
අංක 09 - හම්බන්තොට	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
අංක 10 - යාපනය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය
අංක 11 - වන්නි	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව
අංක 12 - මඩකලපුව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව
අංක 13 - දිගාමඩුල්ල	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර
අංක 14 - ත්‍රිකුණාමලය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය
අංක 15 - කුරුණෑගල	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල
අංක 16 - පුත්තලම	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම
අංක 17 - අනුරාධපුරය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය
අංක 18 - පොළොන්නරුව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව
අංක 19 - බදුල්ල	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල
අංක 20 - මොණරාගල	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල
අංක 21 - රත්නපුර	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර
අංක 22 - කෑගල්ල	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1920/39 - 2015 ජුනි මස 27 වැනි සෙනසුරාදා - 2015.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

6(1) වගන්තිය යටතේ දැන්වීම

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 6(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් කර තිබෙන මැතිවරණ කොට්ඨාස සඳහා එහි II වැනි තීරයේ අනුරූප සටහනේ තනතුරු නාමයෙන් නම් කර ඇති නිලධාරීන් එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තේරීම්හාර නිලධාරියා ලෙස ද මෙයින් පත් කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 ජුනි මස 27 වැනි දින,
රාජගිරියේ දී ය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*
අංක 01 - කොළඹ	දිස්ත්‍රික් ලේකම්, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය
අංක 02 - ගම්පහ	දිස්ත්‍රික් ලේකම්, ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය
අංක 03 - කළුතර	දිස්ත්‍රික් ලේකම්, කළුතර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 04 - මහනුවර	දිස්ත්‍රික් ලේකම්, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 05 - මාතලේ	දිස්ත්‍රික් ලේකම්, මාතලේ පරිපාලන දිස්ත්‍රික්කය
අංක 06 - නුවරඑළිය	දිස්ත්‍රික් ලේකම්, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය
අංක 07 - ගාල්ල	දිස්ත්‍රික් ලේකම්, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය
අංක 08 - මාතර	දිස්ත්‍රික් ලේකම්, මාතර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 09 - හම්බන්තොට	දිස්ත්‍රික් ලේකම්/හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය
අංක 10 - යාපනය	දිස්ත්‍රික් ලේකම්/ආණ්ඩුවේ ඒජන්ත, යාපනය පරිපාලන දිස්ත්‍රික්කය
අංක 11 - වන්නි	දිස්ත්‍රික් ලේකම්/ආණ්ඩුවේ ඒජන්ත, වවුනියා පරිපාලන දිස්ත්‍රික්කය
අංක 12 - මඩකලපුව	දිස්ත්‍රික් ලේකම්/ආණ්ඩුවේ ඒජන්ත, මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කය
අංක 13 - දිගාමඩුල්ල	දිස්ත්‍රික් ලේකම්/ආණ්ඩුවේ ඒජන්ත, අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 14 - ත්‍රිකුණාමලය	දිස්ත්‍රික් ලේකම්/ආණ්ඩුවේ ඒජන්ත, ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කය
අංක 15 - කුරුණෑගල	දිස්ත්‍රික් ලේකම්, කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය
අංක 16 - පුත්තලම	දිස්ත්‍රික් ලේකම්, පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය
අංක 17 - අනුරාධපුරය	දිස්ත්‍රික් ලේකම්, අනුරාධපුරය පරිපාලන දිස්ත්‍රික්කය

1A - PG 2530— 86 (2015/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

I වැනි තීරය	*II වැනි තීරය*
අංක 18 - පොළොන්නරුව	දිස්ත්‍රික් ලේකම්, පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කය
අංක 19 - බදුල්ල	දිස්ත්‍රික් ලේකම්, බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය
අංක 20 - මොණරාගල	දිස්ත්‍රික් ලේකම්, මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කය
අංක 21 - රත්නපුර	දිස්ත්‍රික් ලේකම්, රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 22 - කෑගල්ල	දිස්ත්‍රික් ලේකම්, කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය

07 - 590/1

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

6(1) වගන්තිය යටතේ දැන්වීම

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 6(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් කර තිබෙන මැතිවරණ කොට්ඨාස සඳහා එහි II වැනි තීරයේ අනුරූප සටහනේ තනතුරු නාමයෙන් තම් කර ඇති නිලධාරීන් එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි සහකාර තේරීම්භාර නිලධාරියෙකු ලෙස මෙයින් පත් කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 ජූනි මස 27 වැනි දින,
රාජගිරියේ දී ය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*
අංක 01 - කොළඹ	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය
	සහකාර මැතිවරණ කොමසාරිස්, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය
අංක 02 - ගම්පහ	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය
	සහකාර මැතිවරණ කොමසාරිස්, ගම්පහ, පරිපාලන දිස්ත්‍රික්කය
	පරිපාලන නිලධාරි, මැතිවරණ කාර්යාලය, ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය
අංක 03 - කළුතර	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, කළුතර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 04 - මහනුවර	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 05 - මාතලේ	සහකාර මැතිවරණ කොමසාරිස්, මාතලේ පරිපාලන දිස්ත්‍රික්කය
අංක 06 - නුවරඑළිය	සහකාර මැතිවරණ කොමසාරිස්, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කය
අංක 07 - ගාල්ල	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය
අංක 08 - මාතර	සහකාර මැතිවරණ කොමසාරිස්, මාතර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 09 - හම්බන්තොට	සහකාර මැතිවරණ කොමසාරිස්, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය
අංක 10 - යාපනය	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, උතුරු පළාත
	සහකාර මැතිවරණ කොමසාරිස්, යාපනය පරිපාලන දිස්ත්‍රික්කය
	සහකාර මැතිවරණ කොමසාරිස්, කිලිනොච්චි පරිපාලන දිස්ත්‍රික්කය
අංක 11 - වන්නි	නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, උතුරු පළාත
	සහකාර මැතිවරණ කොමසාරිස්, මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කය
	සහකාර මැතිවරණ කොමසාරිස්, මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කය
අංක 12 - මඩකලපුව	සහකාර මැතිවරණ කොමසාරිස්, මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කය
අංක 13 - දිගාමඩුල්ල	සහකාර මැතිවරණ කොමසාරිස්, අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 14 - ත්‍රිකුණාමලය	සහකාර මැතිවරණ කොමසාරිස්, ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කය
අංක 15 - කුරුණෑගල	සහකාර මැතිවරණ කොමසාරිස්, කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය
	පරිපාලන නිලධාරි, මැතිවරණ කාර්යාලය, කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය
අංක 16 - පුත්තලම	සහකාර මැතිවරණ කොමසාරිස්, පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය
අංක 17 - අනුරාධපුරය	සහකාර මැතිවරණ කොමසාරිස්, අනුරාධපුරය පරිපාලන දිස්ත්‍රික්කය
අංක 18 - පොළොන්නරුව	සහකාර මැතිවරණ කොමසාරිස්, පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කය
අංක 19 - බදුල්ල	සහකාර මැතිවරණ කොමසාරිස්, බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය
අංක 20 - මොණරාගල	සහකාර මැතිවරණ කොමසාරිස්, මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කය
අංක 21 - රත්නපුර	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය
අංක 22 - කෑගල්ල	සහකාර මැතිවරණ කොමසාරිස්, කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය

07 - 590/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17
පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවලුන්ට, ජාතික මැතිවරණවල දී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම

තම ඡන්දය දීමට හැකි වනු පිණිස සේවා නියුක්තීන්ට නිවාඩු දීමට සේවා යෝජකයින් කටයුතු කළ යුතු බවට 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 122 වැනි වගන්තියෙන් විධිවිධාන සලසා ඇති අතර 2015.08.17 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී ද එය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුව ඇත.

රාජ්‍ය අංශයේ, නිලධරයන්ගේ විශේෂ නිවාඩු පිළිබඳව ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 12.3 ඡේදයේ දක්වා ඇති පරිදි, පාර්ලිමේන්තු මැතිවරණයකදී අවම කාලය පැය 4ක් ලෙස ද ඡන්දය ප්‍රකාශ කිරීමට යාම පිණිස අවශ්‍යයැයි හැඟෙන අඛණ්ඩ කාලයක් සඳහා වැටුප් අඩු කිරීමක් නොමැතිව විශේෂ නිවාඩු ලබා දිය යුතු බව ද දක්වා ඇත.

එසේ වුවද පෞද්ගලික අංශයේ, සේවා නියුක්තීන්ට ලිඛිත නියමයකින් පැනවූ එවැනි විශේෂ නිවාඩු ලබා දීමේ ක්‍රමවේදයක් නොමැති හෙයින් බොහෝ සේවා යෝජකයින් තම සේවා නියුක්තීන්ට ඡන්දය පාවිච්චි කිරීම සඳහා වූ නිවාඩු ලබා නොදෙන බවට පසුගිය ඡන්ද විමසීම් කිහිපයේදීම පැමිණිලි ලැබී ඇති බැවින් ඉහත කරුණට අදාළව 2014.12.22 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමසාරිස් කැඳවා කොමිෂන් සභාවේ ගරු සභාපතිතුමා, ගරු කොමසාරිස්වරු හා නීති ලේකම්වරයා ඇතුලු සෙසු නිලධාරීන් සමඟ මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වනු ලැබූ සාකච්ඡාවේදී ඇති කර ගන්නා ලද එකඟතාව අනුව පෞද්ගලික අංශයේ සේවකයින්ට ජාතික මැතිවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට යෑමට හා ඊට නිවාඩු ලබා දීම සඳහා දුර හා කාලය අතර සම්බන්ධතාවක් සකස්කරන ලෙස ගරු කොමිෂන් සභාව විසින් කරන ලද දැන්වීම අනුව මතු සඳහන් වගුවට අනුකූලව පෞද්ගලික අංශයේ සේවය කරන්නා වූ සේවක සේවිකාවන්ට, සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වූ නිවාඩු ලබාදීමට අදාළ සේවා යෝජකයින් කටයුතු කිරීම සුදුසු බවට මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබේ.

ඡන්දය පාවිච්චි කිරීම සඳහා සේවා ස්ථානයේ සිට තම ඡන්ද පොළට යා යුතු දුර ප්‍රමාණය	ලබා දියයුතු අවම නිවාඩු කාලසීමාව
කි.මී. 40 ක් හෝ ඊට අඩු නම්	දින භාගයයි.
කි.මී. 40 ත් - 100 ත් අතර නම්	දින එකයි.
කි.මී. 100 ත් - 150 ත් අතර නම්	දින 1 1/2 යි.
කි.මී. 150 ට වැඩි නම්	දින 2 යි.

ඉහත සටහනින් යෝජනා කර ඇත්තේ ලබා දිය යුතු අවම කාලය වන අතර දිවයිනේ සමහර ඡන්දදායකයින්ට ඡන්ද පොළට යෑමට හා ඊමට දින තුනක් අවශ්‍යවන අවස්ථා ද සැලකිය යුතු සංඛ්‍යාවක් තිබෙන හෙයින් අවස්ථාවෝචිතව දින තුනක් නිවාඩු දීමට සිදු වන බවද සැලකිල්ලට ගත යුතු වේ.

මෙහිදී, සේවා නියුක්තීන් විසින් ලිඛිත ඉල්ලීමක් මඟින් නිවාඩු ඉල්ලුම් කළ යුතු අතර, සෑම සේවා යෝජකයකු විසින්ම විශේෂ නිවාඩු ඉල්ලුම්කළ තැනැත්තන් හා නිවාඩු ප්‍රදානය කරන කාලසීමාව දැක්වෙන ලේඛනයක් පිළියෙල කර එය, සේවා ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු ද වේ.

මානව හිමිකම් කොමිෂන් සභාවේ දී කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගෙන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල් හා මා සහභාගි වූ සාකච්ඡාවේදී ඇති කරගන්නා ලද එකඟතාව අනුව ජාතික මැතිවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට යාම සහ ඊම පිළිබඳ පෞද්ගලික අංශය සඳහා සැකසූ පෙර සඳහන් නිර්දේශවලට අනුකූලතාව දක්වමින් ස්වකීය ආයතනයේ සේවා නියුක්තීන්ට ඡන්දය දීමට යෑමට හා ඊමට ප්‍රමාණවත් නිවාඩු ලබා දෙන ලෙස සියලුම සේවා යෝජකයන් වෙතින් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.
2015.07.28

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

<u>පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015.08.17</u>
<u>ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා අවසරලත් නිරීක්ෂණ ආයතන හා නිරීක්ෂකයින් විසින් පිළිපැදිය යුතු නියාමන</u>

1. මැතිවරණ නිරීක්ෂණ ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ජංගම නිරීක්ෂකයින් සහ ඡන්ද පොළ නිරීක්ෂකයින් වශයෙන් තෝරා ගනු ලබන පුද්ගලයන් පසු ගිය වසර 5 ඇතුළත ක්‍රියාකාරී දේශපාලනයේ නිරත නොවූ, ඡන්ද විමසීම්වලදී අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වී නැති ඡන්ද හිමියන් වශයෙන් සුදුසුකම් ලබා ඇති මධ්‍යස්ථ පුද්ගලයින් විය යුතුය. සියලුම නිලධාරීන් සහ නිරීක්ෂකයන් දිවුරුම් ප්‍රකාශයක් / ප්‍රතිඥාවක් මගින් ඒ බව තහවුරු කළ යුතු අතර, අවශ්‍ය අවස්ථාවක පරීක්ෂා කිරීමට හැකි වන පරිදි එම දිවුරුම් ප්‍රකාශ / ප්‍රතිඥා නිරීක්ෂණ ආයතනය භාරයේ සුරක්ෂිතව තැබිය යුතුය. (ආදර්ශ දිවුරුමෙහි / ප්‍රතිඥාවෙහි පිටපතක් අමුණා ඇත.)

2. මැතිවරණ නිරීක්ෂණ ආයතනයක කිසියම් නිලධාරියකු හෝ කිසියම් නිරීක්ෂකයකු දේශපාලන සම්බන්ධතා මත රජයෙන් හෝ වෙනත් සංවිධානයක් මගින් ලබා දුන් කිසියම් තනතුරක් දරන්නකු හෝ පසුගිය වර්ෂ 5 ක් ඇතුළත එවැනි තනතුරු දැරූවකු හෝ නොවිය යුතුය.

3. නිරීක්ෂණ ආයතන විසින් දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් සතු ගොඩනැගිලි, වාහන, දුරකථන ආදී පහසුකම් කිසිවක් තම නිරීක්ෂණ ආයතනයේ කටයුතු සඳහා යොදා නොගත යුතුය.

4. මැතිවරණ නිරීක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හෝ නිලධාරි මණ්ඩලයේ සාමාජිකයන් හෝ නිරීක්ෂකයන් කිසිදු දේශපාලන පක්ෂයක හෝ දේශපාලන කණ්ඩායමක අරමුණු ඔස්සේ කටයුතු නොකළ යුතුය.

5. මැතිවරණ නිරීක්ෂණ ආයතන මගින් ඡන්ද විමසීමට අදාළව මාධ්‍ය නිවේදන හා වාර්තා නිකුත් කිරීමේ දී කිසියම් පක්ෂයක් හෝ කණ්ඩායමක් නැතහොත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන හෝ අගතියට පත්වන අන්දමේ ප්‍රකාශ නිකුත් නොකිරීමට සහ සැමවිටම මධ්‍යස්ථව කටයුතු කිරීමට වගබලා ගත යුතුය.

6. මැතිවරණ නිරීක්ෂණ ආයතන විසින් මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්යයන් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා දැනුවත් කිරීමෙන් තොරව මාධ්‍ය නිවේදන හා මාධ්‍ය ප්‍රකාශ නිකුත් නොකළ යුතුය.

7. ***නිරීක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය, නිලධාරීන් සහ සියලුම නිරීක්ෂකයන් නිරීක්ෂණ කාර්යයේලා ඉටු කරනු ලබන සියලු කටයුතුවලදී දැඩි අපක්ෂපාතීත්වයෙන් යුතුව කටයුතු කිරීම අවශ්‍ය වේ. හැසිරීමෙන් මෙන්ම කතාබහෙන් ද ඒ අපක්ෂපාතීත්වය ප්‍රදර්ශනය විය යුතු අතර, අපක්ෂපාතීව කටයුතු කරන බවට ඒත්තු යා යුතුය.***

8. කිසියම් නිරීක්ෂකයකු පක්ෂග්‍රාහීව කටයුතු කරන බවට යම් පැමිණිල්ලක් ලැබුනහොත් වහාම ඔහු හෝ ඇය එම නිරීක්ෂණ කාර්යයෙන් ඉවත් කර කඩිනමින් අදාළ පැමිණිල්ල විභාග කිරීම අවශ්‍ය වේ.

9. ඡන්ද පොළ තුළ රැඳී සිටීමින් නිරීක්ෂණයෙහි යෙදීමට අවසර ඇති නිරීක්ෂකයන් ඡන්ද පොළ කාර්ය මණ්ඩලය, ඡන්ද පොළ නියෝජිතයන් හා ඡන්ද හිමියන් සමඟ අනවශ්‍ය කතා බහට නොයා යුතුය. ඡන්ද විමසීමේ සියලු කටයුතු පිළිබඳ රහස්‍යතාව ආරක්ෂා කිරීමත්, ඡන්ද පොළේදී ඒ පිළිබඳ ප්‍රකාශ පත්‍රයක් අත්සන් කර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත භාර දීමත් අවශ්‍ය වේ.

10. ජංගම හා ඡන්ද පොළ තුළ නිරීක්ෂණයෙහි යෙදෙන නිරීක්ෂකයන් පහසුවෙන් හඳුනා ගත හැකි පරිදි නිල ඇඳුමක් හෝ සුදුසු විශේෂිත ඇඳුමකින් සැරසී සිටිය යුතු අතර ඡන්ද විමසීම් දින නිරීක්ෂණයේ නිරත වන කාලය තුළ මත්පැන් පානයෙන් වැළකී සිටීම අත්‍යවශ්‍ය වේ. එසේ ඡන්ද පොළ තුළ දුම් පානය කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිතා කර ඡන්ද පොළට පැමිණීම තහනම් වේ.

11. ඡන්ද පොළ තුළ රැඳී සිටිමින් නිරීක්ෂණයෙහි යෙදීමට අවසර ඇති නිරීක්ෂකයන් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වෙත ඇති ZLOB ආකෘති වාර්තාව ලබාගෙන නියමිත ආකාරයට සම්පූර්ණකොට තම නිරීක්ෂණ ද සඳහන්කර ඡන්ද විමසීම අවසානයේ දී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිට භාර දිය යුතුය.

12. නිරීක්ෂණ සංවිධාන විසින් කරනු ලබන පැමිණිලි සියල්ලක්ම සනාථ කළ හැකි සාක්ෂි සහිත කරුණුවලට පමණක් අදාළ විය යුතු ය.

13. ඡන්ද පොළක /ඡන්ද ගණන් කිරීමේ ශාලාවක ඡන්ද විමසීමට අදාළව සිදුවිය හැකි ප්‍රමාද දෝෂයක් හෝ යම් ක්‍රම විරෝධී ක්‍රියාවක් නිරීක්ෂණය වුවහොත් එකී ප්‍රමාද දෝෂය, අතපසුවීම හෝ කාර්යය හෝ සිද්ධිය පිළිබඳව, ඡන්ද පොළේදී ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිට ද, ගණන් කිරීමේ ශාලාවේදී ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරිට ද වහාම හෙළිදරව් කළ යුතු අතර, එම කරුණු ස්වකීය ආයතනයේ නිසි බලධරයන්ට හැර අන් කිසිවකුට එවැනි හෙළිදරව්වීම් පිළිබඳ තොරතුරු ලබා නොදිය යුතුය. මැතිවරණ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමෙන් තොරව එවැනි තොරතුරු බැහැරට නිකුත් නොකිරීමට නිරීක්ෂණ සංවිධාන කළමනාකාරීත්වය වග බලා ගත යුතුය.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.
2015 ජූලි මස 18 වන දින දී ය.

මාධ්‍ය නිවේදන අංක 27

<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2015</u>

<u>අවසරලත් නිවේදිත ප්‍රචාරක කාර්යාල, ඒවායේ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම, නිහඬ කාල සීමාව තුළ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය සීමා කර තිබීම සහ නියමිත දිනයේදී ඒ ඒ කාර්යාල ඉවත්කරගත යුතු බව දැනුම්දීම.</u>

1) අවසරලත් නිවේදිත ප්‍රචාරක කාර්යාල හා ඒවායේ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම.

1.1 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන අනුව අදාළ අපේක්ෂක ගමන් කරන වාහනයේ හා අවසරලත් රැස්වීමක් පැවැත්වෙන ස්ථානයක, රැස්වීමක් පැවැත්වෙන අවස්ථාවකදී හැර පක්ෂ/ කණ්ඩායම්වල අපේක්ෂක ප්‍රවර්ධනයට අදාළ වූ ප්‍රචාරක පුවරු, ධජ පතාක, ස්ටිකර්, චිත්‍ර, අපේක්ෂක නම්, ඡායාරූප, මනාප අංක ප්‍රදර්ශනය කළ නොහැක. එසේ වුවද පවත්නා ක්‍රමය යටතේ මනාප අංක ප්‍රසිද්ධ කිරීම සඳහා අවකාශ ලබාදීම් වස් අවසරලත් නිවේදිත ප්‍රචාරක කාර්යාලවල පෙර සඳහන් ප්‍රචාරක පුවරු, දැන්වීම්, ධජ පතාක යනාදිය ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇත.

1.2 එම අනුමැතිය දී ඇත්තේ නීත්‍යානුකූල අවසරලත් කාර්යාලයක් පිහිටුවීමටත් අවශ්‍ය නම් ප්‍රචාරක, ප්‍රදර්ශන පුවරු පිහිටුවීමටත් ය. එසේ නොමැතිව, ප්‍රචාරක පුවරු පමණක් පිහිටුවීමට අනුමැතිය දීම් සිදුකර නොමැත.

1.3 එබැවින් හිස් ඉඩම්වල, පාලු හෝ වසා දමා ඇති ගොඩනැගිලි හෝ එවැනි වසා දමා ඇති කඩකාමරවල, ඉදිකිරීම් කරමින් තිබෙන හෝ අත්හැරදමා ඇති ගොඩනැගිලිවල, වර්ග අඩි 75ක වර්ග ප්‍රමාණයක්වත් නොමැති ඉතා කුඩා මඩුවල ඉදිකර ඇති හෝ සවිකර ඇති ප්‍රචාරක පුවරු වහාම ඉවත් කරවිය යුතු බව/ ඉවත් කරගත යුතු බව, අදාළ අපේක්ෂකයන්ට, ඉල්ලුම්කරුවන්ට හා ස්ථාන හිමිකරුවන්ට කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

1.4 එමෙන්ම කාර්යාල පරිශ්‍රයෙන් බැහැරව සවිකර ඇති හෝ විදුලි රැහැන් කණු/ දුරකථන රැහැන් කණු යනාදියෙහි සවිකර ඇති පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධන ප්‍රචාරක පුවරු ද ඉවත් කරවිය යුතුබව/ ඉවත්කරගත යුතු ය.

1.5 තවද පක්ෂ/ අපේක්ෂක කාර්යාල නිසිලෙස අවසර ලබාගෙන පිහිටුවා තිබේද යන්න පරීක්ෂා කරන නිලධාරීන්ට ඉදිරිපත් කිරීම සඳහා අදාළ අවසර පත්‍රය හෝ එහි පිටපතක් එකී පක්ෂ කාර්යාලයේ තිබිය යුතු ය.

1.6 යම් කිසි පක්ෂයක/ කණ්ඩායමක, කාර්යාලයක එම පක්ෂයේ/ කණ්ඩායමේ නොවන තැනැත්තන්ගේ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කළ නොහැක.

2) නිහඬ කාල සීමාව තුළ පක්ෂ/ අපේක්ෂක කාර්යාලවල ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය සීමාකර තිබීම.

2.1 2015.08.14 දින මධ්‍යම රාත්‍රියෙන් පසු මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදුකළ නොහැකි හෙයින් 2015.08.15 දින පෙරවරු 8.00ට පෙර ඡන්ද කොට්ඨාස මට්ටමින්, එනම් ඡන්ද පොළ මට්ටමින් පිහිටුවන ලද කාර්යාලවල ප්‍රචාරක පුවරු ඉවත් කරවීමට/ ඉවත් කිරීමට පියවර ගත යුතු ය.

2.2 මැතිවරණ කොට්ඨාසය නැතහොත් දිස්ත්‍රික්කය සඳහා පිහිටවනු ලැබීමට හැකි එකම එක මධ්‍ය කාර්යාලයේ පක්ෂයේ නම/ ඡන්ද ලකුණ සහිත ප්‍රචාරක පුවරුවක් ප්‍රදර්ශනය කළ හැකි ය. එහි අපේක්ෂක ප්‍රවර්ධන දැන්වීම් 2015.08.15 දින පෙරවරු 8.00ට පෙර ඉවත් කළ යුතු ය.

2.3 එක් එක් අපේක්ෂකයාට ඒ ඒ ඡන්ද ප්‍රදේශය සඳහා පිහිටුවීමට අවසර දී ඇති අතිරේක ප්‍රචාරක කාර්යාල සියල්ලෙහිම ප්‍රචාරක දැන්වීම් 2015.08.15 දින පෙරවරු 8.00ට පෙර ඉවත් කරගත යුතු ය.

2.4 2015.08.16,17,18 දින තුනෙහි මැතිවරණ කොට්ඨාසයට එකක් වන සේ අපේක්ෂකයකුට පිහිටුවිය හැකි කාර්යාලයේ හා අපේක්ෂකයාගේ නිවසේ අපේක්ෂකයාගේ, පක්ෂයේ නායකයාගේ හා පක්ෂයේ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කළ හැකිය.

3) නියමිත දිනයේදී ඒ ඒ කාර්යාල ඉවත්කළ යුතු බව

3.1 ඡන්ද කොට්ඨාස මට්ටමින් පිහිටුවනු ලබන කාර්යාලවල ප්‍රචාරක පුවරු 2015.08.15 දින පස්වරු 8.00ට පෙර ඉවත් කිරීමට අමතරව එම කාර්යාල එදින මධ්‍යම රාත්‍රියෙන් පසු ක්‍රියාත්මක නොකළ යුතු ය. එනම් එවැනි ස්ථානයක පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය කිසිදු කාර්යයක් එම කාල සීමාවෙන් පසුව සිදුකළ නොහැක.

3.2 අතිරේක ඡන්ද ප්‍රදේශ කාර්යාලවල ඇති පුවරු 2015.08.15 දින පෙරවරු 8.00ට පෙර ඉවත් කිරීමට අමතරව එම කාර්යාල ක්‍රියාත්මක වීම 2015.08.15 දින මධ්‍යාහ්න 12.00 සිට අවසන් කළයුතු වේ.

4) මෙම දැනුම්දීම කරනු ලබන්නේ පක්ෂ/ කණ්ඩායම්වල සියලුම අපේක්ෂකයන්, ප්‍රමුඛ ක්‍රියාකාරීන් හා ආධාරකරුවන් දැනුවත් කිරීමටත්, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය යහපත් වාතාවරණයක් පවත්වා ගැනීම පිණිස ඔවුන්ගේ සහාය ලබා ගැනීම අත්‍යවශ්‍ය වන හෙයිනි. එසේ නියමයන් පනවා ඇත්තේ කිසිදු පක්ෂයක් හෝ කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු අපහසුතාවට පත්කිරීම සඳහා නොව ඡන්ද නීති ක්‍රියාත්මක කිරීම අපගේ වගකීම නිසා බව, කාරුණිකව සලකනු මැනවි.

5) නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට මැතිවරණ දෙපාර්තමේන්තුව ගන්නා උත්සාහයට සහාය වීම සම්බන්ධයෙන් එසේ සහාය වන සියලුම යහපත් දේශපාලනඥයින්ට හා ක්‍රියාකාරී ආධාරකරුවන්ට මාගේ කෘතඥතාව හිමිවේ.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්
2015.08.06 වන දින රාජගිරිය, මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1925/4 - 2015 ජූලි මස 27 වැනි සඳුදා - 2015.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

ජනමත විචාරණයක දී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/මෙහෙයුම් ප්‍රතිපත්ති (Guidelines)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනවවන සංශෝධනයේ 23(5) (අ) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව/මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජනමත විචාරණයක් හෝ ඡන්ද විමසීමක් නිදහස්ව හා සාධාරණව පැවැත්වීම සහතික කිරීම සඳහා පනවනු ලබන විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය ආයතන හා ක්‍රියාකාරීන් විසින් පිළිපැදිය යුතු උපමාන පහත දැක්වේ.

1. ප්‍රචාරණය සඳහා ඉඩ වෙන්කර දීමේ දී හෝ ප්‍රවෘත්ති පත්‍රවල ඉඩ වෙන් කර දීමේ දී හෝ ගුවන් කාලය ලබාදීමේ දී තරග කරනු ලබන දේශපාලන පක්ෂයකට/ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට විශේෂ වාසියක් හෝ අගතියක් සිදු නොවන අයුරින් සියලුම මුද්‍රිත හා රූපවාහිනී සහ ගුවන්විදුලි මාධ්‍ය ආයතන සමානාත්මතාවයෙන් හා අපක්ෂපාතීත්වයෙන් කටයුතු කළ යුතු ය.

2. ප්‍රවෘත්ති ප්‍රචාරය හා දේශපාලන කටයුතුවලට සම්බන්ධ වෙනත් වැඩසටහන් විකාශය කිරීමේදී සියලුම මාධ්‍ය ආයතන නිවැරදි, සමතුළිත හා අපක්ෂපාතී තොරතුරු පමණක් ප්‍රචාරය කිරීමට වග බලා ගත යුතුය. මෙම සමතුලිතභාවය හා අපක්ෂපාතීභාවය මැතිවරණ පැමිණිලි පිළිබඳ නිත්‍ය නියෝජිත කමිටුව හා මාධ්‍ය උපමාන නියෝජිත කමිටුවේ නිරීක්ෂණයට නිරතුරුව භාජනය වේ.

3. ප්‍රවෘත්ති පත්‍රවල කර්තෘ අදහස් ව්‍යාකූල මෙන්ම සමබර නොවීමට ඉඩඇති බැවින්, එවැනි කර්තෘ අදහස් විද්‍යුත් මාධ්‍ය මගින් විකාශය නොකළ යුතුය. කිසියම් හේතුවක් නිසා එවැනි අදහස් ප්‍රකාශ කිරීමක් කළ හොත්, ඊට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව අගතියට පත් පාර්ශවය විසින් ඉල්ලා සිටිය හොත් ඒ සඳහා අවස්ථාව ලබාදිය යුතුය.

4. රූපවාහිනී නාලිකා මගින් හා ගුවන් විදුලි නාලිකා මගින් පුවත්පත් සිරස්තල පිළිබඳව හා කාටූන් පිළිබඳව කෙරෙන විග්‍රහයන්හි දී මෙන්ම එවැනි කරුණුවලට අදාළ සාකච්ඡාවන්හි දී වැඩසටහන් ඉදිරිපත් කරන/මෙහෙයවන තැනැත්තාගේ පෞද්ගලික මතිමතාන්තර දැක්වීමට යාමෙන් එක් පාර්ශ්වයක් ප්‍රවර්ධනය කෙරෙන අතර, තවත් පාර්ශ්වයක් අගතියට පත් කෙරෙන බැවින් එවැනි පෞද්ගලික මත ප්‍රචාරය කිරීමෙන් වැලකී සිටීම යෝග්‍ය වේ.

5. ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී විධිමත් හා නීත්‍යානුකූල නොවන දැන්වීම් පළ නොකිරීම හා පක්ෂපාතී වැඩසටහන් ප්‍රචාරය/විකාශය නොකිරීම හෝ අතිරේක පළ නොකිරීම සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති අංශයේ හා කාලීන තොරතුරු විකාශය භාර අංශවල වගකීම වේ.

1A - PG 2493 — 206 (2015/07)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

6. යම් සිද්ධියක් හෝ කර්යයක් පිළිබඳව කරුණු ප්‍රචාරය/විකාශය කිරීමේදී යම් අපේක්ෂකයකු විසින් අදහස් ඉදිරිපත් කරන විට එම කරුණ ගැන උනන්දුවක් හෝ සැළකිල්ලක් දක්වන හෝ එම කරුණු මගින් බලපෑමක් ඇතිවිය හැකි තරග කරන අනෙකුත් පක්ෂවලටද කරුණු ඉදිරිපත් කිරීමට ඒ අවස්ථාවේදීම හෝ වෙනත් අවස්ථාවක දී ඉඩ ප්‍රස්ථා සලසා දිය යුතු ය.

7. ඡන්ද විමසීම් කාල සීමාව තුළ ප්‍රචාරය/විකාශය කරනු ලබන මැතිවරණයට සෘජුවම සම්බන්ධ වන සියලුම වාර්තාමය වැඩසටහන් හෝ විශේෂ වැඩසටහන් ප්‍රචාරය/විකාශය කිරීමේදී පිටපත්කරු, නිවේදක හා සංස්කාරකවරුන්ගේ නම් සඳහන් කළ යුතු ය. එසේ වුවද ජනමාධ්‍ය ආචාරධර්ම අනුව පිටපත්කරු, නිවේදක හා සංස්කාරකවරුන්ගේ නම් ප්‍රසිද්ධ නොකිරීමේ අයිතිය තබා ගැනීමට යම් ආයතනයක් අපේක්ෂා කරන්නේ නම්, එම අවස්ථාවේදී විකාශනය භාරව සිටින නිලධාරියා එම වැඩසටහනේ වගකීම භාර ගත යුතු වේ.

8. ඡන්ද විමසීමක දී තරග කරනු ලබන අපේක්ෂකයන්ට විරුද්ධව කරනු ලබන සාධාරණ තහවුරු කිරීමක් කළ නොහැකි චෝදනා ප්‍රවෘත්ති ප්‍රකාශනවලදී හෝ වැඩසටහන්වල දී ප්‍රචාරය/විකාශය කිරීමෙන් වැළකී සිටිය යුතු ය. වෙනත් අපේක්ෂකයකු හෝ ආධාරකරුවකු විසින් යම් කිසි මාධ්‍ය හරහා තමන් සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයක් අසත්‍ය බවට යම් කිසි තරග කරන අපේක්ෂකයකු හෝ පක්ෂයක් කරුණු ඉදිරිපත් කළ හොත් අදාළ ප්‍රකාශයට ලබා දුන් ප්‍රසිද්ධියට සමාන අවස්ථාවක් එකී ප්‍රතිවිරුද්ධ කරුණු දැක්වීම සඳහා ලබා දිය යුතු ය.

9. රාජකාරීමය උත්සව සහ අපරාධ සම්බන්ධ සිදුවීම් ඡන්ද විමසීමට අදාළ නොවන ප්‍රවෘත්ති විසුරුවා හැරීමේදී වුවද එමගින් කිසියම් පක්ෂයකට හෝ අපේක්ෂකයකුට ප්‍රවර්ධනයක් හෝ අගතියක් වන බව පෙනී ගියහොත් අදාළ අනෙකුත් පාර්ශවයන්ගෙන් ද කරුණු විමසා ප්‍රචාරය කිරීමට සියලුම මාධ්‍ය ආයතන සුපරීක්ෂාකාරී විය යුතු ය.

10. ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ රජයේ අමාත්‍යවරු සම්බන්ධවන දේශපාලන මත/අදහස් ප්‍රකාශ කිරීමේ රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහන් මෙහෙයවීමේ දී එය ඔහු හෝ ඇය අයත්වන දේශපාලන පක්ෂයේ වැඩසටහනක් ලෙස සැලකිය යුතු ය. එහෙයින් එයට විරුද්ධ අදහස් දරන දේශපාලන පක්ෂවල නායකයන්ටද, ඒ හා සමාන වැඩසටහන් ලබා දිය යුතුය. මුද්‍රිත මාධ්‍යද ඒ අයුරින් දේශපාලන පක්ෂවලට/අපේක්ෂකයින්ට විශේෂ සාකච්ඡා ලබාදීමේදී පක්ෂ රැස්වීම් වාර්තා පළ කිරීමේ දී සමාන ඉඩක් හා ප්‍රමුඛතාවක් ලබාදිය යුතුය.

11. යම් අපේක්ෂකයකුට හෝ අපේක්ෂකයන් කිහිප දෙනකුට විශේෂ සැලකිල්ලක් දක්වා ඔහු ප්‍රවර්ධනය වන අයුරින් හෝ වෙනත් අපේක්ෂකයින් හට අගතියක් වන අයුරින් හෝ ගුවන් කාලය හෝ ප්‍රවෘත්ති පත්‍ර ඉඩකඩ වෙන්කිරීම නොකළ යුතු ය.

12. රාජ්‍ය නිලධාරීන් විසින් පවත්වනු ලබන දේශන සම්මුඛ සාකච්ඡා ආදිය ඡන්ද විමසීමට ඉදිරිපත් වී ඇති අපේක්ෂකයකු ප්‍රවර්ධනය කෙරෙන හෝ වෙනත් අපේක්ෂකයන් අගතියට පත්වන අයුරින් ප්‍රචාරය/විකාශය කිරීමෙන් සියලුම මාධ්‍යයන් වැළකී සිටිය යුතු ය.

13. දේශපාලනමය කරුණු පිළිබඳව කෙරෙන හෝ ඡන්ද විමසීම් හා බැඳි කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගීවන්නන් තෝරාගැනීමේ දී සියලුම විද්‍යුත් මාධ්‍ය ආයතන සැබෑ ලෙස තරග කරන සියලුම පාර්ශව වලට සාධාරණ ලෙස කටයුතු කළ යුතු අතර අන් අයට අගතියක් නොවනසේ සාකච්ඡාව මෙහෙයවිය යුතු ය. යම් වැඩසටහනකට සහභාගීවන කිසියම් නියෝජිතයකුට අදාළ භාෂාවේ මනා ප්‍රවීණත්වයක් නොමැතිවීම හේතුවෙන් ඔහුට/ඇයට අගතියක්වන ආකාරයට වැඩසටහන මෙහෙයවීමෙන් වැළකිය යුතුය. මුද්‍රිත මාධ්‍ය විසින් සම්මුඛ සාකච්ඡා ලබාගෙන ප්‍රසිද්ධ කිරීමේදීද භාෂා ප්‍රවීණතාව නොමැතිවීම නිසා එම සාකච්ඡාවට සහභාගීවන තැනැත්තා අපහසුතාවට පත්වන අයුරින් ක්‍රියා නොකළ යුතු ය. අපැහැදිලි හෝ තේරුම් ගැනීමට අපහසු ප්‍රශ්න හරහා ලබාගන්නා තොරතුරු ප්‍රසිද්ධ නොකළ යුතු ය. සනාථ කළ නොහැකි හෝ ජන කොට්ඨාස අතර වෛරී සහගත හැඟීම් ඇති වන ආකාරයේ හෝ සදාචාර විරෝධී හෝ කරුණු ප්‍රකාශ කිරීමෙන් වළකින ලෙසට සහභාගී වන්නන්ට සාකච්ඡා ආරම්භයේ දීම ප්‍රසිද්ධියේ දැනුම් දිය යුතු අතර, සාකච්ඡාව අතරතුර දී එවැනි අයෝග්‍ය ක්‍රියාවන් සිදුවුවහොත් වැඩසටහන අත්හිටුවිය යුතු ය.

14. දුරකථන මාර්ගයෙන් ප්‍රශ්න හා තොරතුරු ලබා ගනිමින් පවත්වනු ලබන වැඩසටහන්වල දී සියලුම අමතන්නන්ට ඔවුන්ගේ ප්‍රශ්න හා යෝජනාවල අඩංගු කරුණු කුමක් වුවද එම අයට සමාන අවස්ථා ලබාදිය යුතු ය. එමෙන්ම එවැනි වැඩසටහන්වල සමබරතාව පිළිබඳව වැඩසටහන මෙහෙයවන හා ඊට සම්බන්ධවන සියලුම නිලධාරීන් වගකිව යුතු ය.

15. කිසියම් විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක සභාපතිවරයකු, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු හෝ වගකිව යුතු මාධ්‍යවේදියකු දේශපාලන කටයුතුවල ක්‍රියාකාරිව නිරතව සිටී නම් එයින් සමබර ප්‍රවෘත්ති/ප්‍රචාරණ කටයුතු විකාශනයට බාධාවන අතර ගැටළුකාරී තත්ත්වයන් මතුවිය හැක. එබැවින් එවන් අවස්ථාවල දී පහත සඳහන් කරුණු ආයතනයේ කළමනාකාරීත්වයෙහි දැනගැනීම සඳහා ලිඛිතව වැඩසටහනට පෙර අදාළ නිලධාරීන්/සේවකයන් විසින් දැනුම් දිය යුතු ය.

(අ). එවැනි පුද්ගලයන්ගේ මැදිහත්වීමේ ස්වභාවය
(ආ). පුද්ගලයාගේ රැකියාවේ ස්වභාවය හා මට්ටම
(ඇ). වැඩසටහන් සකස් කිරීමේදී එවැනි පුද්ගලයන්ගේ බලපෑම හා මැදිහත්වීමේ ප්‍රමාණය

16. පිළිගත් දේශපාලන පක්ෂයක ප්‍රධාන නිලයක් (නායක, සභාපති, ලේකම්, ජාතික සංවිධායක, භාණ්ඩාගාරික, නියෝජ්‍ය නායක, උපනායක, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපති හෝ ඒ හා සමාන බලතල ඇති) දරන තැනැත්තෙකු මාධ්‍ය ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ප්‍රධාන විධායක/ප්‍රධාන කර්තෘ වැනි ප්‍රමුඛ තනතුරක් දරන විටදී එකී තැනැත්තා එකී ඡන්ද විමසීමේදී අපේක්ෂකයකු වන්නේ නම්, හෝ ඔහු/ඇය ප්‍රමුඛ නිලයක් දරන පක්ෂයක ඡන්ද විමසීමේදී සෘජුවම හෝ පිළිගත් සන්ධානයකින් තරඟයට එලඹ ඇත්නම් එකී කාල සීමාව තුළදී ඔහු/ඇය මාධ්‍ය ආයතනයේ තනතුරෙහි ක්‍රියාකාරිව කටයුතු කිරීමෙන් වැළකී සිටිය යුතු ය. තවද යම් ඡන්ද විමසීමක දී තරග කරන පක්ෂයකට ප්‍රධාන නිලයක් දරන තැනැත්තෙකු හෝ ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු ලෙස තරග කරන තැනැත්තෙකු එකී ඡන්ද විමසීම් කාල සීමාව තුළ රූපවාහිනී හෝ ගුවන් විදුලි මාධ්‍යවල දේශපාලනමය වැඩසටහන් මෙහෙයවීමෙන් වැළකී සිටිය යුතු අතර මුද්‍රිත මාධ්‍යයක නිත්‍ය සේවයේ නිරතව සිටින්නේ නම් එකී මාධ්‍ය හරහා ස්වකීය දේශපාලනමය ලිපි/ලේඛන ප්‍රසිද්ධ කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

17. කිසියම් මාධ්‍ය ආයතනයක් විසින් ඉදිරිපත් කරන සාකච්ඡාවකට හෝ සම්මුඛ සාකච්ඡාවකට සහභාගීවීම කිසියම් පක්ෂයක්/පුද්ගලයකු විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක සහ එසේ ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතු ඉදිරිපත් නොකරන අවස්ථාවක මාධ්‍ය ආයතන විසින් එවැනි පක්ෂයක්/පුද්ගලයෙකු අපහසුතාවට පත්වන අයුරින් ක්‍රියා නොකළ යුතු ය. එවැනි අවස්ථාවල දී හිස් පුටුව ප්‍රදර්ශනය කිරීම වැනි නාට්‍ය ස්වරූපගත උපායන් යෙදීම වෙනුවට සෘජු හා සරල නිවේදනයක් මගින් සහභාගී නොවීම ප්‍රකාශ කිරීම යෙහෙකි.

18. මත විමසුමක ප්‍රතිඵල විද්‍යුත් මාධ්‍යයෙන් විකාශය කිරීමෙන් හෝ මුද්‍රිත මාධ්‍යයෙන් පළ කිරීමෙන් එම මත විමසුම පවත්වන ලද සංවිධානය හඳුන්වාදීම, එම කාර්ය පවරන ලද හා ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදුන් ආයතන හෝ තැනැත්තා, ඒ සඳහා භාවිතා කළ ක්‍රමය, නියැදියේ ප්‍රමාණය, දෝෂ සීමාව සහ ක්ෂේත්‍රයේ කටයුතු කළ දින වකවානු සඳහන් කළයුතු ය. මත විමසුම පවත්වන ලද අවස්ථාවේ පැවැති මහජන මතය පමණක් එයින් පිළිබිඹුවන බව විකාශක හෝ ප්‍රකාශක විසින් සඳහන් කළ යුතු ය.

19. තරඟයට එළැඹ සිටින අපේක්ෂකයකු විසින් වෙනත් පක්ෂයක හෝ කණ්ඩායමක හෝ ප්‍රතිවිරුද්ධ පක්ෂයක/කණ්ඩායමක අපේක්ෂකයකුගේ ජයග්‍රහණය ප්‍රවර්ධනය කිරීම සඳහා කරන ලද ප්‍රකාශ විකාශය නොකළ යුතු ය. ප්‍රසිද්ධ නොකළ යුතු ය.

20. මැතිවරණ කොමිෂන් සභාව/මැතිවරණ කොමසාරිස් විසින් දෙන ලද ලිඛිත අවසරයක් නොමැතිව ඡන්ද මධ්‍යස්ථානය තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථාන තුළ ඡායාරූප ගැනීම වීඩියෝ කිරීම තහනම් කර ඇති බැවින් එසේ කිරීමෙන් වැළකී සිටීමට සියලුම මාධ්‍ය වේදීන් ක්‍රියා කළ යුතු අතර අනවසරයෙන් ලබා ගන්නා එවැනි ඡායාරූප වීඩියෝ දර්ශන ප්‍රවත්පත්වල පළ කිරීමෙන් හෝ විද්‍යුත් මාධ්‍යවලින් විකාශය කිරීමෙන් වැළකිය යුතු ය. අවසර ලබා ගැනීමෙන් පසුව ලබා ගන්නා ලද දර්ශන පවා පළ කිරීම හෝ විකාශය කිරීම කළ යුත්තේ ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුවය.

21. පෙර අවස්ථාවලදී විකාශය කළ හෝ පළ කරන ලද අදහස් සාකච්ඡා හා වාද විවාද සහ එබඳු වැඩසටහන්ද ඡන්ද විමසීම සිදුකරන දිනයට පූර්වයෙන් වූ පැය 48 ක කාලය තුළදී නැවත ප්‍රචාරය/විකාශය කිරීම හෝ පළ කිරීම සිදු නොකළ යුතු ය. ඡන්ද විමසීම්වලට අදාළව පක්ෂ/අපේක්ෂක ප්‍රචාරක කටයුතුවලදී දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් විසින් ප්‍රකාශයට පත්කරන ලද ප්‍රතිපත්ති සහ පොරොන්දු පිළිබඳව ඡන්ද දායකයාට මධ්‍යස්ථව සලකා බැලීමට හැකි පරිදි නිහඬ වාතාවරණයක් ඡන්ද විමසීම් දිනයට පෙර ඇති කිරීම වැදගත්වන බැවින් ඡන්ද විමසීමේ දිනට පෙර නිහඬ කාලය වශයෙන් (ප්‍රචාරණ කටයුතු වලින් වැළකී සිටිය යුතු කාලය) ලෙස නීතියෙන් නියම කර ඇති (පැය 48ක) කාලසීමාව තුළදී, මැතිවරණයට අදාළ සාකච්ඡා, වාද විවාද ප්‍රචාරක දැන්වීම් ආදිය ප්‍රදර්ශනය කිරීමෙන් හා පළ කිරීමෙන් මාධ්‍ය ආයතන වැළකී සිටිය යුතු ය.

22. ශ්‍රී ලාංකිකයින්ගේ ආගමික විශ්වාසයන් හා ඇදහිලි, ශ්‍රී ලාංකිකයන් විසින් භාවිතා කරන භාෂා, ඔවුන්ගේ වාර්ගිකත්ව, චාරිත්‍ර චාරිත්‍ර හා වෙනත් කුළ ගෝත්‍ර ආදී වෙනස්කම් පිළිබඳව පුද්ගලයන් තුළ වෛරය හා නොඉවසන සුළු බව ඇති කිරීම හෝ උග්‍ර වන ආකාරයට ප්‍රචාරණ කටයුතු සිදු කිරීම හෝ නොකළ යුතු ය.

23. වෛරී සහගත දේශපාලනය, පාක්ෂිකයන් අතර හා සමාජය තුළ වර්ධනය වන ආකාරයේ ප්‍රචාරණ කටයුතුවලින් වැළකී සිටිය යුතු ය.

24. යම් අපේක්ෂකයෙකු හෝ ආධාරකරුවකු වෙනත් පක්ෂයක හෝ කණ්ඩායමක අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් අතීතයේ දී (පූර්වයෙන්) කරන ලද ප්‍රකාශයක් ප්‍රකාශය කර තැනැත්තාට අගතියක් වන සේ හෝ අනික් තැනැත්තා ප්‍රවර්ධනය කිරීමක් සිදු වන සේ ප්‍රකාශකරුගේ එකඟත්වය හෝ අනුමැතියකින් තොරව එවැනි පූර්වයෙන් කරන ලද ප්‍රකාශ නැවත පළ කිරීමෙන් හෝ විකාශය කිරීමෙන් වැළකී සිටීම යෝග්‍ය වන අතර තමා විසින් අන් අයකු හෝ පක්ෂයක් සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශ නැවත නැවත ප්‍රචාරය කිරීමෙන් වැළකී සිටින ලෙස අදාළ ප්‍රකාශය කර ඇති තැනැත්තා කරනු ලබන ඉල්ලීම් සඳහා අනුකූලතාව දක්විය යුතු ය.

25. නිර්නාමික හා ප්‍රකාශකයාගේ නම සඳහන් නොකර ව්‍යාජ පුද්ගල හෝ සංවිධානවල නම් යොදා ගනිමින් කරනු ලබන දැන්වීම් හා ප්‍රචාරණ මාධ්‍ය ආයතන මඟින් නොකළ යුතු අතර ඒ සම්බන්ධයෙන් වන වගකීම අදාළ මාධ්‍ය ආයතන වෙත පැවරේ.

26. ජාතික ගීය, ජාතික ධජය, ආගමික සංකේත, ආගමික ධජ, ආගමික ශාස්තෘවරුන්ගේ හෝ ආගමික නායකයින්ගේ සිතුවම් හෝ ඡායාරූප, පක්ෂ/කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනයට හෝ අගතියකට හේතුවන පරිදි ප්‍රචාරණය හෝ විකාශය නොකළ යුතු ය. එවැනි දෑ ඇතුළත් දැන්වීම් ප්‍රචාරණය හෝ විකාශය නොකළ යුතු ය.

27. අසත්‍ය ප්‍රකාශ/ප්‍රවෘත්ති පළ කිරීම් පිළිබඳව පූර්ණ වගකීම ප්‍රකාශය කර තැනැත්තා මෙන්ම එම මාධ්‍ය ආයතනය විසින් ද භාරගත යුතු අතර ඒ සම්බන්ධයෙන් පැන නගින නීතිමය ප්‍රශ්න සඳහා අදාළ සියලුම දෙනා නීතියෙන් නියම කර ඇති පරිදි වගකීමට බැඳේ.

28. මාධ්‍ය සදාචාරයට සහ ආචාර ධර්මවලට අනුකූලව හා ඒවා උල්ලංඝණය නොවන අයුරින් ක්‍රියාකිරීම සියලුම විද්‍යුත්/මුද්‍රිත මාධ්‍ය ආයතනවල වගකීම වේ.

29. රාජ්‍ය මාධ්‍ය ආයතන විසින් පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂක ප්‍රවර්ධනය පිණිස රාජ්‍ය දේපළ හා අරමුදල් භාවිතය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ නීති විරෝධී ක්‍රියාවක් වන අතර රජයට අයවිය යුතු මුදල් අය නොකිරීම හා වෙනත් ආකාරයකින් ආයතනයට අලාභ වන අන්දමින් ක්‍රියා කිරීම ද වරදක් වේ. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් නියම කර ඇති දඬුවම් වලට අමතරව විනයානුකූලව කටයුතු කිරීමට ද විධිවිධාන සලසා ඇති හෙයින් එවැනි කටයුතුවලින් සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය මාධ්‍ය ආයතන වැළකී සිටිය යුතු ය.

30. ඉහත සඳහන් මාධ්‍ය උපමාන ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීමට සියළුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හිමිකරුවන් ක්‍රියා කරනු ඇතැයිද ඒ අයුරින් තම ආයතන ක්‍රියාත්මක වන බවට ඔවුන් විසින් වගබලා ගනු ඇතැයිද අපේක්ෂා කෙරේ.

31. ඉහත සඳහන් කර ඇති උපමාන අදාළ වන පරිදි ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී ඒ අයුරින්ම අනුගමනය කිරීමට සමාජ වෙබ් අඩවි හිමිකරුවන් හා නිර්මාණකරුවන් විසින් ද කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

32. මෙම මාධ්‍ය උපමානවලට අනුකූලව ක්‍රියා කිරීම මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ හා සමාජ වෙබ් අඩවි පවත්වත්නන්ගේ/භාවිතා කරන්නන්ගේ යුතුකමක් පමණක් නොව වගකීමක් ලෙස සැලකීම අවශ්‍ය වේ. මක්නිසාද යත් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මෙම මාධ්‍ය උපමානවලට අනුකූලව ක්‍රියා කිරීම අත්‍යාවශ්‍ය හෙයිනි.

33. ඉහත මාධ්‍ය උපමාන ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින ගැටලු සම්බන්ධයෙන් පිළිගත් දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන් හා මැතිවරණ පැමිණිලි විමර්ෂන සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ නිලධාරීන් හා මැතිවරණ කොමසාරිස් විසින් පිළිගත් දේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන්ගෙන් සමන්විත නිත්‍ය නියෝජිත කමිටුවේ දී සාකච්ඡා කර එමගින් ලබා ගත්තා නිර්දේශ හා අදාළ වන විට, මානව හිමිකම් කොමිෂන් සභාවේ අදහස්/නිර්දේශ ද සලකා බලා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් හා මාධ්‍ය ආයතන නිත්‍ය නියෝජිතයන්ගෙන් සමන්විත මාධ්‍ය උපමාන බලාත්මක කමිටුවේ තීරණ වලට අනුව ක්‍රියා කළ යුතුය. එනම් මෙම මාධ්‍ය උපමාන ක්‍රියාත්මක කිරීමට අදාළ මග පෙන්වීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම පෙර සඳහන් මාධ්‍ය උපමාන බලාත්මක කිරීමේ කමිටුවේ පොදු එකඟතාව මත සිදුකරනු ලැබිය යුතු ය.

34. කිසියම් දේශපාලන පක්ෂයක්/අපේක්ෂකයකු විසින් ඉහත උපමාතවලට පටහැනි වන අයුරින් කරනු ලබන නියෝගයක්, ඉල්ලීමක් ප්‍රචාරණයට හෝ පළ කිරීමට මාධ්‍ය ආයතනයක් හෝ මාධ්‍යකරුවකු බැඳී නොසිටී. එවැනි අවස්ථාවක දී මාධ්‍ය ආයතනයකට හෝ මාධ්‍යවේදියාට නීතියේ පිහිට පැතීමට ඇති අයිතිය පිළිගත යුතු ය.

* මෙම මාධ්‍ය උපමාන නිකුත් කර ඇත්තේ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය යහපත් වාතාවරණය පවත්වා ගැනීම පිණිස හෙයින් මෙම උපමාතවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා මාධ්‍ය ආයතනවලට අවශ්‍ය සහාය ලබාදීම සහ මෙම උපමාතවලට අනුකූලව ක්‍රියා කරන මාධ්‍ය ආයතනවලට බාධා කිරීමෙන් වැළැකී සිටීම සියලුම දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් හා දේශපාලන ක්‍රියාකාරීන්, නිරීක්ෂණ සංවිධාන සහ සිවිල් සංවිධාන වෙත මෙන්ම සියලුම පුරවැසියන් වෙත පැවරෙන වගකීමක් වේ. එහෙයින් මෙම උපමාතවලට අනුගතව ක්‍රියාකිරීමට සියලුම මාධ්‍ය ආයතන වෙත අවශ්‍ය සහාය ලබාදීමට අදාළ සියලුම පාර්ශව කටයුතු කරනු ඇතැයි මැතිවරණ කොමිෂන් සභාව නැතහොත් මැතිවරණ කොමසාරිස් අපේක්ෂා කර සිටී.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015.07.19 දින දීය.

සටහන :

පූර්ව ඡන්ද විමසීම් සඳහා නිකුත් කර තිබූ මාධ්‍ය උපමාන ඇසුරෙන් සැකසූ කෙටුම්පත මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කරන ලද බවත් ඉන් අනතුරුව එකී ආයතන ප්‍රධානීන් විසින් නම් කරන ලද නිත්‍ය නියෝජිතයන් සමග සාකච්ඡා කිරීමෙන් ලද පොදු එකඟතාවද සහිතව මෙහි මාධ්‍ය උපමාන ප්‍රසිද්ධියට පත් කරනු ලබන බව සැලකිය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1924/44 - 2015 ජූලි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2015.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2015 පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා වලංගු වන සේ නැවත නිකුතුවකි

ඡන්ද විමසීම්වලදී තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයින් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය

2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(8) වැනි වගන්තිය අනුව නිකුත් කෙරෙන මෙම ආචාර ධර්ම පද්ධතිය ඡන්ද විමසීමකට අදාළ නාමයෝජනා දැන්වීම පළකරනු ලබන දින සිට ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කිරීම දක්වා කාලයට අදාළ වේ.

මැතිවරණ නීතියට අනුව දේශපාලන පක්ෂ පිළිගැනීමට ප්‍රථම මෙරට ජනතාව තුළ සමාජගත වූ දේශපාලන පක්ෂ තිබූ අතර, ඒ පිළිබඳ ඉතිහාසය 1931 වර්ෂය දක්වා ඇතට දිවේ. දේශපාලන පක්ෂ පිළිගැනීම පිළිබඳ නීති 1959 සිට විවිධ අවස්ථාවල සංශෝධනය වී ඇත. වත්මන් සමාජ ප්‍රගමනය වෙනුවෙන් දේශපාලන පක්ෂ විසින් සිදු කරනු ලබන මෙහෙය, වඩාත් අර්ථවත් හා ඵලදායී වීමට නීති රීති මාර්ගයෙන් කළ හැකි දේ සීමා සහිත බැවින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍ය යහපත් වාතාවරණය පවත්වා ගැනීමේ වැඩි වගකීම දේශපාලන පක්ෂ වෙත පැවරේ.

එම වගකීම ද සැලකිල්ලට ගෙන 2012 වර්ෂයේ පැවැත්වූ පළාත් සභා ඡන්ද විමසීම් අරමුණු කරගෙන ප්‍රථම වරට මෙම ආචාර ධර්ම පද්ධතිය මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. තවද 2012 වර්ෂයේ සිට පැවැත්වූ ඡන්ද විමසීම්වලදී ද මෙම ආචාර ධර්ම පද්ධතියේ සඳහන් කරුණු හා සමානව සකස් කරන ලද ආචාර ධර්මවලට පක්ෂ ලේකම්වරුන්ගේ එකඟතාව හා මැතිවරණ පැමිණිලි විමර්ශනය සඳහා වූ දේශපාලන පක්ෂ නියෝජිතයන් හා නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන්ගේ එකඟතාවද ලැබී තිබේ.

මෙම ආචාර ධර්ම පද්ධතිය 2015 පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී තරග කරනු ලබන දේශපාලන පක්ෂවල නායකයන්, ලේකම්වරුන් ඇතුළු සියලුම ප්‍රමුඛ තනතුරුධාරීන්ට, තරග කරන අපේක්ෂකයන්ට, පළාත් සභා හා පළාත් පාලන ආයතන නියෝජනය කරනු ලබන දේශපාලනඥයින්ට හා සියලුම දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්ට මෙන්ම අපේක්ෂකයන්ගේ ආධාරකරුවන්ට ද අදාළ වන බව සැලකිය යුතු වේ. ශ්‍රී ලංකාවේ ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් වන දේශපාලන පක්ෂවලින් බැහැර අපේක්ෂකයින් නියෝජනය වන්නේ ස්වාධීන කණ්ඩායම් වශයෙන් බැවින් මෙම ආචාර ධර්ම පද්ධතිය එම ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයින්ට ද අදාළ වන සේ නිකුත් කර ඇත.

එබැවින් මෙහි සඳහන් ආචාර ධර්මවලට අනුකූලව ක්‍රියා කරන ලෙස පෙර සඳහන් සියලුම තැනැත්තන් වෙත කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

1A - PG 2492 — 08 (2015/07)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අ. නීතියේ ආධිපත්‍යය

01. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා අනෙකුත් නීතිවලින් සහතික කර ඇති පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි මැතිවරණ නීතිවලට අනුකූලව මහජන නියෝජිතයින් තෝරා ගැනීමට අදාළව පවත්වනු ලබන ඡන්ද විමසීම්වල දී හෝ ජනමත විචාරණයක දී ඡන්ද දායකයාට නිදහසේ සහ කිසිදු බලපෑමකින් තොරව සිය ඡන්දය ප්‍රකාශ කිරීමට අවකාශය සැලසීම හා ඊට අවශ්‍ය ආධාර හා අනුබල ලබාදීම.

02. ඡන්ද විමසීමක් වෙනුවෙන් ඉදිරිපත් වන සියළුම දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන්ට මැතිවරණ ක්‍රියාවලියේ දී හිමිවන සම අයිතිවාසිකම් සෑම පියවරක දීම ආරක්ෂා කිරීම.

03. සියලුම දේශපාලන පක්ෂවලට හා අපේක්ෂකයින්ට හිමිවන අයිතිවාසිකම් හා ඡන්ද දායකයින් දැනුවත් කිරීමට ඇති අයිතියට ගරු කරමින් විරුද්ධ මතධාරීන්ට ඔවුන්ගේ මතය දැරීමට හා ඒ වෙනුවෙන් නීත්‍යනුකූලව ප්‍රචාරක කටයුතු/ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට ඇති අයිතියට බාධා නොකිරීම.

04. ශ්‍රී ලංකාවේ බල පවත්නා නීතිවලට අනුකූලව පිහිටුවා ඇති රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික හෝ වෙනත් ආයතනවලට නීතියෙන් අපේක්ෂා කර ඇති නැතහොත් නියමකර ඇති ආකාරයට කටයුතු පවත්වාගෙන යාමට කිසිදු ආකාරයකින් බාධා හෝ බලපෑම් නොකිරීම.

05. රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම පැවරී ඇති ආයතනවලට හා එම කටයුතු පැවරී ඇති අයට අදාළ රාජකාරි ඉටු කිරීමේ දී බාධා හෝ බලපෑම් නොකිරීම.

06. සාමාන්‍ය ජන ජීවිතයට බාධා නොවන අයුරින් සහ පවත්නා නීති රීති උල්ලංඝණය නොවන අයුරින් ඡන්ද විමසීම් ප්‍රචාරක කටයුතු සිදු කිරීම පිළිබඳව සහතික කිරීම.

07. සෑම ඡන්ද විමසීමකටම අදාළ පනත්වල දැක්වෙන නීති රීති (වගන්ති) ගැන සියලු අපේක්ෂකයින්ට හා ප්‍රමුඛ ක්‍රියාකාරීන්ට අවබෝධයක් ලබා දීම සහ එම පනත්වල දැක්වෙන වැරදි, දූෂණ ක්‍රියා සහ නීතිවිරෝධී ක්‍රියාවලින් වළකින ලෙස උපදෙස් දීම.

08. ඡන්ද විමසීමට හෝ ඡන්ද ගණන් කිරීමට හේතු පාදක වන ද්‍රව්‍ය, උපකරණ, ලිපි ලේඛන නිසි බලධරයකුගේ අවසරයකින් තොරව ස්පර්ශ කිරීම හෝ ගබඩා කර ඇති ස්ථානයෙන් ඉවතට ගෙන යාමෙන් වැළකීම.

ආ. සාමාන්‍ය හැසිරීම

01. ශ්‍රී ලාංකිකයින් අදහන ආගම්, භාවිතා කරන භාෂාව, ඔවුන්ගේ වාර්ගිකත්වය, චාරිත්‍ර වාරිත්‍ර හා කුලගෝත්‍ර ආදී වෙනස්කම් සම්බන්ධයෙන් යම් ජන කොට්ඨාසයක හෝ යම් පුද්ගලයින් පිරිසකගේ හෝ වෛරය හෝ තොඉවසනසුලු බව උග්‍රවන ආකාරයට හෝ හැසිරීමෙන් වැළකීම සහ එවැනි හැඟීම් ඇතිවන අයුරින් අදහස් හෝ කරුණු ප්‍රකාශ නොකිරීම.

02. දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් සිදු කරන විවේචන, ඒ ඒ පක්ෂයේ ප්‍රතිපත්තිවලට, වැඩසටහන්වලට හා අතීත ක්‍රියාකාරකම්වලට සීමා කළ යුතු අතර විරුද්ධවාදී පාක්ෂිකයන්ගේ හෝ අපේක්ෂකයන්ගේ පොදු කටයුතුවලට සම්බන්ධයක් නොමැති ඔවුන්ගේ පෞද්ගලික කටයුතු විවේචනය කිරීමෙන් වැළකීම හා සභ්‍යව කර නොගත් චෝදනා, සභ්‍යව කළ නොහැකි කරුණු සහ විකෘති කළ අදහස් මත විවේචන සිදු නොකිරීමට වග බලා ගැනීම.

03. තෝරා පත් කර ගැනීම මඟින් පිහිටුවීමට අපේක්ෂා කරනු ලබන ව්‍යවස්ථාපිත ආයතනයේ අරමුණු ඉටුකරලීම මඟින් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ අනාගත අභිවෘද්ධිය සාක්ෂාත් කරලීමට ඇපකැපවිය හැකි අපේක්ෂකයින් තරඟයට ඉදිරිපත් කොට ඔවුන් විනයක් හා භික්මීමක් ඇතිව තරඟයේ දී මෙහෙයවීම.

04. දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නායකයින් විසින් අපේක්ෂකයන් තරඟය සඳහා තෝරා ගැනීමේ දී ඔවුන්ගේ පූර්ව කල් ක්‍රියාවල යහපත්භාවය, නීතියට ගරු කරමින් ක්‍රියා කිරීම, නීතිය ඉදිරියේදී වරදකරුවන්ව නොසිටීම, මහජන සේවයට කැපවී සිටීම, ධනබලය හෝ සාමාජීය බලය නිසා ජන සමාජය පීඩාවට පත් නොකිරීම යනාදී ගුණාංග කෙරෙහි අවධානය යොමුකර කටයුතු කිරීම.

05. නාමයෝජනා භාරදෙන විට හෝ ඉන්පසු දින 30 ක් ඉකුත් වීමට පෙර සියළුම අපේකෂකයින් විසින් ඔවුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ තේරීම් භාර නිලධාරීට භාරදීම.

06. ඡන්ද පොළ පරිශ්‍රය තුළ හෝ ඡන්ද ගණන් කිරීමේ ශාලා පරිශ්‍රය තුළ දුම්බීම හෝ එම ස්ථානවලට මත්ද්‍රව්‍ය පාවිච්චි කර පැමිණීමෙන් වැළකී සිටිය යුතු බවට අපේක්ෂකයින්/නියෝජිතයින් දැනුවත් කිරීම.

07. නාමයෝජනා භාර ගන්නා ස්ථානයට හෝ ඡන්ද මධ්‍යස්ථාවලට මෙන්ම එහි පරිශ්‍රයට හෝ ඡන්ද ගණන් කරනු ලබන ස්ථානවලට හෝ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ ස්ථානවලට අවසර ඇති පුද්ගලයින් පමණක් ඇතුල්වීම හා එම ස්ථානවලට අවි ආයුධ රැගෙන නොඅයුතු බවට වූ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම.

08. ඡන්ද විමසීමට අදාළ තහනම් ක්‍රියාවල යෙදීම හෝ තම ආධාරකරුවන් එම ක්‍රියාවන්ට පෙළඹවීම හෝ ඊට අනුබල දීම යන කටයුතුවල නොයෙදීම.

ඇ. මැතිවරණ ප්‍රචාරණ කටයුතු

01. ඡන්ද විමසීම තරග කිරීම සඳහා ඉදිරිපත්ව ඇති දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් ඡන්ද විමසීම් නීතියේ දැක්වෙන ආකාරයට මැතිවරණ ප්‍රචාරණ කටයුතු නීත්‍යානුකූලව ද නීතිය හා සාමය රැකෙන පරිදි ද සිදු කිරීම, විරුද්ධ පාර්ශ්වකරුවන්ගේ නීත්‍යානුකූල මැතිවරණ කටයුතු වලට බාධා නොකිරීම හා නීත්‍යානුකූල අන්දමින් ඡන්ද ප්‍රචාරණ කාර්යාල පවත්වාගෙන යාම.

02. මුද්‍රිත ලේඛන හෝ අත් පත්‍රිකා මඟින් ඡන්ද දායකයින් දැනුවත් කිරීම සඳහා වූ ලේඛන මුද්‍රණය කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් මැතිවරණ නීතිය අනුව ක්‍රියා කිරීම.

I. මුද්‍රණකරුගේ/ප්‍රකාශකගේ තොරතුරු නොමැති අත් පත්‍රිකා බෙදා හැරීම, නීති විරෝධී දැන්වීම් මුද්‍රණය කරවීම යනාදී කරුණු වලින් වැළකී සිටීම.

II. අපේක්ෂක හෝ අපේක්ෂකගේ සමීපතම ඥාතීන් (කලත්‍රයා, දූදරුවන් හා පවුලේ සෙසු සාමාජිකයන්) අත් පත්‍රිකා බෙදීමේ කාර්යයන් සඳහා හෝ ඡන්ද ආයාචනා කිරීම සඳහා ගෘහයෙන් ගෘහයට යාමෙන් වැළකී සිටීම සහ අත් පත්‍රිකා බෙදීම සඳහා ගෘහයෙන් ගෘහයට යාමේදී විශාල ජන සමූහ හෝ සංගීත වාදන, ප්‍රදර්ශන පුවරු යොදා නොගැනීම.

03. තම පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයන්ගේ හෝ ජයග්‍රහණය පතා හෝ වෙනත් පාර්ශ්වයක් පරාජය අපේක්ෂාවෙන් මැතිවරණ ප්‍රචාරණ දැන්වීම්, ප්‍රචාරක පුවරු එයට අදාළ ඡායරූප, චිත්‍ර යනාදිය අවසරලත් නිවේදිත කාර්යාලවල හෝ ප්‍රචාරක රැස්වීම් පැවැත්වෙන දින රැස්වීම් භූමියේ හෝ හැර මහජනයාට ප්‍රදර්ශනය වන පරිදි රාජ්‍ය හෝ පෞද්ගලික ගොඩනැගිල්ලක, වාසස්ථානයක, නිස් භූමියක හෝ මහජනයාට ප්‍රවේශ වීමට අවසර ඇති මාර්ගවල හෝ පොදු ස්ථාන වල නීති විරෝධී ලෙස ප්‍රදර්ශනය කිරීමෙන් වැළකීම.

04. පක්ෂ/අපේක්ෂක භේදයකින් තොරව සාමාන්‍ය තත්ත්ව යටතේ දී කුලී පදනම මත ලබා දෙන රැස්වීම් ශාලා හෝ ක්‍රීඩා භූමි යනාදිය හෝ හැර රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවලට හෝ අයත් භූමි, ගොඩනැගිලි හෝ දේපළක් හෝ සේවාවක් මැතිවරණ ප්‍රචාරණ/ප්‍රවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමෙන් වැළකී සිටීම.

05. මැතිවරණ ප්‍රචාරණ/ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් කිසිදු ආගමික ස්ථානයක් හෝ ආගමික ස්ථානයකට අයත් භූමියක් හෝ දේපළක් භාවිතා කිරීමෙන් වැළකී සිටීම.

06. ඡන්ද විමසීමට අදාළ කොඩි හෝ දැන්වීම් හෝ ස්ටිකර් හෝ අපේක්ෂකයාගේ අංකය, නම, ඡායාරූප යනාදිය අපේක්ෂකයා ගමන් කරනු ලබන වාහනයේ පමණක් ප්‍රදර්ශනය කිරීම සහ ලියාපදිංචි නොකළ වාහන හෝ ගරාජ් අංක/ව්‍යාජ අංක සහිත වාහන ස්වකීය මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදවා නොගැනීම.

07. අවසරලත් ප්‍රචාරක රැස්වීම් භූමි තුළ මැතිවරණ ප්‍රචාරණය වෙනුවෙන් කරනු ලබන සැරසිලි පරිසරයට හානි නොවන පරිදි සිදු කිරීමටත් ප්‍රචාරක කටයුතු සඳහා පරිසරයට හානිකර ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් වැළකී සිටීමටත් එබඳු රැස්වීම් කටයුතුවලින් පසු අප්‍රමාදව එම සැරසිලි ඉවත් කිරීමටත් ක්‍රියා කිරීම.

08. ඡන්ද විමසීම් කාල සීමාව තුළ මැතිවරණ ප්‍රචාරණ/ප්‍රවර්ධන කටයුතුවලට අදාළව පෙරහැර, මහජන පෙළපාලි හා රථ පෙළපාලි පැවැත්වීම මැතිවරණ නීති උල්ලංඝණය කිරීමක් බැවින් එවැනි මහජන පෙළපාලි, පෙරහැර, රථ පෙළපාලි, බයිසිකල් පෙළපාලි යනාදී කිසිවක් ඡන්ද විමසීම් කාල සීමාව තුළ නොපැවැත්වීම.

09. ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට අවසරලත් රැස්වීම් සඳහා පමණක් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම, එම ශබ්ද විකාශන කටයුතු රැස්වීම් පැවැත්වෙන කාලයට සහ එම රැස්වීම් භූමියට පමණක් සීමා කිරීම සහ ධාවනයේ යෙදෙන වාහනවල සවිකළ ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ප්‍රචාරක කටයුතු නොකිරීම.

10. මැතිවරණ දින ඡන්ද විමසීම ඇරඹීමට නියමිත වේලාවට පැය 48 කට පෙරාතුව අදාළ ඡන්ද විමසීම් නීතිය අනුව මැතිවරණ ප්‍රචාරණ කටයුතු නතර කිරීමට පියවර ගැනීම සහ එම නිහඬ කාල සීමාව තුළ දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සංගීත සංදර්ශන වැනි දෑ පැවැත්වීම සහ මුද්‍රිත/විද්‍යුත් ජනමාධ්‍ය හරහා දැන්වීම් ප්‍රකාශයට පත්කිරීම යනාදි කාර්යයන් අත්හිටුවීම.

11. කිසිදු පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයකු වශයෙන් තනතුරක් දරමින් සිටින අයකු, යම් පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමයක් හෝ ඒවායේ අපේක්ෂකයින් ජයග්‍රහණය කරවීමට තමාට මහජන නියෝජිතයකු වශයෙන් ලැබී ඇති වරප්‍රසාද, බලතල, වාහන හා වෙනත් රාජ්‍ය දේපළ යොදා නොගැනීම.

12. මහජන නියෝජිතයකුගේ ආරක්ෂාව වෙනුවෙන් නීත්‍යානුකූලව සපයා ඇති ආරක්ෂක අංශ නිලධාරීන් හෝ ඔවුන්ගේ භාවිතයට දී ඇති ගිනි අවි හා අනෙකුත් ආරක්ෂිත උපකරණ හා මෙවලම් අපේක්ෂිත මහජන නියෝජිතයාගේ ආරක්ෂාව වෙනුවෙන් හැර කිසිදු නීත්‍යානුකූල නොවන අන්දමේ කටයුත්තකට යොදවා ගැනීමෙන් වැළකී සිටීම.

13. යම් මැතිවරණ නීතියක් අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් ඡන්ද විමසීමක් සඳහා තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට මැතිවරණ නීතිය යටතේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ලබාදෙන ගුවන් කාල සීමා, අදාළ සංස්ථා ප්‍රධානීන් හා මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන උපදෙස් හා කොන්දේසි අනුව භාවිතා කිරීම. (පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට අදාළ නොවේ.)

14. යම් මැතිවරණ නීතියක් අනුව ඡන්ද විමසීමක දී ඡන්ද හිමියන් ලියාපදිංචි සෑම ගෘහයක් වෙතම තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට සංදේශයක් යැවීමට ඇති අයිතිය, අදාළ පනතේ ප්‍රතිපාදන හා තැපැල්පතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයට භාවිතා කිරීම. (මෙම අවස්ථාව පළාත් සභා හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට අදාළ නොවේ.)

15. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ විභාග හා 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඇතුළු වෙනත් ප්‍රසිද්ධ විභාග පැවැත්වෙන මෙන්ම එම විභාගවල ඇගයීම් කෙරෙන විදුහල්වලට/විභාග මධ්‍යස්ථානවලට බාධාවන අයුරින් එම විදුහල්/මධ්‍යස්ථාන අවට ඡන්ද ප්‍රචාරක කටයුතු කිරීමෙන් වැළකී සිටීම.

16. යම් අපේක්ෂකයකු විසින්, වෙනත් පක්ෂයක් හෝ අපේක්ෂකයෙකු සම්බන්ධව පූර්වයෙන් කරන ලද ප්‍රකාශ හෝ අදහස් දැක්වීම් තවත් පක්ෂයක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනයට හෝ අගතියට පත් කිරීම සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් පූර්වයේදී එකී ප්‍රකාශ හෝ අදහස් දැක්වීම් කරනු ලැබූ තැනැත්තා විරුද්ධත්වය ප්‍රකාශ කරනු ලැබුවහොත් එවැනි ප්‍රකාශ/අදහස් දැක්වීම් යනාදිය භාවිතා කිරීමෙන් වැළකී සිටීම.

ඇ. ඡන්ද විමසීම් දින

01. ඡන්ද විමසීම් දිනයේ ඡන්ද පොළේ සිට මීටර් 500 ක් ඇතුළත, සීමාව තුළ සිදු කිරීමට තහනම් කර ඇති කිසිදු ක්‍රියාවක්, විශේෂයෙන් ඡන්දය ආයාචනා කිරීම් යනාදී මැතිවරණ නීතියේ සඳහන් වරදවල් සිදු නොකිරීම.

02. ඡන්ද විමසීම සඳහා ඡන්ද පොළට පැමිණෙන හා ඡන්ද පොළේ දී ඡන්දය පාවිච්චි කරන ඡන්ද දායකයින්ට කිසිදු බාධාවක් නොකිරීම සහ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා බලපෑම් කිරීමෙන් වැළකීම සහ ඡන්ද දායකයාට, ඡන්දය ස්වාධීනව නිදහස්ව හා රහසාව පාවිච්චියට ඇති අයිතියට බාධා නොකිරීම.

03. ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද හිමියන්, ඡන්ද පොළ නියෝජිතයින්, ඡන්ද අපේක්ෂකයින්, නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් කිසිදු බිය වැද්දීමකට ලක් කිරීමෙන්, ශාරීරික වධ හිංසාවලට ලක් කිරීමෙන් හෝ ඔවුන්ගේ දේපළ වලට හානි කිරීමෙන් වැළකීම සහ ඡන්දය දීමට පැමිණෙන හෝ ඡන්දය දී ආපසු යන ඡන්ද හිමියන් බිය ගැන්වීමෙන් ඔවුනට බාධා කිරීමෙන් හෝ වැළකීම, ඡන්ද පොළ නියෝජිතයින් ඡන්ද පොළෙන් පලවා හැරීමෙන් වැළකීම.

04. ඡන්ද විමසීම් දින ඡන්ද පොළට ඇතුළු වීම සඳහා අවසරය ඇති අය පමණක් (තරග කරනු ලබන දේශපාලන පක්ෂයක ලේකම්, අපේක්ෂකයින් හා ඡන්ද පොළ නියෝජිතයින්) ඇතුළු විය යුතු බැවින් ඒ සම්බන්ධයෙන් සහාය දක්වා ක්‍රියා කිරීම හා ස්වකීය අනන්‍යතාව සනාථ කළයුතු වීම සහ ඡන්ද පොළ තුළට ආරක්ෂකයින් හෝ මාධ්‍යවේදීන්, ඡායාරූප ශිල්පීන් කැඳවා ගෙන ඒමෙන් වැළකී සිටීම.

05. මැතිවරණ නීතියේ සඳහන් කිසිදු වරදක් හෝ මැතිවරණ දූෂණ ක්‍රියාවක් කිරීමෙන් හා ඊට අනුබලදීමෙන් වැළකීම, (ඡන්ද පොළේ දී ඡන්ද පෙට්ටි බලෙන් පිරවීම, ඡන්ද පොළට කඩා වැදීම, හෝ හොර ඡන්ද දැමීම ආදී වැරදි හා දූෂණ ක්‍රියා)

06. නීත්‍යානුකූල නොවන අන්දමින් ඡන්ද පොළ කරා ඡන්ද දායකයින් ප්‍රවාහනය නොකිරීමට වග බලා ගැනීම.

07. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා එම කටයුතු භාරව ක්‍රියාකරන කාර්ය මණ්ඩලයට අපේක්ෂිත ආකාරයට සහාය වීම හා ඔවුන්ගේ කටයුතු වලට ඡන්ද පොළ නියෝජිතයින් බාධා නොකරන බවට වග බලා ගැනීම.

08. මැතිවරණ කොමසාරිස්වරයාගේ අවසරය මත ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කරන නියෝජිතයින්ට, නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින්ට බාධා නොකිරීම හා ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට සහාය වීම.

09. ඡන්ද පොළ පරිශ්‍රය තුළ ඡායරූප ගැනීම, ජංගම දුරකථන භාවිතය යනාදී තහනම් ක්‍රියා නොකිරීම.

ඉහත සඳහන් කරුණු අදාළ වන විට තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දිනය සඳහා ද වලංගු වන ලෙස සැලකීම යෙහෙකි.

ඉ. ඡන්ද හා මනාප ගණන් කිරීම (තැපැල් ඡන්ද ඇතුළුව) හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම.

01. ඡන්ද හා මනාප ගණන් කිරීමේ (තැපැල් ඡන්ද ගණන් කිරීම ද ඇතුළුව) ක්‍රියා පිළිවෙල සම්බන්ධයෙන් ස්වකීය ගණන් කිරීමේ නියෝජිතයන් දැනුවත් කිරීම හා පැමිණිලි ඉදිරිපත් කිරීමේ නිසි ක්‍රමවේදය ගැන ස්වකීය නියෝජිතයන් දැනුවත් කිරීම.

02. ගණන් කිරීමේ ශාලා හා ප්‍රතිඵල සකස් කිරීමේ ස්ථානය තුළ එම කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධව මැතිවරණ කොමසාරිස් හා තේරීම්භාර නිලධාරී විසින් පනවා ඇති විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බවට ස්වකීය නියෝජිතයන් දැනුවත් කිරීම.

03. ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් ලෙස විධිමත්ව පත්කර නොමැති නම් එනම්, නිසි අවසරයක් නොමැතිව රජයේ හෝ පළාත් සභා ඇමතිවරු, පාර්ලිමේන්තු හා පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන සභිකයන් හෝ වෙනත් දේශපාලන බලධාරීන් ගණන් කිරීමේ පරිශ්‍රයට/ශාලාවට ඇතුළු නොවීමට වග බලා ගැනීම.

04. ඡන්ද ගණන් කිරීමේ හෝ ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ශාලාවල නියෝජිතයින් ලෙස පැමිණෙන කිසිදු දේශපාලනඥයකු විසින් අවි සහිත හෝ රහිත ආරක්ෂකයින් එකී ශාලා තුළට කැඳවා ගෙන ඒමෙන් වැළකී සිටීම සහ ගණන් කිරීමේ ශාලා/ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ශාලා පරිශ්‍රයට අනවසර පුද්ගලයින් කැඳවා ගෙන පැමිණීමෙන් වැළකීම.

ඊ. වෙනත් විශේෂ කරුණු

01. ඡන්ද විමසීමේදී තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ තමන්ගේ පක්ෂයේ ප්‍රතිපත්ති මාලාව හා යම් කාල සීමාවක් තුළ තම පක්ෂය විසින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වැඩ පිළිවෙලක් ඡන්ද දායකයන් වෙත ඉදිරිපත් කිරීම හා එහි පිටපත් මැතිවරණ කොමසාරිස් වෙත හා එමඟින් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවීම.

02. මැතිවරණ ප්‍රචාරණ/ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් රජයේ දේපළ, නිල වාහන හෝ නිලධාරීන් යොදා නොගැනීම, සහ රජයේ කාර්යාල, පාඨශාලා ආදී කිසිදු ආයතනයක් තුළ හෝ එම පරිශ්‍ර තුළ ඡන්ද ආයාචනා කිරීම, අත් පත්‍රිකා බෙදීම, ප්‍රදර්ශන පුවරු හෝ දැන්වීම් ප්‍රදර්ශනය කරවීම යනාදී ප්‍රචාරක කටයුතු නොකිරීම.

03. මහජන නියෝජිතයින් තම නිල රාජකාරී කටයුතු හරහා මැතිවරණ ප්‍රචාරක කටයුතු කිරීමෙන් වැළකීම.

04. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් නොමිලයේ රජයේ ගුවන්යානා හෝ වෙනත් වාහන භාවිතා කිරීමෙන් වැළකීම.

05. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් පොදු ගොඩනැගිලි, ක්‍රීඩාභූමි, රජයේ සංචාරක නිවාස යොදා ගන්නේ නම් නියමිත ගෙවීම් සිදු කොට ඒවා භාවිතා කිරීම හා එවැනි අවස්ථා එම ආකාරයටම සියළුම අවශ්‍ය පාර්ශ්වවලට ලබා ගැනීමට හැකිවන පරිදි ක්‍රියා කිරීම.

06. මැතිවරණ සමයේ දී දේශපාලන පුවත් හා ලිපි හෝ දැන්වීම් යනාදිය අතිරේක රජයේ හෝ රාජ්‍ය ආයතනවල වියදමින් පළ නොකිරීම.

07. ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඡන්ද හිමියන් හෝ රජයේ නිලධාරීන් තනිවම හෝ සමූහ වශයෙන් හෝ ස්වකීය පෞද්ගලික හෝ නිල නිවාසවලට කැඳවා සංග්‍රහ කිරීමෙන් වැළකීම.

08. කිසියම් ආකාරයෙන් මූල්‍ය ප්‍රදාන කිරීම හෝ පොරොන්දු දීම්, ව්‍යාපෘති හෝ යෝජනා සඳහා මුල්ගල් තැබීම්, මාර්ග, ජල හා විදුලි ආදිය පහසුකම් සැපයීම සඳහා පොරොන්දු දීම හා තම පක්ෂයට වාසිවන ආකාරයට නම්මවා ගත හැකි ඡන්ද දායකයින් වෙනුවෙන් ක්‍රමානුකූල නොවන ආකාරයට හදිසියේ රාජ්‍ය අංශයේ තනතුරු හා පත්වීම් ප්‍රදානය කිරීමෙන් වැළකීම.

09. මැතිවරණ නීති උල්ලංඝනය කිරීම, මැතිවරණ කටයුතුවලට බාධා කිරීම, මැතිවරණ දූෂණ හා වැරදි සිදුකිරීම සම්බන්ධව නීති ක්‍රියාත්මක කරන අංශ විසින් සිදුකරන පරීක්ෂණවලට බාධා නොකිරීම හා එම අංශ වලට ස්වාධීනව ක්‍රියා කිරීමට අවශ්‍ය පසුබිම සැලසීම.

10. මැතිවරණ සමය තුළ විරුද්ධ පාර්ශ්වවලට හා ඒවායේ ක්‍රියාකාරීන්ට මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් සතාථ කළ නොහැකි හෝ වැරදි චෝදනා ඉදිරිපත් කරමින් හා අදාළ පාර්ශ්වයන්ට එබඳු අවස්ථාවල දී පිළිතුරු දීමට පවා අවකාශ ලබානොදී ඉදිරිපත් කරන වැඩසටහන් ප්‍රචාරණය කිරීමට මාධ්‍ය යොදු ගැනීමෙන් වැළකී සිටීම.

11. දේශපාලන පක්ෂයක් හෝ දේශපාලනඥයන් සම්බන්ධයෙන් කරනු ලබන විවේචන හා චෝදනාවලට ප්‍රතිචාර දැක්වීමේ දී ප්‍රචණ්ඩකාරී නොවන නීත්‍යනුකූල ක්‍රියාමාර්ගයෙන් පමණක් පිළිතුරු සැපයීම.

12. මහජන නියෝජිතයින්ගේ නීත්‍යනුකූල රැකවලුන් වශයෙන් කටයුතු කරනු ලබන පොලීසියේ හා අනෙකුත් ආරක්ෂක අංශවල නිලධාරීන් නිල නොවන ආකාරයට දේශපාලන මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට යොදා ගැනීම හා විරුද්ධ පාක්ෂිකයින්ගේ මැතිවරණ කටයුතු මැඩලීමට යොදවා ගැනීමෙන් වැළකීම. එවැනි කාර්යයන් ප්‍රසිද්ධියේ හෙළා දැකීම.

13. කුමන දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන සංවිධානයක් තම මැතිවරණ කටයුතුවල දී නීත්‍යනුකූල නොවන ආකාරයට අවි ආයුධ සහිත පුද්ගලයින් සම්බන්ධ කරගෙන කටයුතු කරන්නේ නම්, එවැනි ක්‍රියා ප්‍රසිද්ධියේ හෙලා දැකීම හා ඒවා මැඩලීම සඳහා අදාළ අංශ දැනුවත් කිරීම.

14. ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී පවත්වනු ලබන රාජ්‍ය උත්සවවලදී අපේක්ෂකයන් හෝ දේශපාලන පක්ෂවල ප්‍රමුඛ ක්‍රියාකාරීන් හෝ සහභාගී නොවීම හා එවැනි උත්සව පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා භාවිතා නොකිරීම.

15. දේශපාලන නැඹුරුවක් සහිත පත්වීම් ලබා දීම, උසස්වීම් සහ ස්ථාන මාරු කිරීම සඳහා සෘජු හෝ වක්‍ර දායකත්වයක් සැපයීමෙන් වැළකීම.

16. ඡන්ද විමසීම් පැවැත්වෙන ප්‍රදේශයක රජය විසින් හෝ රජයේ අනුග්‍රහයෙන් සැණකෙළි, සංදර්ශන හෝ ප්‍රදර්ශන හෝ ක්‍රීඩා තරග ආදිය පැවැත්වෙන්නේ නම් එම අවස්ථා ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත්ව සිටින අපේක්ෂකයින්ගේ හා පක්ෂවල ජයග්‍රහණය පිණිස දේශපාලන ප්‍රචාරණ කටයුතුවලට සම්බන්ධ කරගැනීමට ක්‍රියා නොකිරීම.

17. ප්‍රසිද්ධ විභාග හා ශිෂ්‍යත්ව විභාගයට අදාළව පවත්වනු ලබන අධ්‍යාපනික සම්මන්ත්‍රණ හරහා පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදු නොකිරීම.

වෙනත් කරුණු

* ජාතික ගීය, ජාතික ධජය, ආගමික සංකේත, ආගමික ධජ, ආගමික ශාස්තෘවරුන්ගේ හෝ ආගමික නායකයන්ගේ සිතුවම් හෝ ඡායාරූප යනාදී කිසිම දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට හෝ අගතියට පත් කිරීම සඳහා යොදා නොගත යුතු ය. තවද පෙර සඳහන් දෑ පක්ෂ/කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධන රැළි, රැස්වීම් යනාදියෙහි දී හෝ දැන්වීම්, ප්‍රචාරක පුවරු යනාදියෙහි ප්‍රදර්ශනය නොකළ යුතු ය. තවද පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා කිසිදු රාජ්‍ය නිලධරයෙකුගේ ඡායාරූප හෝ සිතුවම් කුමන ආකාරයකින් හෝ භාවිතා නොකළ යුතු ය.

* දේශපාලන පක්ෂ වල/ස්වාධීන කණ්ඩායම් වල ප්‍රචාරණ කටයුතු සඳහා සාමාන්‍යයෙන් ලබාදෙන රජයේ ස්ථාන එක් පක්ෂයක හෝ අපේක්ෂකයකුගේ ප්‍රචාරණ කටයුතු සඳහා පමණක් වෙන්කර ගැනීමට ක්‍රියා නොකළ යුතු අතර වෙනත් පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂක ප්‍රචාරණ කටයුතු සඳහා එවැනි ස්ථාන ලබා ගැනීමට සම අවස්ථා ලබාදිය යුතු ය.

* පළාත් පාලන ආයතන සතු ක්‍රීඩා භූමි හෝ ශාලා පහසුකම් වෙන්කරවා ගැනීමේදී ඇතිවන ගැටළු අවම කර ගැනීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඒ ඒ තේරීම්භාර නිලධාරී විසින් පවත්වනු ලබන දිස්ත්‍රික් කමිටුවේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම දේශපාලනඥයින් හා ආධාරකරුවන් කටයුතු කළ යුතු ය.

පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයන් හා අදාළ වන විට ඔවුන් නියෝජනය කරන දේශපාලන පක්ෂ ලේකම්වරුන්, අපේක්ෂකයන්ගේ නියෝජිතයන් හා ආධාරකරුවන් ඉහත සඳහන් කරුණුවලට අනුකූලව ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, මෙම ආචාර ධර්ම පද්ධතියේ ඇතුළත් දෑ ස්වකීය නියෝජිතයින්, පාක්ෂිකයින් හා ආධාරකරුවන් අනුගමනය කරනු ලබන බවට සැහීමකට පත්විය හැකි ආකාරයේ යාන්ත්‍රණයක් අපේක්ෂකයන් හා අදාළ වන විට පක්ෂ ලේකම්වරුන් ක්‍රියාත්මක කරනු ඇතැයි වැඩිදුරටත් අපේක්ෂා කෙරේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

සරණ මාවත,
රාජගිරිය.
